සැඟවුණු බොදු මග යළි පුබුදන

# හෙළ බොදු පියුම

ශ්‍රී බු. ව. 2555 ක් වූ උඳුවප් මස (ව්‍යවහාරික වර්ෂ 2011 දෙසැම්බර්)

මංගල කලාපය
දෙවන සංස්කරණය
2020 දුරුතු මස

## සැඟව ගිය බොදු මග යළි පුබුදමින්
## වහරක හිමියන් හෙළි කරන
## ලොව්තුරු අත්දැකීම්....



● සැඟව ගිය බොදු මග යළි රැගෙන සෑම පුන් පොහෝ දිනකම එළිදකින දහම් සංග්‍රහය

රු. 25/-













# යහපතක්ම වේවා...

තුන් ලොව සතට මහ මුනි දුන් දහමෙ ගුණ
පින් ඇතියනට ලැබ දෙන්නට සුදුසු තැන
උන් පෙර සඟුන් පෙළ වැඩි මග හැඳින ගෙන
දැන් යළි නැගෙයි සක් හඬ අම නිවන දෙන

පෙර සිට පෙරුම් පිරූ උතුමන් සසර ගෙවා
හැර මළ කෙළෙස් සත හට සෙත් ගෙනෙති දොවා
සිර වුණ සසර බැමි ඉන් සදහටම දවා
තිර සර නිවන් සිත් වේවා උදය හවා

කුල මල ජාති ආගම් භේදය දුරලා
පළ වෙනි තැනට ලෝ දම් නිය මතු කරලා
බල ගෙන තුනුරුවන් ගුණ මෙත් සිත දරලා
හෙළ මග සැදෙයි සත වෙත යහපත පෙරලා

අති දුලභවයි සිරි සදහම මතු වන්නේ
නැති කල බොහොයි සුගතියකද නොලැබෙන්නේ
ඇති විට නොපැකිලව බුදු බණ අහ ගන්නේ
ගති නියත වෙයි ඇහුවොත් නිවනම දෙන්නේ


කසන කාම ලොව තතු සිහි කරන සිතින්
අසන දම් ගෙනේවා සුව නිවන මතින්
නසන සසර රෝ දුක් ඔසු රැගෙන මෙතින්
වසන තුරු ඇසේවා බුදු වදන නිතින්

යහපත කරන අටියෙන් අදිටන නැගුනා
මහ සෙත දුන්න මුනි සව් විවරණ ලැබුනා
කහ වත දරා සූවිසි ගුණ කඳ හඳුනා
නහවත දම් දියෙන් නිවනට මග සැදුනා

හැම දා නොමැත ලොව්තුරු දම පවතින්නේ
නොම දා හඬා දුගතිය වෙත නොම යන්නේ
ඇම දා ගෙනයි මර සෙන් නිතරම ඉන්නේ
මෙම දා ලැබුණ වරමින් එල ලැබ ගන්නේ

මහ පිනක්ම වී ලැබෙනා නිවන අම
පියවරක් තැනේවා දුක කරන නිම
භව දුකක් නොදේවා මරු දමන ඇම
යහපතක්ම වේවා ලෝ සතට සැම

පබැඳුම - නීතිඥ චන්දන සිරිවර්ධන



# ලෝකෝත්තර මගට ආරක්ෂාවක් වූ බුද්ධානුස්සතිය නිවැරදිව වඩන අයුරු

මාර විපත්වලින් මිදිල ලෝකෝත්තර මාර්ගය වඩාගන්න, සිව්රඟ සෙනගක් වගේ ඉන්න සාසනයේ ආරක්ෂා හතරක් තියෙනවා. බුද්ධානුස්සතිය, මෙත්තානුස්සතිය, අසුභානුස්සතිය සහ මරණානුස්සතිය කියන මේ හතර සේනාව තමයි මාර්ග ආරක්ෂකයෝ වෙන්නෙ. නමුත් අද වෙන කොට මේ හතර සේනාව සඟවල මායා සේනා හතරක් විද්‍යමාන වෙලා තියෙන බව තමයි පේන්න තියෙන්නෙ. ඒ බව විමසල බලල වටහා ගැනීම නැණවතුන් සතුයි.

මෙයින් පළමුවෙන්ම විග්‍රහ කරන්නෙ බුද්ධානුස්සතිය. මේක ඉතා යහපත් කර්මස්ථානයක්. ඒ වගේම වැඩ සිද්ධවන ස්ථානයක්. ඒ මගින් අවැඩ දුරු කරල වැඩ හෙවත් ක්‍රියා සුද්ධිය ඇති කරනවා. මේ බුද්ධානුස්සතිය මෙනෙහි කරන ක්‍රම දෙකක් තියෙනවා. නව අරහාදී බුදු ගුණ පද වශයෙන් සජ්ඣායනාව එක ක්‍රමයක්. අනෙක් ක්‍රමය තමයි, සූව්සි ගුණවලින් කියවෙන පරමාර්ථ අර්ථ විග්‍රහ කරගෙන ඒ තුලින් නිවන් මග පූර්ණ කර ගැනීම.

ඒ වගේම මේ ගුණ පදවලින් කියවෙන ගුණ විග්‍රහ කරන කොට, මෙපමණකින් මේ මේ පදයේ ගුණ පූර්ණ වෙනව කියල සීමා නොකළ යුතුයි.

ඒ ඇයි...?

බුදු ගුණ නම් අනන්තයි. ගුණ පදය කියන්නෙ ගුණ පෙදෙසක්. අනන්තය තුළ තියෙන පෙදෙසත් අනන්තයි. අනන්ත ලෝක ධාතු පිහිටපු අනන්ත ආකාසය ප්‍රදේශ දහයකට බෙදුවත්, ඒ ප්‍රදේශ දහයට මෙපමණකින් මේ ප්‍රදේශය පූර්ණ වෙනව කියල කියන්න බෑ වගේ, අනන්ත පද හෙවත් ප්‍රදේශ වූ බුදු ගුණ මෙපමණකින් මේ ප්‍රදේශය පූර්ණ වෙනව කියල කියන්න බෑ. **යම් බුදුවරයන් වහන්සේ නමක් සාමුක්බන්සික දේශනා (මෝක්ෂය උදෙසා කරන දේශනා - චතුරාර්ය සත්‍යය කුළුගන්වා කෙරෙන අසමසම දේශනා) නියායෙන් එක ගුණයක්, නැත්නම් එක ගුණ පෙදෙසක් පිළිබඳව ගුණ ප්‍රකාශ කරන්න ගියොත්, උන්වහන්සේගේ ජීවමාන ආයුස ගෙවිල යනව මිසක් ගුණ කෙළවර නොවන බවත් උන්වහන්සේම දේශනා කරල තියෙනවා.** ඒ නිසා, අනුරූප ගුණ දේශනයක් ප්‍රකාශ කරනව නම්, මෙබඳු ගුණ පෙදෙසට අයත් මේ ගුණ ඇති නිසා, මේ පදය ඇසුරේ වෙනවා, ඒක අනන්ත ගුණය තුළ ඇතුළත් කියල ප්‍රකාශ කරනව මිසක්, මෙපමණකින් මේ පදය පූර්ණ වෙනව කියල නො සිතිය යුතුයි, නොකිව යුතුයි.

රහසින්වත් පව් නොකිරීම, කෙලෙස් හී පහර දුරු කිරීම, පූජාවට සුදුසු වීම කියන මේවා "අරහං" කියන පෙදෙසට ඇතුලත් ගුණ මිසක් පූර්ණත්වයක් පෙන්වන්න පුළුවන් කාරණා නෙවෙයි. රහසින්වත් පව් නොකිරීම කියන කාරණයෙදි අපට වැටහෙන්නෙ ගුණ කඳක අංශුවක් විතරයි. සාමාන්‍ය පෘථජ්ජන වූ මගඵල නොලබපු කෙනෙක් මේ ගුණය සිහි කරන කොට වැටහෙනවට වඩා සතසහශ්‍ර ගුණයකින් සෝවාන් මගඵල ලාභී උතුමන්ට මේ ගුණය වැටහෙනවා. ඊට වඩා සතසහශ්‍ර ගුණයකින් සකෘදාගාමි උතුමන්ට වැටහෙනවා. ඊටත් වඩා සතසහශ්‍ර ගුණයකින් අනාගාමි උතුමන්ට වැටහෙනවා. මේ විදිහට රහතන් වහන්සේලාට අනන්තව වැටහෙනවා. “ළිඳේ සිටි ගෙම්බා තම ගෙඹි දරුවාට ගවයාගේ පමණ දැක්වීමට පුම්බන්න ගොස් පැලී මැරුණා සේ” කියන ප්‍රස්ථා පිරුළ වගේ, මෙපමණකින් මේ ගුණය තියෙනව කියල සීමා තියන්න ගියොත් ඒ වගේම නිෂ්ඵල වෙනවා. ඒ නිසා රහසින්වත් පව් නොකිරීම, කෙලෙස් සැර දුරු වීම, පූජාවන්ට සුදුසු බව කියන මේවාත් අනන්ත වූ අරහං ගුණස්කන්ධයෝම වෙනවා.

අනන්ත නිසා අසීමිතයි, සජ්ජායනා කිරීම්, මෙනෙහි කිරීම් උචිතයි. එතකොට අනන්ත වූ ගුණ ස්වභාවය වැටහෙමින් අනන්ත ගුණ ගරුත්වයේ පිහිටා බුද්ධානුස්සතිය වැඩෙනවා.

**රහසින්වත් පව් නොකරන නිසාත්, කෙලෙස් හී සර දුරු කළ නිසාත්, පූජාවට සුදුසු නිසාත් අරහං නම් වේ කියල මෙනෙහි කළොත්, ඒ කාරණය පමණ දන්න කෙනෙකුගේ අදහසක්, කතාවක් විදිහට වන ප්‍රකාශයක් බව තේරුම් ගන්න ඕන. නමුත් බුදුන් වහන්සේ හැර, පමණ දකින්න සමතෙක් තුන් ලෝකයේම නෑ. දකිනවනම් අනන්ත බවම පමණක් දකිනවා.** ලෝකයේ සම්මත විද්‍යාඥයෙකුගේ බහ තෝරන වයසේ පසුවන දරුවෙක්, තමන්ගෙ පියා දක්ෂ විදිහට පරීක්ෂණ කරල විශ්මයජනක නිෂ්පාදන කරන නිසා උසස් විද්‍යාඥයෙක් කියල වෙනත් කෙනෙක් කියනව ඇහිල ඒ වචන මාලාව මතක තියාගෙන, මගේ පියා දක්ෂ විදිහට පරීක්ෂණ කරල විශ්මයජනක

නිපදවීම් කරන නිසා විද්‍යාඥයෙක් කියල නිගමන සහිත කතාවක් කියනව නම්, ඇත්ත වශයෙන්ම ඒක ඒ දරුවගෙ වැටහීම් සහිත කියමනක්ද, නැත්නම් බොළඳ කතාවක්ද කියල හිතල බලන්න. එතකොට ඒ අනුසාරයෙන් බුදු ගුණ මෙනෙහි කළ යුතු ආකාරයත් වටහා ගන්න පුළුවන්.

දරුවෙකුට සාගරයේ ගැඹුර, පමණ වැටහුණේ නැතත්, දියෙන් බිඳක් අරගෙන කට ගා රස බලන්නත්, ජල කඳ පිළිබඳව සීමාවක් වැටහුණේ නැතත්, කිමිදිලා නාන්නත්, කුණු හෝදගෙන කය පිරිසිදු කරගන්නත් පුළුවන්. ඒ වගේම තමන්ට වැටහෙන, තේරුම් ගන්න පුළුවන් මට්ටමින් හිතමින් ගුණ සිහි කරන්නත් පුළුවන්. එතකොට වචනය හෝ වචනවලට වැරදි විදිහට ගත්ත අරුතක් හෝ මනසේ ස්පර්ශ නොවී ගුණ අදහස් ස්පර්ශ වෙනවා. ඒ මගින් ගුණ දැනීම පහළ වෙනවා. ඒ ස්පර්ශය සුව දෙනවා. එහි ඇලීම, බැඳීම වෙනවා.

ගුණ අනුකූල ස්වභාවයට යම් පහළ වීමක් හිමිද, ඒ පහළ වීම හෙවත් භව වෙනවා. එතකොට ගුණවතෙක් ජනිත වෙනවා. බුදු ගුණ නාම රූපයන් ඇසුරෙන් බිහි වෙච්ච ගුණවතාට බුදු ගුණයේ සහජ උරුමයට හිමිවන නැණ නුවණ පහළ වෙනවා. අනිච්ච, දුක්ඛ, අනත්ත කියන පෙළ දහම මෙනෙහි කළාද, අර්ථ-ධර්ම-නිරුක්ති-පටිභාන ශක්ති සහිතව වැටහෙනවා. ඒක බුදු ගුණ ඇසුරේ ලබන වාසනා ඵලයක්. මේ විදිහට පූර්ව භාග ප්‍රතිපදා මාර්ගයත්, ඒකායන මාර්ගයත්, ප්‍රත්‍යක්ෂ ඵලය විදිහට අරිහත් ඵලය ලැබෙන කල් කාර්ය සිද්ධිය වෙනවා.

**නව ගුණ පද වශයෙන් සජ්ජායනා කිරීමත් පූර්ව භාග නුවණ ගෙන දෙන්න හේතු වෙනවා.** ඒක සිද්ධ වෙන්නෙ කොහොමද? සර්වඥතා ඥානය ප්‍රත්‍යක්ෂ කොට ගෙන වීත රාගී, වීත දෝසී, වීත මෝහී ගුණ වඩන නාම රූපයන් විද්‍යමාන වෙනවා. පවිත්‍ර වූ, ප්‍රභාෂ්වර වූ දැනීමෙන් යම් හැඟීමක් දෙන ශබ්ද රූපයක් විද්‍යමාන වෙනවද, ඒ වාග් රූප මාලාව වීත රාගී, වීත දෝසී, වීත මෝහී ගුණයන්ගෙන් නැගෙනවා. ඒ අක්ෂර රටාවත්, ශබ්ද රටාවත්, පද රටාවත්, අනුකූල නාම රූප පහළ කරන විදිහට ලෝකයට දිස්වෙනවා. ඒ රටාව ඇසුරු කිරීම නිසා නාම රූප ඇසුරක් සිද්ධ වෙනවා. ඒ ඇසුරු කිරීම ප්‍රත්‍යක්ෂ කරගෙන විඤ්ඤාණය පහළ වෙනවා.

ඒ විඤ්ඤාණය අනුරූප වූ නාම රූප පහළ කරනවා. එයින් අනුරූප සළායතන වෙනවා. එතකොට අනුකූල මනෝ ස්පර්ශය සිද්ධ වෙනවා. එයින් නිවීම, සැනසීම සහිත නිරාමිස සුවය ගෙන දෙනවා. එහි ඇලීම, බැඳීම වෙනවා. මූල බීජ වූ නාම රූපයෝ යම් ස්වභාවයක් වුනාද, ඊට අනුකූල වූ අනුරූපයෝ පහළ වෙනවා. ඒ මගින් බුද්ධ ගුණවතෙක් ජනිත වෙනවා. ඒ ගුණවතාට අනිච්ච, දුක්ඛ, අනත්ත සහිත දහම් ශ්‍රවණය වෙනවද, පූර්ව භාග ප්‍රතිපදා පූර්ණ නිසා ඒකායන වූ රාගක්ඛය, ද්වේශක්ඛය, මෝහක්ඛය වන මාර්ගය වැඩිල ඵල ලබනවා. අරිහත් බවට පත් වෙනවා.

**මනුස්සයා ලෝකයේ පහළ වෙනකොට, ගස් ජාති, වැල් ජාති, කෘමි ජාති, තිරිසන් ජාති, මත්ස්‍ය ජාති... ආදිය වගේ අසම්බන්ධ ආකාර ස්වභාව මේ මිනිස් ජාතියේ දකින්න නෑ. මනුස්සයාගේ ලෙයට ලෙය, මසට මස, හමට හම, ඉන්ද්‍රියට ඉන්ද්‍රිය බද්ධ වෙනවා. ඒ නිසා මිනිස් ජාතියේ ජාති සමානත්වයක් කායිකව පවතින බව බුදුන් වහන්සේ දේශනා කරල තියෙනවා. නමුත් මුලා සහගත ලෝකයා මේ ගැන හිතන්නෙ නැතිව නොයෙක් දුශ්චරිත කරමින්, ධනයෙන්, බලයෙන්, නිලයෙන් මත්වෙලා තමන්ගෙ වංශය උසස්, කුලය උසස්, ජාතිය උසස්, තත්ත්වය ථානාන්තරය සම්මතය අනුව මම මෙහෙම කෙනෙක් කියල සම්මත පනවගෙන, මුලා වූ ජාති අදහසක ඇලී ගැලී ඉන්නවා කියන කාරණයත් බුද්ධ දේශනාවක්.**

මේ මුලා ජාති ස්වභාවයේ පිහිටල දෘෂ්ටි ගත වෙලා ඉන්න කල් නිවන් මග වැහෙන බවත් දැනගන්න ඕන. ඒ නිසා නියම ජාති පහළ වෙන පටිච්ච සමුප්පාද දහම් නියාය දැනගෙන, සසර සැරිසැරීමට හේතුවන ජාතිවල ඉපදීම මේ අත්භවයෙදිම හටගන්නා ජාති තුළින් දැනගෙන, ඒ ජාති පහළ කරන අවිද්‍යා, තණ්හා, උපාදාන, භවවලින් ඊට අනුරූප වූ නාම රූප ස්පර්ශ නොකර ඒවා පහ කරමින්, යම් ජාතියක පහළ වෙනවද, ඒ ජාතියේ ජරා මරණයෙන් පසු මතු පහළ වෙන්නෙ නැත්ද, ඒ ජාතිය ලබන ජාති මාර්ගය හොයාගෙන දැනගෙන ඊට පත්වීමට සුදුසු මග වැඩිය යුතුයි. මේ කාරණයත් බුද්ධ දේශිත ධර්ම රටාව අනුව පෙන්වන පටිච්ච සමුප්පාද විවරණයක් බව දැන ගන්න ඕන.

ප්‍රවෘත්ති කලාප හෙවත් මිනිස් භවයේ මව් කුසින් උපතේ පටන් මහල්ලෙක් බවට පත්වෙලා මියයන කල් අතර කාලය තුළ මනුස්සයා උපදින නියම ජාතිය හේතු ඵල අනුව ලැබෙන හැටි බුදුන් වහන්සේ දේශනා කරල තියෙනවා. ඒ තුළින්, මරණින් මතු සසර ගමනට හේතුවන ජාති සහ ඒවාට හේතුවන මාර්ග, පටිච්ච සමුප්පන්න ධර්ම මාර්ගයෙන් දැනගෙන වටහා ගෙන, හේතු නිරෝධ ධර්ම නියායෙන් අත්හැර දැමුවම එබඳු උපතක් සිද්ධ වෙන්නෙ නෑ. ඒ සඳහා අනුපූර්ව ප්‍රතිපදාවෙන් ආර්ය ජාතිවල පහළ විය යුතුයි. කෙළවර අන්තිම ජාතිය වන අරිහතුන් වහන්සේ හෙවත් අරිහත් ජාතිය ලැබිය යුතුයි.

මෙහිදී පහළ කර නොගත යුතු ප්‍රවෘත්ති ජාති කිහිපයක් මේ විදිහට දක්වන්න පුළුවන්. මිනී මරුවා, හිංසකයා, හොරා, සල්ලාලයා, බේබද්දා, සූදුඅන්තුවා, බොරුකාරයා, කේළමා, ජඩයා, ප්‍රලාපයා, ලෝභයා, මෝඩයා. මේ ප්‍රවෘත්ති ජාති අතර ප්‍රධාන ජාති කිහිපයක් විතරයි. මේ එක් එක් ජාතියක් තුළ ස්වභාවයේ අඩු වැඩිතාවය අනුව අතුරු ජාතිකයෝ බොහෝ ඉන්නවා. මේ සියල්ලෝම දුගති හිමි ජාතිකයෝ, මතු දුගති උපතට හේතු කාරකයෝ, උපතකදි දුක් විපාකවලට හේතුකාරකයෝ. මේ ජාති පහළ වෙන්නෙ මේ විදිහට.

ප්‍රාණ ඝාතය පිළිබඳව යම් ප්‍රිය බවක්, ආස්වාද බවක්, ලාභ කීර්ති ප්‍රසංසා ලබන බවට හේතු කාරක බවක් වුණොත්, ඒ කෙරෙහි ප්‍රිය මනාප වෙලා ඒ සඳහා ක්‍රම හොයනවා, විමසුම් කරනවා. හොයපු දේ ලබනවා. දරුණු ආයුධ ඇසුරු කරනවා. සැඩ ගති ප්‍රිය කරනවා. ප්‍රාණ ඝාතයට සුදුසු අරමුණ, පුද්ගලයා මුණ ගැහෙනවා. ඊට අවස්ථාව සැලසෙනවා. මේවා මොනවද?

ප්‍රාණ ඝාතය සඳහා හේතු ගෙන දෙන්නෙ ආකාර, ලිංග, නිමිති, උද්දේස, ප්‍රඥප්ති පහළ කරන සත්ව, පුද්ගල, ද්‍රව්‍ය සහ වස්තු. ඇස, කන... ආදී ඉන්ද්‍රියන් මගින් ගන්නා මේවායේ ඇසුර නිසා ඉහත කී ආකාර, ලිංග... ආදී නාම රූපයෝ විඤ්ඤාණයේ බැහැ ගන්නවා. ඒ නාම රූප ප්‍රත්‍යයෙන් විඤ්ඤාණ පහළ වෙනවා. විඤ්ඤාණ නාම රූප පහළ කරනවා. ඒ නාම රූප නැවත විඤ්ඤාණ පහළ කරනවා. විඤ්ඤාණ බලවත් වෙනවා. ඒවා බලවත් නාම රූප පහළ කරනවා. එතකොට ඇස,



කන, නාසය, දිව, ශරීරය, මනස අනුකූල කරමින් අනුරූපව සළායතන පහළ වෙනවා. ඒ මගින් අනුරූප ස්පර්ශයන් වෙනවා. යම් නාම රූප ධර්මයක් යම් ස්වභාව ඇත්ද, ඊට ආවේණික වින්දනය පහළ වෙනවා. ඊළඟට ප්‍රිය මධුර ආස්වාද විදිහට භුක්ති විඳිමින් ඒවායේම ඇළුම් කරනවා, තණ්හාව වෙනවා. ඒ නිසාම තණ්හා කළ තැන තදින් බැඳීම හෙවත් උපාදාන වෙනවා. පවත්වා ගැනීමේ බලාපොරොත්තු දැඩි වෙනවා. එතකොට අනුරූප වූ ස්වභාවයට හිත, කය, පරිසරය හැඩ ගැහෙනවා. ඒ පහළ කිරීම හෙවත් භවය ගතියට අනුව සිද්ධ වෙනවා. කටයුත්ත ක්‍රියාත්මක වෙනවා. එතැනදි ඵලය නිපදවෙලා ඉවරයි. දැන් මිනිමරුවා කියන ජාතිය පහළ වුණා.

මේ අනුසාරයෙන් පටිච්ච සමුප්පාද ධර්ම නියාමයෙන් ප්‍රවෘත්ති ජාති පහළ වෙන හැටි වටහා ගන්න ඕන. ඒ නිසා මිනීමරුවා කියන ජාතිය හේතු ඵලයක්, පටිච්ච සමුප්පන්නයි, දුකට හේතු වෙනවා. ඊට ආසා කළත් උපන් හැම ජාතියක්ම ජරා, ව්‍යාධි, මරණයන්ට ගොදුරු වෙනවා, වැනසෙනවා. සාරත්වයක් දෙන්නෙ නෑ. නිස්සාරයි. **ඒක හේතුවට අනුකූල ඵලය මිසක් කැමති සේ පවත්වන්න පුළුවන් දෙයක් නෙවෙයි.**

ඒ වගේම ගැළවෙන්න මගක් තියෙනවා. **කිසිවෙකුගේ බලයකට, අණසකට යටත් වෙලා කිසිම ජාතියකින් තමන්ට වෙන් වෙන්න බැරි විදිහට කවුරුවත් බැඳල තියල නෑ.** හේතුව ඇසුරු කිරීම තමා විසින් කළ දෙයක්. එතකොට තමන් විදිහට තිබුණෙ හේතු ඵල ක්‍රියාවලියක්. ඒ හේතුඵල ක්‍රියාවලිය අවිද්‍යා, තණ්හා, උපාදාන නිසාම ක්‍රියාත්මක වුණා. එයින් ක්‍රියා ඵලය තමන් විදිහට හෙවත් ප්‍රවෘත්ති ජාති විදිහට පහළ වෙලා තියෙනවා.

අවිද්‍යා, තණ්හා, උපාදාන නිරෝධ කරන මග බුදුන් වහන්සේ දේශනා කරල තියෙනවා. ඒ සත්‍ය ලෝකෝත්තර මාර්ගය කිසිම ශ්‍රේෂ්ඨ උතුමෙකුගේ නිෂ්පාදනයක් නෙවෙයි. සිද්ධ කරල තියෙන්නෙ, යටපත් වෙලා අවිද්‍යමානව තිබිච්ච දෙයක් මතු කරල විද්‍යමාන කිරීම පමණයි. මිදෙන්න රුකුල් දෙන මහා ශක්තියත් මතු කරල තියෙනවා. ඒ ශක්තිය උපයෝගී කර ගනිමින් ආර්ය මග/ආර්ය ජාති දැනගෙන ඒ මග, ඒ ජාති ඇසුරෙන් දුක් කෙළවර කරන අරිහත් ඵලය නමැති අන්තිම ජාතිය කරා යන මග පටිච්ච සමුප්පන්නව යා යුතුයි. සූවිසි ගුණ තුළින් අනුගමනය කළ යුතු ඒ මාර්ගය වටහා ගත්තම, ඒ සාසනික වූ නාමරූප ස්පර්ශය සුදුසු පරිදි ලැබෙනවා. ඒ අනුසාරයෙන් පටිච්ච සමුප්පන්නව ආර්ය ජාති පෙළ පූර්ව භාග ප්‍රතිපදා වශයෙනුත්, ඒකායන මාර්ග වශයෙනුත්, ඵල වශයෙනුත් පහළ වෙනවා. මේ විස්තරය පෙන්වා දුන්නෙ චතුර් ආරක්ෂා පූර්ව භාග ප්‍රතිපදා සිද්ධවෙන ආකාරය පෙන්වන්න.

මේ විදිහට බුදු ගුණ මෙනෙහි කරන කොට තමන්ට වැටහෙන කොටස අනන්ත බුදු ගුණයේ අංශුමාත්‍රයක් බව වැටහෙනවා. එතකොට අසමසම වූ ලොව්තුරා බුදුන් වහන්සේලාගේ ස්වභාවය වැටහෙමින්, බුදු ගුණ අනන්ත බව වැටහෙමින්, අනන්ත සසරේ පටන් ලෞකිකත්වයට ඇදෙමින් තිබිච්ච තණ්හා උපාදාන මෙල්ල වෙනවා. බුදු සරණ ලැබිල සැනසුමට, ඒකායන මාර්ගයට සුදුසු ප්‍රතිපදාව අනුගමනයට සුදුසු වූ ජාතියක පිහිටි බව වැටහෙනවා. දහම් ගුණ, සඟ ගුණ සිහි කිරීමත් මේ විදිහටමයි. පිළිසරණත් ඒ විදිහටම ලැබෙනවා. මේ තුන් පිළිසරණ නැතිව අනන්ත සසරේ පටන් ආ තණ්හා උපාදාන මැඩ පවත්වන්න බෑ. තමන් නොදැනුවත්වම රැවටිලා කාම, රූප, අරූප භවයන්වල ස්වභාවයන් ස්පර්ශ කරල ඒවායේ තණ්හා උපාදානයෙන් බැඳිල නිවන කියල රැවටෙනවා. හතරමං හංදියක ඉන්න කෙනෙකුට හතර දිහාවට පාරවල් හතරක් පේනවා. මංසංධිය තමයි මධ්‍යය. පාර තෝරා ගන්න ඕන එතැනදි. මේ විදිහට තමයි උපමා තෝරා ගන්න ඕන. එක මගක් නිවනට. එකක් කාම ලෝකයට. එකක් රූප ලෝකයට. අනෙක අරූප ලෝකයට.

යම් ලෝකයකට යන පාරක් ගන්නව නම්, ඒ පාර ඒ ලොවට මිසක් වෙන ලෝකයකට නෙවෙයි. වෙන ලෝකයකට යන්න නම් මොහොතකින් හෝ සිවු මංසලට ආපසු ඇවිත් හැරිල සුදුසු පාරේ යා යුතුයි. එහෙම හැරෙන්නෙ නැතිව, එන්නෙ නැතිව, කිසි විටෙකත් අනික් ලෝකයකටත්, නිවනටත් යන්න බෑ. බුදුන් වහන්සේ මහා බ්‍රහ්මයාට ධර්ම දේශනා කළත්, ආපසු හැරෙන්න බැරි වෙච්ච නිසා තවමත් බඹ ලොව තණ්හා, උපාදාන, භව, ජාති පහළ කරමින් ඉන්නවා.

ඒ කාලෙ රූප ලෝක සහ අරූප ලෝක මාර්ගවල ගිය යෝගීන් බුදුන් වහන්සේට හෝ නිවන් මගට හෝ සම්බන්ධ නොවී, නිවන් මගට හැරෙන්නෙ නැතිව, උන්වහන්සේ ආත්මය වනසන භයානක කෙනෙක් විදිහටත් ප්‍රකාශ කළා. අන්‍ය මාර්ග ඇසුරෙන් සිදුවන තණ්හා උපාදාන කොච්චර රැවටීම් සහගතද, මුලා සහගතද කියල මෙයින් පැහැදිලි වෙනවා. **සිල්වත් වෙච්ච පළියට, ධ්‍යානලාභී වෙච්ච පළියට තණ්හා උපාදාන මැඩ පවත්වන්න බෑ, අවිද්‍යාව, අන්ධ බව නැති කරන්න බෑ.** සෝතාපන්න නම් වූ ඇස් ඇති ජාතියට පත් නොවුණොත්, දේශකයාණන් වහන්සේලා කොච්චර දහම් නැණ පහන් දැල්වුවත් අන්ධ නිසා පේන්නෙ නෑ. අත ගාල ලබපු ස්පර්ශයකටම මුලා වෙලා රැවටෙනව මිසක්, ඇස් නැත්තෙක් කවදා නම් රූප සටහන් දකින්නද? ඇස් පහළ කරගත්ත සියල්ලෝම යම් දිනක බුදු ගුණ ගරු කළ අයමයි.

අපදාන පාලියේ එන ථේරාපදාන මීට සාක්ෂි දරනවා. ලොව්තුරා බුදු වෙන්නත් බුද්ධ ප්‍රසාදය මුල් විය

**යුතුයි. මේ බුදු ගුණයේ අංශු මාත්‍ර හෝ ප්‍රසාදයක් පූර්ව භාග ප්‍රතිපදාවේ මුළටම පහළ වෙන දිනයක් ඇත්ද, ඒ අවස්ථාව මේ භවයට වසර කල්ප ගණනකට ඈත සිද්ධ වෙච්ච දෙයක්. දහම් ඇස පහළ වෙන්නෙ මේ විදිහට කල්ප ගණනක් ගිය මූලික ගුණයේ වැඩුණ අයට. ඒ පූර්ව භාග ප්‍රතිපදාවේ කල්ප ගණනකට පෙර මුල් වූ තෙරුවන් කෙරෙහි ප්‍රසාද අවස්ථාත් සත්වයෙකුට ලබන්න හේතු වාසනා තිබිය යුතුයි. ඒ හේතු වාසනාවටත් ඈත අතීත වූ මුලක් තියෙනවා. ඒ තමයි ආර්ය ගුණයට ළඟම තියෙන ලෞකිකත්වයේ මව්පියන්ට ගරු කරල ලබන ගුණ පැහැදීම.**

මෙහෙම කිව්වම අධෛර්යමත් නොවිය යුතුයි. **බුදු, දම්, සඟ ගුණ අහන්න, දර්ශනය කරන්න, සිත්වල පවත් වන්න ඔබට යම් ආසාවක් තියෙනවද, ඒ ගුණය කෙරෙහි සිත් බැඳිල එබඳු ගුණවතුන් ඇසුරක් තියෙනවද, ඔබ මීට කල්ප ගණනක පටන් පූර්ව භාග ප්‍රතිපදාවක ආරම්භය තියෙන වටිනා පින්වතෙක් බව වටහා ගන්න ඕන. තෙරුවන් කෙරෙහි පැහැදෙන, ගුණ කියන, ගුණයේ බැහැගෙන ඉන්න ඔබේ නිවන, දහම් ඇස ඒ මොහොතේ පහළ වෙන්න තරම් අත ළඟයි.** මේ මග වඩපු නැති, සසර ඒ වාසනාව නොලබපු කෙනෙකුට තෙරුවන් ගුණය කොච්චර විද්‍යමාන වුනත් අංශුමාත්‍ර ප්‍රසාදයක් පහළ වෙන්නෙ නෑ. එබඳු අය කොහොමටවත් ඒ තත්වයේ ඉන්න තාක් කල් ගුණ ගරුක වෙන්නෙත් නෑ.

ඒ නිසා එබඳු අය දැක්කත්, අහන්න ලැබුණත් ඒ ගැන කම්පා නොවිය යුතුයි. අවමන් නොකළ යුතුයි. මුණින් පෙරලෙන්නවත් බැරි දරුවෙක් දැකල, මොහුට දුවන්න බැරි ඇයි කියල අහනව නම්, හිතනව නම්, එහෙම අහන හිතන තමනුත් ඉන්නෙ මහ මුලාවක බව දැනගන්න ඕන. මේ තමයි උපේක්ෂා විය යුතු තැන්. ඒ නිසා සාසනික වූ කරුණා මාර්ගයෙන් කවදහරි යහ මගට පත්වේවා කියල ඒ අයටත් ආශිර්වාද පැතිරවිය යුතුයි. ඒක තෙරුවන් ගුණ දරන උතුමන්ගෙ සිරිතක්.

මේ ගුණ තුළට ඇතුල් වන උතුමන්ට ඒ නම්වලින් ආමන්ත්‍රණය කිරීමත් සිද්ධ කරනවා. බුදු ගුණ කියන කොට බුදුන් වහන්සේට පමණක් අයිති ගුණ කියලත්, දහම් ගුණ ධර්ම රත්නයට පමණක් අයිති ගුණ කියලත්, සඟ ගුණ සංඝ රත්නයට පමණක් හිමි ගුණ කියලත් සමහර අය හිතනවා. නමුත් ඒක එහෙම නෙවෙයි. මේ අනන්ත වූ ගුණස්කන්ධ මාලාවන් ඒ ඒ මට්ටමින් ආර්ය පුද්ගලයන්ටත් තියෙනවා. ශේෂ මාත්‍රව අනුමාන වශයෙන් පෘතජ්ජන ගෝත්‍රය ඉක්මෙව්වෙ නැති බෞද්ධයින්ටත් තියෙනවා. (දීඝ නිකාය- සීලක්ඛන්ධ වග්ගය - <u>බ්‍රහ්මජාල සූත්‍රය</u>) එහෙම නැතිව බුදු ගුණ නවය බුදුන් වහන්සේට විතරක් නම් තියෙන්නෙ, ඒ ගුණ නාමයන්ගෙන් අරිහතුන් වහන්සේලාට ආමන්ත්‍රණය කරන්න බෑ. ඒ වගේම බුදුන් වහන්සේත් අරිහතුන් වහන්සේලාගේ ගුණයන්ගෙන් පූර්ණයි, නව මහා සඟ ගුණයන්ගෙන් පූර්ණයි. <u>ධජග්ග සූත්‍රයේදී</u> සාසන අනුගාමික පින්වතුන්ට බියක් තැති ගැන්මක්, ලොමු ඩැහැ ගැන්මක් ඇති වුනොත්, බුදු ගුණ, දම් ගුණ, සඟ ගුණ සිහි කරන්න කියලත්, එතකොට සියලු භය තැති ගැනුම්, ලොමු ඩැහැ ගැනීම් දුරුවෙන බවත් පෙන්වල, ඊට හේතුව තථාගතයන් වහන්සේ කිසි විටක කිසිවකට බිය තැති ගැනුම්, පළා යාම් නැති නිසා බවත් දේශනා කරල තියෙනවා. එයින් හැඟෙන්නෙ, සඟ ගුණ නමුත් තථාගත ගුණම බව. ඒ නිසා තථාගතයන් වහන්සේ සූවිසි තුනුරුවන් ගුණයෙන්ම පූර්ණයි.

කෙබඳු මට්ටමකින් හෝ ගුණයක් තුළ ඇති අනන්ත ගුණ මාලාවන්ගෙන් යම් මට්ටමක් හෙවත් කොටසක් දරනවනම්, ඒ පුද්ගලයා ගුණ දරන උතුමන්ගේ සංඛ්‍යාවට වැටෙන බව බුදුන් වහන්සේ දේශනා කරල තියෙන්නෙ, සුපටිපන්න, උජුපටිපන්න, ඥායපටිපන්න, සාමීචිපටිපන්න කියන මේ ගුණ සංඝයාට පවතින බවත්, සංඝත්වයේ ගුණ බවත්, ඒ ගුණ දරන උතුමන් පුද්ගල වශයෙන් අට කොටසකුත්, මාර්ග ඵල වශයෙන් යුගල ලෙස ගත්තොත් හතර කොටසක් ලෙසත් දේශනා කරමින්. නමුත් සෝතාපන්න පුද්ගලයට වඩා මේ ගුණ සකෘදාගාමි පුද්ගලයා ළඟ වැඩියි. අනාගාමි උතුමා ළඟ ඊටත් වැඩියි. අරිහතුන් වහන්සේ ළඟ ඊටත් වැඩියි. බුදුන් වහන්සේ ළඟ පූර්ණයි. නමුත් ප්‍රත්‍යක්ෂ ගුණ ටිකක් තිබුණත් සංඝ නමින් අමතනවා. මේ තමයි පරමාර්ථ සංඝත්වය, නියමාකාර සංඝත්වය. ඒකට ගිහි පැවිදි භේදයක් හෝ ස්ත්‍රී පුරුෂ භේදයක් හෝ නෑ.

අරිහතුන් වහන්සේලා ළඟ බුදු ගුණවල අරහං ගුණයත් තියෙනවා. ඒ නිසා අරහං කියල අරිහතුන් වහන්සේටත් ආමන්ත්‍රණය කරනවා. ඒ බව මජ්ජිම නිකාය (1) 650 පිටුවේ එන මහා <u>අස්සපුර සූත්‍රයේ</u> 33 වන ගාථාවේ මේ විදිහට සඳහන් වෙනවා. "කථංච භික්ඛවේ භික්ඛු අරහං හෝති ආරකාස්ස හොන්ති පාපකා අකුසලා ධම්මා සංකිලේසිකා පෝනෝභවිකා සදරා දුක්ඛ විපාකා ආයතිං ජාති ජරා මරණියා ඒවං ඛෝ භික්ඛවේ භික්ඛු අරහං හෝති"

ඒ වගේම, බුදු ගුණයක් වූ සුගත ගුණයත් අරිහතුන් වහන්සේලාට තියෙනවා. ඒ නිසා ඒ නමිනුත් අමතනවා. ඒ බව අංගුත්තර නිකායේ (1) ආනන්ද වර්ගයේ පෙන්වා තියෙනවා. "ස්වාමීනි, ඔබ වහන්සේලාගේ රාගය, ද්වේශය, මෝහය ප්‍රහීණ විය. මතු නූපදින ස්වභාව ඇත්තාහුය. ඔබ වහන්සේලා ලෝකයෙහි සුගත වන්නාහුය."

මේ විදිහට අරිහතුන් වහන්සේලා ළඟ බුදු, දම්, සඟ ගුණ පිහිටල තියෙනවා. ඊට හේතුව උන්වහන්සේලා ආර්ය ගුණය තුළින් ඒ ගුණ මාලාවන්වල එල්බෙමින් ගිහින් ඒවා දරමින් සූවිසි මහා ගුණ මාලාවන්හි එල්බෙමින් ගිහින් අරිහත් ඵලය ලබල තියෙන නිසා. ගුණ මෙනෙහි කරමින් ඒ ගුණ අනන්ත බව දකිමින්, සයුරෙන් ගත්ත ජල දෝතක් වගේ ගුණ දරාගෙන, නිවන් ගමනට සෑහෙන ගුණ මාලා දරාගෙන, ගුණවතෙක් වෙමින් අරිහතුන් වහන්සේ කියන ආර්ය ශ්‍රේෂ්ඨ ජාතියට පත්වෙන කල් සූවිසි ගුණ තුළ ගමන් කරල, බිය තැති ගැනුම්, ලොමු ඩැහැ ගැන්වීම් නැතිව ආර්ය මාර්ගය පූර්ණ කරනවා. පූර්ණ කරන කල් සරණාගමනයත්, අරිහත් ඵලයෙන් පූර්ණ වුනාම සරණගත බවටත් පත් වෙනවා.

ඒ කියන්නෙ, නිවන් දැකීම පූර්ණ කරගන්න කල් මේ ගුණ ආධාර කරගෙන පිළිසරණ කරගෙන ගිහින් අවසානයේදි සරණ නතර කරනවා. සැරිසැරීම නතර කරනවා. සරණගත වුනයි කියන්නෙ අන්තිමට ඒ අවශ්‍ය කරන්නා වූ පූර්ණ තත්ත්වයට පත් වුනා, නිවනට පත් වුනා කියන එක.

මේ විදිහට තිසරණය වටහා ගෙන බුද්ධානුස්සතිය දරාගත්තම ඒක මහත් වූ ආරක්ෂාවක් වෙනවා.

*පූජ්‍යපාද වහරක අභයරතනාලංකාර හිමිපාණන් වහන්සේ විසින් යළි මතු කළ සැඟවුනු දහම් කරුණු ඇසුරෙන් සකස් කළේ:*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# සත්වයා නිවන් දැකිය යුත්තේ ඇයි?



ලොව්තුරා බුදුවරයන් වහන්සේ නමක් කල්ප ලක්ෂ ගණනක් පෙරුම් පුරල මතුකර ගන්න මේ නිර්වාණ සම්පත්තිය දකින්න, ඒ මගට වැටෙන්න අපිට තියෙන ඕනෑකම මොකක්ද? ඒකෙන් ඇති ඵලය මොකක්ද? ඒක අවබෝධ කර ගන්නෙ මොකටද? මේ ආදී වශයෙන් නිවන පිලිබඳව නානාවිධ ප්‍රශ්න පෘතජ්ජනයෙකුට ඇතිවෙන්න පුළුවන්. සසර ගමනේ තියෙන ආදීනව පෙන්වා දෙමින්, අනිච්ච - දුක්ඛ - අනත්ථ කියන ත්‍රිලක්ෂණය අවබෝධ කරවමින්, ඒ අනුසාරයෙන් රාග - ද්වේශ - මෝහ දුරු කරල සසර ගමන කෙළවර කරන්න මග පෙන්වා දෙන්න තමයි ලොව්තුරා බුදුවරයන් වහන්සේ නමක් ලෝකයට පහළ වෙන්නෙ. පටිච්ච සමුප්පාද ධර්ම තුල හිරවෙලා සසර ගමන තුල අගක් මුලක් නැතිව සැරිසරන සත්වයින් අතරින්, නිවන් අවබෝධ කරන්නම හේතු වාසනා තියෙන අයට සදාකාලික දුකෙන් මිදෙන මාර්ගය බුදු රජාණන් වහන්සේ පෙන්වා දුන්නා.

කෙනෙක් අපෙන් ඇහුවොත්, ඇයි අපි නිවන් දකින්න ඕන කියල අපි දෙන උත්තරය මොකක්ද? මේ ගත කරන ජීවිතය තුල දුකක් නැත්නම් දුකෙන් මිදෙන්න දෙයක් නෑ. මේ හැම කෙනාගෙම ජීවිත සැපෙන් පිරිල ඉතිරිලා යනවනම් දුකක් කියල දෙයක් දැනෙන්නෙ නෑ. සමහරුන්ට කොච්චර සැප සම්පත්, යාන වාහන තිබුණත් හිතට කිසිම සැනසීමක් සතුටක් නෑ කියනවා. තමන්ගෙ කැමැත්තට අනුව පවත්ව ගන්න කොච්චර උත්සාහ කළත් ඒවත් අන්තිමට දුක් දෙනවා. ඉතිං මෙන්න මේ ගැලවෙන්න බැරි දුකෙන් මිදීම තමයි නිවන කියන්නෙ. ගහ තුලින්ම යැපිල ගහ වටේම එතිල ගහම විනාස කරන පිළිල ශාක වගේ, අපි වටා එතිල තියෙන මේ පිළිල තමයි කෙලෙස්. මේ කෙලෙස් විනාස කර දමන තාක් කල් මේ දුක සංසාරිකවම අපිට දැනෙනවා. මේ දුක කියන දේ ධර්මය තුලින් නොදැක්කම අහනවා, ඇයි අපි නිවන් දකින්න ඕන කියල. දුකක් තියෙනවා කියල ධර්මය තුලින් දැක්කම, නිවන් අවබෝධ කර ගත යුත්තේ ඇයි කියල තමන්ටම දැනෙන්න ගන්නවා. දුකෙන් මිදීමම තමයි නිවන කියල අවබෝධ කර ගන්නවා.

ධර්මය තුලින් නිවන් දැක්කෙ නැති වුනාම අපි හිතනවා, මේ ලෝකය හොඳයි, සැපයි, සාරයි, නරකක් නෑ කියල. යමක් නරක නම් විතරයි අත්හැරිය යුත්තේ. යමක් දුක් දෙනව නම්, කරදර දෙනව නම්, හරයක් නැත්නම්, ඒක දැක්ක දවසට අත්හැරිය යුතු බවත් දකිනවා. දුකක් නැත්නම් දුක්ඛ සමුදයක් (දුකට හේතුවක්) නෑ. දුකක් හට ගන්න හේතුවක් නැති තැන එහෙම දෙයක් හට ගන්නෙ නෑ. එහෙනම් යම් තැනක දුකක් තියෙනවා කියල අවබෝධ වුනාම තමයි ඒ දුක් ගින්න කොහොමද හට ගත්තෙ, මොකක්ද හේතුව කියල හොයල බලන්න ඕන. ඒක හට ගත්තෙ මෙන්න මෙහෙමයි කියල දැන ගත්තට පස්සෙ, හට ගත්ත ක්‍රමය නැති කරන කල් එයින් වෙන් වෙන්න බෑ කියල වැටහෙනවා. හට ගත්තෙ මෙන්න මේ හේතුව නිසයි කියල අවබෝධ කරගෙන, ඒ හේතුව තුරන් (නිරෝධ) කළාම ඒ දුකෙන් නිදහස් වෙනවා කියල අවබෝධ වෙනවා. එහෙනම් මේ හේතුව නිරෝධ කරන්න යමක් පහ කළ යුතුද, ඇසුරු කළ යුතුද, අන්න ඒ ක්‍රමය හොයා ගන්න ඕන. ඒ ක්‍රමය මොකක්ද? ඇත්ත ඇති හැටියෙන් දැකල සිත, කය, වචනය සංවර කරගෙන, ඒ දුක හටගන්න අවශ්‍ය ආහාර නිරෝධ කරල, දුකෙන් නිදහස් වෙන ක්‍රමවේදය ප්‍රඥාවෙන් අවබෝධ කරගෙන මාර්ග ඵල ලබන්න ඕන. ඒකට තමයි බුදුන් වහන්සේ ආර්ය අෂ්ඨාංගික මාර්ගය දේශනා කළේ.

යම් කෙනෙකුට දුකෙන් මිදෙන්න අවශ්‍යතාවයක් නැත්නම් මේ ආර්ය අෂ්ඨාංගික මාර්ගයෙන් ඒ පුද්ගලයට වැඩක් නෑ. දුක කියල දෙයක් යම් දවසක දැක්කෙ නැත්නම් දුකෙන් මිදෙන්න අවශ්‍යතාවයක් පැන නගින්නෙ නෑ. දුකට හේතුව හොයන්න ඕන කමකුත් නෑ. යම් තැනක ජරා මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස ඇතිවන හැටි අවබෝධ කර ගත්තොත් ඒක සැපක්ද දුකක්ද කියල හොයල බලනවා. යමෙකුට ජරා මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස හට ගන්නව නම්, ඒක දුකක් මිසක් සැපක් වෙන්නෙ නෑ, සැපක් වෙන්න හේතුවක් නෑ කියල ප්‍රඥාවෙන් අවබෝධ කර ගන්නවා. මමත් අකමැති, වෙන කෙනෙකුත් අකමැති ජරා මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස කියන දේවල් අනිවාර්යෙන්ම ඇති වෙනව නම්, ඒක නවත්වන්නත් බැරි නම්, ඒවාට මුහුණ දෙන්නත් අනිවාර්යෙන්ම සිද්ධ වෙනව නම්,

ඒවා යහපත්, හොඳයි, සාරයි කියල සලකන්න පුළුවන්ද? රසත් තියෙන, සුවඳත් තියෙන, කටට කෙළත් උනන, මත් ගතියත් තියෙන රා බඳුනකට වස දාල යම් කෙනෙකුට බොන්න දුන්නොත් ඔහු ඒ රා පානය කරයිද? කොච්චර සුවයක්, රසක්, සුවඳක් දැනුනත්, මත් ගතියක් ඇති වුනත්, අවසාන ප්‍රතිඵලය මරණය කියල දන්න නිසා පානය කරන්නෙ නෑ.

යම් ජාතියක් නිසා ජරා මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස ඇති වෙනවද, මුල් අවස්ථාවෙදි ඒ මගින් සුවයක් දැනුනත් පසුව ඒක දුකයි. අවිද්‍යාව නිසා මේ ලෝකෙ හොඳයි, වටිනවා, සාරයි, කොච්චර නම් කාම සුවයක් විඳින්න පුළුවන්ද, පංචේන්ද්‍රිය කොච්චරනම් පිනවන්න පුළුවන්ද... ආදී වශයෙන් ඒ කෙරෙහි ඇලීම නිසා ලෝකය හොඳයි කියන දෘෂ්ටිය තුල සැරිසරනවා. මාරයා වුනත් බුදු රජාණන් වහන්සේට කියා සිටියේ ඔය ටිකමයි. මේ තරම් සැප සම්පත් තියෙන මේ ලෝකෙ අත්හරින්න කියන්නෙ ඇයි? පින් දහම් කරල සැප සම්පත් වැඩි කරගන්න පුළුවන්කම තියෙද්දි ඇයි මේ අත්හරින්න කියන්නෙ? ඇයි මේ ලෝකය නරකයි කියන්නෙ? මෙහෙම තමයි මාරයත් බුදු රජාණන් වහන්සේගෙන් ඇහුවෙ. මේ ලෝකය ජරා මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාසවලින් කෙළවර වන එකක් බව අවබෝධ නොවුනොත් ඔය තර්කයම අදත් කෙනෙකුට මතු කරන්න පුළුවන්.

ජරා මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාසවලින් කෙළවර වීම විතරක් නෙවෙයි, ආස්වාදයකින් මත් වුනොත්, මත් වෙන මොහොතක් පාසා සතර අපායේ දුක් විඳින්න හේතු වන්නා වූ විසක් (කෙළෙස්) නිපදවෙනවා. ඒක හරියට වස දාපු මත් වතුර බිව්ව මොහොතේ පටන් ශරීරයේ ඉන්ද්‍රියන් එකින් එක අක්‍රිය කරමින් ලේ වමනෙ ගිහින් අවසානයේ මරණයට පත්වෙනව වගේ, ජරා මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස ගෙනදෙන යම් ජාතියක ප්‍රියයි, මනාපයි කියල මත් වෙලා ඉන්න අවස්ථාවක, ඒ මත් වෙන මොහොතක් පාසා සසර ගමන ගෙනියන ශක්තියක් නිපදවෙනවා. ඒ ශක්තිය කොච්චර කාලයක් ගෙවල ඉවර කරන්න වෙයිද දන්නෙ නෑ.

සමහරු පෙර භවයේ තමන් කවුද කියල හොයන්න යනවා. දෙවියෙක් වෙලා හිටිය කියල හොයා ගත්තම හරිම සතුටුයි. ඒ බව හරියටම හෙව්ව නම්, දෙවියො වෙලා ඉපදිලා ඉන්න බහුතරයක් පසුකාලීනව ලෝකයා ලස්සනයි කියන කුරුල්ලො වගේ සතර අපාගත වෙන්න ඉන්න අය. ලස්සන ලස්සන කුරුල්ලො මිහිරි ගී ගය ගයා යනව කියල තමයි ලෝකයා කියන්නෙ. ඒ දෙවිවරු තමයි දේව අත්බැව්වලින් චුත වෙලා ඒ විදිහට සතර අපාගත වෙලා තියෙන්නෙ. ඒ විදිහට තමයි ක්‍රමයෙන් පල්ලම් බහින්නෙ. මොකද මානයෙන් මත් වෙලා, මේ ලෝකය වටිනවා කියන අවිද්‍යාවෙන් කොටු වෙලා, මුලා සහගතව හිතපු, කියපු, කරපු දේවල් නිසා තමයි එහෙම වෙන්නෙ. ඒවායේ විපාක විදිහට කොච්චර කාලයක් තිරිසන් වෙලා ගෙවන්න වෙයිද දන්නෙ නෑ. ලස්සන මිහිරි හඬ තිබුණ දෙවියන්ට ලස්සන මිහිරි හඬ තියෙන සතෙක්ගෙ හඬ එනවා. ඒ විදිහෙ ලස්සන පාට ශරීරයටත් එනවා. මනුස්සයෙක් වුනත් ඒ ආකාරයට මත් වෙලා ඉඳල පුරුදු වුනොත්, පසුකාලීනව දෙවියෙක් වුනත් ඒ මත්වීම පුරුද්දට යනවා. මේ මත්වීම නිසා මනුස්සයා වුනත් දෙවියා වුනත් දන්නෙම නැතුව පව් කර ගන්නවා.


මේ තත්වය දැක්කට පස්සෙ, මහණෙනි, මේ වගේ කරුණු නිසා දේව සම්පත්තිය හොඳයිද කියල බුදු රජාණන් වහන්සේ අහනවා. **දිව්‍ය සම්පත්තියත් "අට්ටීයති හරායති ජිගුජ්ජති" ඇට කැබලි වගේ, මල මුත්‍ර වගේ ගන්න හරයක් නෑ කියල බුදු රජාණන් වහන්සේ දකිනවා. ඒ කියන්නෙ දිව්‍ය සම්පත්තියත් අනිච්චයි කියන කාරණය.** අනිච්චයි කිව්වෙ දේව සම්පත්තිය ස්ථිර නෑ කියල නෙවෙයි, පරිහරණයට නිසි නෑ කියන එක. ඇයි පරිහරණයට නිසි නැත්තෙ? ඉහත පෙන්වපු ක්‍රමවේදය නිසා. මේ ක්‍රමවේදය දැක්කම, දේව සම්පත් පැතීම පිළිබඳව ලැජ්ජා හිතෙනවා. මගඵල **ලැබුවෙ නැත්නම්, දෙවියන්ට දේවත්වය ලබල කර ගන්න වෙන්නෙ බොහෝ කාලයක් තිරිසන් ලෝකෙ කුරුල්ලො... ආදී තිරිසන් සත්තු වෙලා උපදින්න හේතු වෙන පාප කර්ම.** ආස්වාදය විඳින අතරතුර දුකට මුල්වෙන කර්ම ශක්තියත් ගොඩ නැගෙනවා. ඒ නිසා මේක හරියට ජරා ගොඩක් වගේ අවසානයේ දුක නම් ඇති කරන්නෙ, ඒකෙන් ගන්න තියෙන හරය මොකක්ද කියල දකින්න ඕන.

**තේමිය කුමාරයාගෙ පෙර අත්බැවක, විසි අවුරුද්දක් රජකම් කරල රජ සම්පත්තියේ ආස්වාද විඳින්න ගිහින් කරගත්ත අකුසල් නිසා බොහෝ කාලයක් ඔසුපත් නරකයක දුක් විඳින්න වුනා.** ඒ ඔසුපත් නරකයෙන් චුත වෙලා නැවතත් රජ කුලයක උපදින්න කර්ම ශක්තියත් තිබුණා. ජාති ස්මරණ ඥානයකින් මේ සිද්ධිය දැක්ක නිසා, කලින් රජ කිරීමෙන් රාජ සම්පත්තිය විඳගෙන කර ගත්ත අපරාධයෙන් අවුරුදු අසූ දහසක් ඔසුපත් නරකයේ දුක් වින්ද හැටි මතක් වුනා. දැන් ඉපදිලා ඉන්නෙත් රජ කුලයේ. මේ මොන අපරාධයක්ද මට නැවතත් වෙන්න යන්නෙ කියල දැනිල, අත් දෙකත් වකුටු කරගෙන 16 අවුරුද්දක් හිටියා. එහෙම හිටියෙ රජ කුලයෙන් පැනල යන්න දෙන්නෙ නැති නිසා. ඒ වගේම එහෙම ඉන්න හැකියාවකුත් තිබුණා. ඒ නිසා මුකුත්ම කර ගන්න බැරි කෙනෙක් වගේ 16 අවුරුද්දක්ම පැත්තකට වෙලා හිටියා. ඒක අධිෂ්ඨානයකින් තේමිය කුමාරයා කළ ක්‍රියාවක්. එහෙම කළේ, තමන්ව එපා වෙලා රජකමෙන් පවා ඉවත් කරයි කියල හිතාගෙන. මොකද කලින් රජකම් කරල ආස්වාද විඳින්න ගිහින් වින්ද දුක් ගිනි මතක් වුන නිසා.

අපි මේ සැප පසු පස හඹා ගිහින් විසාල දුකකට මාර්ගය හදා ගන්නවා. **සැප විඳින්න ගිහිල්ලත් අන්තිමේදි එන්නෙ දුකක් නම්, මේ ලෝකෙ දුක නැති තැනක් තියෙනවද? දුක් විඳින එක උපන් දා පටන්ම කරනවා. එතකොට මේ දුක සැප දෙකේම සාරත්වයක් තියෙනවද? දුක තුල එපා වෙන අසහනයත්, සැප තුල මර උගුල් ඇති නිසාත්, මර උගුල්වලට වැටි වැටී දුක් විඳ විඳා යන මේ ලෝකයේ කිසිම හරයක් නෑ කියල වැටහුණ දාට හිතෙනවා, මේ ලෝකයෙන් වැඩක් නෑ කියල.** එතකොට ලෝකයෙන් මිදෙන්න ඕන කියල වැටහෙනවා. එදාට නිවන් දකින්න ඕන කියල අදහස එනවා. වේදනා චෛතසිකයෙන් විඳින දුකත් නැති, සැපත් නැති තැනක් තියෙනවද, අන්න ඒක තමයි බුදු රජාණන් වහන්සේ දේශනා කළ නිවන.

*පූජ්‍යපාද වහරක අභයරතනාලංකාර හිමිපාණන් වහන්සේ විසින් යළි මතු කළ සැඟවුනු දහම් කරුණු ඇසුරෙන් සකස් කළේ:*

**ප්‍රසාද් ද සිල්වා**
**ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය**



# බුදු පියාණන් වහන්සේ පෙන්වා දුන් මෙත්තානුස්සතිය අද අර්ථ විපරීතයට ලක්වී ඇති හැටි...

මාර විපත්වලින් මිදිල ලෝකෝත්තර මග වඩාගන්න උපකාරී වන ආරක්ෂා හතරෙන් එකක් වන මෙත්තානුස්සතිය ගැන තමයි මේ විග්‍රහ කරන්නෙ. විශේෂයෙන් මේ කාලයේ දැනගත යුතු, නමුත් අර්ථ විපරීත වෙලා වැසී ගිය භාවනාවක් තමයි මෙත්තානුස්සතිය කියන්නෙ. මෙත්තාව කියන්නෙ මිත්‍රත්වය. නමුත් මිත්‍රත්වය කියන කොට නොයෙක් ආකාරයේ මිත්‍රත්ව තියෙනවා. සතුරා සමග සතුරු වෙච්ච කෙනෙක් දැක්කම, ඔහු සමග සතුරුකම් තියෙන අනෙක් දෙන්නා අතරත් මිත්‍රකමක් හටගන්නවා. එහෙම වෙන්නෙ තමන්ගෙ සතුරාට අනෙකාත් සතුරුකම් කරන නිසා. සතුරාගේ සතුරා මිතුරා කියන්නෙත් මේ නිසා. ඒ වගේම හොරෙක් තවත් හොරෙක් සමග මිත්‍ර වෙනවා. ඒ එකතු වෙලා හොරකම් කරන්න. ඒ වගේම සල්ලාලයා සල්ලාලයෙක් සමග මිත්‍ර වෙනවා. ඒ එකතු වෙලා සල්ලාලකම් කරන්න. ඒ වගේම ගුණවතා ගුණවතා සමග මිත්‍රයි. එහෙම වෙන්නෙ ගුණයට දෙන්නම කැමති නිසා.

මේ විදිහට ලෝකයේ මිතුරු දහම විවිධාකාරයෙන් පවතිනවා. මෙතැනදි එක දෙයක් සිද්ධ වෙනවා. ඒ තමයි තමන්ගෙ මිතුරාට අවැඩක්, අසාධාරණයක්, වැනසීමක් වෙයිද කියන බිය සැකය, මිත්‍ර ධර්මයේ ප්‍රබලත්වයේ තරමට සිද්ධ වීම. තමන්ගෙ මිතුරාට දුකක් එන කොට තමන්ටත් දුක ඇතිවෙනවා. මහත් වූ මිතුරන් දෙන්නෙක්ගෙන් එක් කෙනෙක් ලෙඩ වුණොත් අනෙක් කෙනාට ඒක කනස්සල්ලක් වෙනවා.

මවක් තමන්ගෙ එකම පුතා පණ මෙන් රැකගන්නව වගේ, සියලු සත්වයන් කෙරෙහි මෙත් වඩන්න කියල බුදුන් වහන්සේ දේශනා කරල තියෙනවා. ඒ වගේම ඒ මෙත් සිත අප්‍රමාණ ලෙසත් පැතිර විය යුතුයි. ඉඳින, හිටින, නිදන, ගමන් කරන මේ සතර ඉරියව්වලදිමත්, නිදාගෙන මිද්ධයෙන් තොරවත් මෙත් සිත පතුරවමින් කටයුතු කරන්න කියල බුදුන් වහන්සේ කරණීය මත්ථ සූත්‍රයේ දේශනා කරල තියෙනවා. ඒක මෙත්තා සහගත චේතනාවෙන් ලබන විමුක්තියට හේතුවෙන බවත් බුද්ධ දේශනාවක්.

මවකට දරුවෙක් ලැබුණා කියල හිතුවොත්, එතැන් පටන් මවට දරුවා කෙරෙහි දැඩි ඇල්මක් ඇතිවෙනවා. දරුවා වේගයෙන් ඇඬුවොත්, බය වුණොත්, දරුවාට රෝගයක්, හුස්ම හිරවෙන බවක්, අනාගත විනාසයකට හේතුවක් සිද්ධ වෙන බවක් මවට වැටහුණොත් ලැබෙන විමුක්තිය මොකක්ද? කැඩෙන, බිඳෙන, වැනසෙන, රෝග හැදෙන, නොයෙක් ආපදාවන් වෙන්න ඉඩ තියෙන බව දකින මවට, එබඳු දෙයක් වෙයිද කියල හිතක් ඇති වුණා නම් කොච්චර නම් වික්ෂිප්ත වෙයිද? උපාදානව උරුම නිසාම මවට නිතර බිය කම්පනය ඇතිවෙනවා. තමන් මියයන මොහොතක් එන බව වැටහුණා නම්, අනේ මගේ දරුවට මම නැති වුණොත් කවුද ඉන්නෙ කියල මහා කම්පාවක් ඇතිවෙනවා. මේ කියන්නෙ එක දරුවෙක් ගැන. දරුවො ගොඩක් ඉන්නවනම් මේ කම්පනය කොහොමට ඇත්ද? මේ තමයි මවක් දරුවා කෙරෙහි දක්වන මිත්‍ර බව. මේ මිත්‍ර බව නිසා සිද්ධ වෙලා තියෙන්නෙ විමුක්තියක් නෙවෙයි, මහා ගින්නක් බව දැන් වැටහෙනවා.

ලෝක සත්වයෝ අනන්තයි. ඒ අනන්ත ලෝක සත්වයන් අතර ඇහිපිය ගහන මොහොතක කී දෙනෙක් නම් සතුරු සතුන්ගෙ දත් පහරින්, නිය පහරින් අමු අමුවේ මැරුම් කනවද? කී දෙනෙක් නම් මර බියෙන් ලතෝනි දෙනවද? මිනිස්සු කී දෙනෙක් නම් ගහ මරා ගන්නවද? මවකට දරුවන් දහ

දෙනෙක් ඉන්නව නම්, ඒ සියල්ලන්ටම මව එක විදිහට ආදරය කරනව නම්, එක දරුවෙක්ගෙ ජයග්‍රහණයක් වෙනුවෙන් ප්‍රිය සාදයක සතුට භුක්ති විඳින මවට, තව දරුවෙකුට කවුරුන් විසින් හෝ ගහන මරු පහරකින් ලතෝනි දෙන හඬ ඇහුනොත් සතුටක්, සැනසුමක් ලැබෙයිද? නැත්නම් මහත් වූ හද කම්පාවක් ඇති වෙයිද? හෘද සාක්ෂියට අනුව දෙන්න පුළුවන් පිළිතුර තමයි, මවට මහා හද කකියවන කම්පාවක් ඇතිවෙනව වගේම මවත් ලතෝනි දෙමින් අඬ අඬා කෑගහන බව. ඉතින් ලෝක සත්වයන්ට මේ විදිහට මවක් ලෙස කටයුතු කළා නම් සමවතක්, විමුක්තියක් ලැබෙයිද කියල කල්පනා කරල බලන්න. **බුදුන් වහන්සේ ධර්ම දේශනා කළේ, දේශනා කළ නිසාවත්, පරපුරෙන් ගෙනා නිසාවත්, පොතේ තිබුණ පළියටවත් පිළිගන්න කියල නෙවෙයි. තමන් හොඳට හිතල බලල හදවතට එකඟව වැටහෙනව නම් පිළිගන්න කියල. මේ ගැන කී දෙනෙක් විමසල බලල තියෙනවද කියල කල්පනා කරල බලන්න.**

එක අවස්ථාවක විශාඛා උපාසිකාවගෙ මිනිබිරියක් කුඩා කාලයේම මියගියා. ඇයට මහත් ආදරයකින් හිටපු විශාඛාවන්ට ඒක දරාගන්න බැරි තරම් ලොකු වේදනාවක් වුණා. ඒ කාලෙ තිබ්බ්ච කුල සිරිතක් අනුව, මිනිය ගෙනිහින් සොහොනකට දමල ඒ වස්ත්‍ර පිටින්ම නාගෙන, ඒ තෙත වස්ත්‍රම ඇඳගෙන තමන්ගෙ නිවෙස්වලට යන සිරිතකුත් තිබුණා. විශාඛාවත් මේ විදිහට තෙතබරිත වෙච්ච වස්ත්‍ර පිටින් යන අතරමගදි දෙව්රම් වෙහෙරේ වැඩ හිටපු බුදුන් වහන්සේ හමුවෙන්න ගියේ දහමක් අහල ශෝකය තුනී කරගන්න අදහසින්. උන් වහන්සේ විශාඛාවගෙන්, මේ අවේලාවෙ තෙත කෙස් සහ තෙත වස්ත්‍ර සහිතව කොහි යන ගමන් ආවද කියල විමසුවා. එහෙම විමසුවේ කරුණු දැනගන්න නුවණ නැති නිසාවත්, සාමාන්‍ය පුද්ගලයෙක් වගේ නිකරුණේ අහන කතාවක් විදිහටවත් නෙවෙයි. ඒ අවස්ථාව ධර්ම දේශනාවකට සුදුසු අදහසක් මතුවෙන කරුණක් බව දැනගෙන. එතකොට ඇය, තමන් මිනිබිරියට ඉතා ආදරයෙන් සිටි බවත්, ඇය මියගිය නිසා සොහොනේ දමා එන අතරතුර ශෝකය දුරු කරගන්න බුදුන් වහන්සේ සොයා ආ බවත් ප්‍රකාශ කළා.

උන් වහන්සේ ඇයගෙන් මෙහෙම අහනවා. විශාඛාවනි, ඇය ජීවතුන් අතර හිටිය නම් ඔබේ අදහස කොහොමද? ස්වාමීනි, මම ඉතා සතුටු වෙනව කියල ඇය පිළිතුරු දුන්නා. එබඳු ආදරවන්ත මිනිබිරියන් දහයක්, සියයක් හිටියනම් කොහොමද කියල උන්වහන්සේ නැවතත් විමසුවා. ස්වාමීනි, මම මහත් සතුටක් ලබනවා කියල පිළිතුරු දුන්නා. එහෙනම් මේ සැවැත් නුවර ඉන්න සියල්ලෝම ඔබේ මුනුබුරු මිනිබිරියන් නම් ඔබේ අදහස කොහොමද? ස්වාමීනි, එහෙනම් මගේ සතුට අසීමිතයි කියල ඇය පිළිතුරු දුන්නා. විශාඛාවනි, මේ සැවැත් නුවර දිනකට කී දෙනෙක් පමණ මියයනවද? ස්වාමීනි, පස් දෙනෙක්, හතර දෙනෙක්, තුන් දෙනෙක්... ආදී වශයෙන් හැම දවසකම මිය යනව කියල විශාඛාව පිළිතුරු දුන්නා. එහෙනම් ඔබට තෙත ඇඳුම් අඳින්න වෙන්න නැති, තෙත කෙස් නැති, ශෝකය කණගාටුව නැති එක දවසක් හෝ දකින්න පුළුවන් වෙයිද කියල බුදුන් වහන්සේ විමසනවා. ආදරය, ඇලීම හේතුවෙන් ශෝකය, බිය, කණගාටුව ඇති කරන බවත්, මේ ඇලුම් වස්තු නැති තැනම ශෝකය, බිය, කණගාටුව නැති බවත් උන්වහන්සේ දේශනා කළා.

එහෙනම් තමන්ගෙ දරුවන් විතරක් නෙවෙයි, අනන්ත සත්වයින් තමන්ගෙ දරුවන් විදිහට සලකල කටයුතු කළොත් මොකක් වෙයිද? ලැබෙන මෙත්තා සහගත චේතෝ විමුක්තියක් තියෙයිද? කල්පනා කරල බලන්න. මේ ලෝක සත්වයන්ට දරුවන්ට වගේ සලකල දාහයක්, බියක්, ශෝකයක් නැතිව ඉන්න ලැබේවා කියල මෙත් වැඩීම කරන කොට, ඒ හිත මොන වර්ගයට අයති වෙනවද කියල චිත්තානුපස්සනාව වැටහෙනව නම් හිතාගන්න පුළුවන්.

මේ කියන මෛත්‍රිය වඩන කොට සතෙක් බඩගින්නෙන් පීඩිත වෙලා කෙඳිරි ගානව ඇහුණොත් තමනුත් බඩගින්නෙන් ඉන්නව වගේ දාහයක් දැනෙනවා. අසල්වැසි ගෙදරක බල්ලෙක් බැඳල තියල ගෙදර උදවිය දවසක් දෙකක් ගෙදර ආවෙ නැත්නම්, එබඳු අවස්ථාවක් දැකල "අර පවුකාර කාලකණ්ණි මිනිස්සු බල්ලට කරන අපරාදෙක හැටි! හිතක් පපුවක් නැති එවුන්ගෙ හැටි! බල්ල ඊයෙ ඉඳන් බඩගින්නෙ!" මේ ආදී වශයෙන් කියනවා. බැරිවෙලාවත් මහා අපාගත සත්වයෙක් පිපාසිත බව කියල කෑගහනකොට, කර්ම ශක්තියෙන්ම සකස් වෙච්ච ලෝදිය කටට වත්කරන හැටි, මහත් ගිනි සැරෙන් දැවිල, නමුත් කර්ම ශක්තිය නිසාම නොමැරී නැවතත් එතැනම පහළවෙන හැටි පෙනුණොත් මොකකින් මොකක් වෙයිද? මොනවා කියයිද? කපුටෙක් හෝ ගැරඬියෙක් සතෙක් අල්ලගෙන ඒ සතා මර හඬ නගද්දි, මරාගෙන අමු අමුවේ කනව දැක්කොත් නිහඬව ඉන්නවද? මෙත් වඩන සමහර අය සතාට වඩා කෑගහනවා. හිතට මොකක්ද වෙන්නෙ? හිතාගෙන ඉන්නෙ නම් මෛත්‍රිය නිසා කම්පාව, දුක දැනෙනව කියල. ඒ වුණාට තමන් නොදැනුවත්වම හිතට සිද්ධ වෙන දේ මොකක්ද කියල කල්පනා කරල බලන්න.

ඒ වගේම දේශකයාණන් වහන්සේ නමක් ධර්ම දේශන කරනවා. මෙත් වඩන පින්වතුන් ධර්මය ශ්‍රවණය කරනවා. මෙහෙම වෙලාවක ළඟපාතක ගැරඬියෙක් ගෙම්බෙක්ව ගිලින අවස්ථාවක් වුනොත් ගෙම්බා කෑගහන හඬ ඇහෙනවා. දැන් මෙත් සිත බලවත් නිසා බණ දේශනා කිරීමත් නවතිනවා. බණ ඇසීමත් නවතිනවා. දැන් ගැරඬියාගෙන් ගෙම්බව බේර ගන්න දුවනවා. ඉතින් මොකද වෙන්නෙ? අහපු බණ ටිකත් මතක නෑ. නවත්වපු තැනත් මතක නෑ. මේ තමයි එක් ආකාරයක මෛත්‍රිය ක්‍රියාත්මක වෙන හැටි. දැන් මෙහෙම මෙත් වඩන කොට හිත කොහාටද දුවන්නෙ? යනකොට ගැරඬියා ගෙම්බව ගිලල නම් දැන් මොකද කරන්නෙ? පොල්ලක් අරගෙන ගැරඬියට තඩි බානවා. දැන් මොකක්ද සිද්ධ වුණේ කියල හිතල බලන්න.

ඒ වගේම ගෙදර වහලය අස්සෙ ලේන් කූඩුවක් තියෙනව කියල හිතන්න. ගැරඬියෙක් ලේන් පැටව් ගිලින්න කූඩුව ළඟ මාන බලනවා. "අනේ අහිංසක ලේන් පැටව්! උන් නිදුක් වේවා!" ගැරඬියාට කෝටු පාරක් ගහල පන්නල දානවා. නැත්නම් භූමිතෙල් ටිකක් ඉහිනවා. "ඒකට වඩා ලොකු අපරාදයක්නෙ ලේන් පැටව් ටික ගිල්ල නම්! බෝසතාණන් වහන්සේත් ලේන අත්බැවක ඉපදිලා ලේන් පැටිය මුහුදට වැටුණ වෙලාවෙ, මුහුද ඉහින්න වලිගය තෙම තෙමා ගොඩට ගැහුව කියලත් කියනවනේ! කොහොම හරි ලේන් පැටව් ටික රකින්න ඕන. බෝසතාණන් වහන්සේ ගැරඬි අත්බැවක ඉපදුන බවක්වත් අහල නෑ" දැන් මෙහෙමත් හිතනවා.

"ළමයිනේ මම ටිකක් භාවනා කරනකල් ගැරඬියා ආයෙත් එයිද කියල බලන්න" දැන් ළමයින්ට මෙහෙම කියල තමන් මෛත්‍රී භාවනාව කරනවා.



සියලු සත්වයෝ නිදුක් වෙත්වා! නිරෝගි වෙත්වා! සුවපත් වෙත්වා! දැන් ළමයි ඒ ගැන බලන්නෙ නැතිව ගිහින් සෙල්ලම් කරනවා. ලේන් පැටව් කෑගහනව ඇහෙනවා. භාවනාව නවත්වල පින්වතා ඉක්මනට එතැනට යනකොට ගැරඬියා ලේන් පැටව් ගිලිනවා. දැන් ළමයින්ටත් බැන බැන ඉක්මනින් භූමිතෙල් ටිකක් ගැරඬියගෙ ඇඟට හලනවා. සතුන්ට සිද්ධ වෙන මරණ බය දැකල මර හඬ දෙද්දි, උන් ගිල දමන හැටි දැකල පපුව හෝස් ගාල දාහයට පත්වෙලා. "හරි වැඩේ! මේව මාරයගෙ වැඩ! භාවනා කරන්න දෙන්නෙ නෑ!" දැන් මෙහෙමත් හිතනවා. "කමක් නෑ, හොඳට රෑ වුණාම භාවනා කරනවා. එතකොට කරදරයක් නැනෙ." ඊළඟට එහෙම හිතල රෑ වෙලා භාවනා කරන්න පටන් ගන්නවා. නමුත් පැය කාලයි භාවනා කරන්න ලැබෙන්නෙ. ගෙදර බළලා මීයෙක් අල්ලගෙන කාමරේ ඇඳ යට උඩ විසි කර කර සෙල්ලම් කරනවා. මීයා මැරිල නෑ. පණ අදිනවා. එහෙ මෙහෙ දුවන්න හදනවා.

දැන් ඉතින් රෑ භාවනා කරලත් ඉවරයි. ඉක්මනින් නැගිටිනවා. ළමයින්ට කෑගහනවා. "ළමයිනේ මෙන්න බළලා මීයෙක් අල්ලගෙන!" මෙහෙම කෑගහනකොට ගෙදර අනෙක් අයත් බය වෙලා නැගිටිනවා. බළල මීයෙක් අල්ල ගත්ත නිසා කෑගහනව කියල දැනගත්තම භාවනා කරපු පින්වතාට බැන වදිනවා. "රෑ දොළහයි! මේක මහ කරදරයක්! බළල්ලු මීයො අල්ලන එක අමුතු දෙයක්ද?" මෙහෙම බනින කොට පින්වතාගෙ හිතට විසාල අමනාපයක් කලකිරීමක් දැනෙනවා. දැන් හිතින් බනිනවා. "පවුකාරයෝ! උපනුපන් ජාති ජාතිවත් මුන් ඉන්න අහලකවත් උපදින්න සිද්ධ වෙන්න එපා". මෙහෙම කොඳුරමින් බළලට කොස්සෙන් ගහල පන්නනවා. බළල මීයත් අරගෙන ගොරවගෙන දුවනවා. මීයා කටින් අල්ලනකොට වරස් ගාල සද්දෙත් එනවා. හිත කීරි ගැහෙනවා. "හරි වැඩේ! භාවනා කරන්න තැනක් නෑ! ආශ්‍රය කරන්න සිද්ධ වෙලා තියෙන්නෙ පවුකාරයො!" මෙහෙම හිත හිතා භාවනා කරන්න හොඳ පන්සල්, හොඳ තැන් හොය හොයා යනවා. දැන් මේ වගේ අවස්ථා අපට කොච්චර නම් අහන්න ලැබෙනවද? මේ විස්තරය කිව්වෙ, මෙහෙම භාවනා කරල මෙත්තා සමාධිය පහළ වෙන්නෙ කොහොමද කියල තේරුම් ගන්න.

"මාතා යථා නියං පුත්තං - ආයුසා ඒක පුත්ත මනු රක්ඛේ" කරණීයමත්ථ සූත්‍රයේ මෙහෙම කියල තිබුණට, ඒ කාලෙ හිටපු එක්තරා මනුස්සයෙක් තමන්ගෙ භාර්යාවට ළමයෙක් ලැබෙන්න ඉඳෙද්දි සසර කලකිරිල භාර්යාව දමල ගිහින් මහණ වෙලා හිටියා. දරුවව වැදුවට පස්සෙ මව දරුවත් අරගෙන උන්වහන්සේ ළඟට ගිහින් තමන් සහ දරුවා අත්හැරල ගියාට අපහාස කරල, දරුවා උන්වහන්සේ ළඟ තියල, මට දරුව උන්නත් එකයි මළත් එකයි, ඔබට දාව ලැබුණ දරුවා තියා ගන්න, මම යනව කියල යන්න ගියා. දරුවා මහ හඬින් ඇඩුවා. පහළට බිම දිගේ පෙරළිලා ගියා. නමුත් උන්වහන්සේ ඒ දිහා ඇහැවත් ඇරල බලන්නෙ නැතිව, එබන්දක් නොවන්නා සේ නිහඬව වැඩ සිටියා. දරුවගෙ මව දරුවව අත්හැරල යනව වගේ පෙන්වල, දුරට ගිහින් ගහක් ළඟ මුවාවෙලා සිද්ධ වෙන දේ බලාගෙන හිටියා. දරුවා ළඟ තියලවත් පළක් වුණේ නැති තැන, බැන බැන ඇවිත් නැවතත් දරුවා අරගෙන යන්න ගියා. බුදුන් වහන්සේ මේ සිද්ධිය බුදු ඇසින් බලාගෙන හිටියා. මාගේ පුත්‍රයා දරුවා නිසාවත්, බිරිය නිසාවත්, ලෝකය නිසාවත් කම්පා වෙන්නෙ නෑ කියල බුදුන් වහන්සේ උදාන වාක්‍යයක් දේශණා කළා. ඒ කියන්නෙ උන්වහන්සේ අරිහත් ඵලයට පත්වෙලා හිටියෙ. මේක පෙළ දහමේ තියෙන කතාවක්. (බුද්දක නිකාය (1) 138 පිටුව සංග්‍රාමජිත් සූත්‍රය)

මෙතැනදි මාතා කියල කිව්වෙ අම්මට නෙවෙයි, අමා මෑණියන් වහන්සේට හෙවත් බුදුන් වහන්සේට. යථා නියං පුත්තං කිව්වෙ යථාර්ථවත් නියම පුතා හෙවත් අරිහතුන් වහන්සේට. ආයුසා ඒක පුත්ත මනු රක්ඛේ කිව්වෙ, ආයුස ඒ සඳහා වෙන් කරල, යථාර්ථවත් නියෙම පුතෙක් හෙවත් එකම පුතා වන අරිහතුන් වහන්සේ නමක් බවට පත්වෙන කල් අනුරක්ෂණය කරනවා කියන එක. ඒ කියන්නෙ, බුදුන් වහන්සේ මහා දයානුකම්පාවෙන් තමන්ගෙ ජීවිත පැවැත්ම, ශ්‍රාවකයන්ගේ සුබ සිද්ධිය උදෙසා වෙන් කළා, ඒක ආදර්ශයට අරගෙන අනෙක් අයටත් මෙත් වඩන්න කියල තමයි මේ පෙන්වල තියෙන්නෙ.

ඒ වගේම වේළුවනාරාමය පිටුපස චුන්දසූකර කියන ඌරු වැද්දෙක් ඌරන් මරමින් මස් විකුණමින් ජීවත් වුණා. ඌරන් මරන හඬ වේළුවනාරාමයටත් ඇහෙනවා. කොසොල් රජතුමාත් දිනපතාම ඇවිත් බුදුන් වහන්සේගෙ සැප දුක් විමසල වැඳල පුදල යනවා. භික්ෂුන් වහන්සේලාත් මෙත් වඩනවා. බුදුන් වහන්සේත් මහ මෙත් වඩනවා. නමුත් ඌරන්ගෙ මර හඬ කිසිම ගැටළුවක් වෙලා නෑ. චුන්දසූකරගෙ ඌරන් මැරීම නොහොබිනා බවට ඉඟියක් හෝ පෙන්නුවනම්, කොසොල් රජතුමා චුන්දසූකරයව මොහොතකින් ඒ ස්ථානයෙන් පිටමං කරන්න තිබුණා. නමුත් ඒ වගේ ගැටළුවක් මතු වෙලා නෑ. අන්තිමට චුන්දසූකර මියයන්න පණ අදිද්දි ඌරෙක් කෑගහනව වගේ හඬ නැගුවා. ඒ අවස්ථාවේ බුදුන් වහන්සේ භික්ෂුන් වහන්සේලාට දේශනා කරනවා, මහණෙනි, චුන්දසූකර පාපය මිහිරියි කියල හිතාගෙන, විපාකය එනකල් සතුටු වුණා, අද ඒ විපාකය මතුවෙලා ඌරෙක් වගේ හඬනගනවා, ඔහුට ඔසුපත් නරකය උරුම වෙලා කියල.

මේ වගේ, චුන්දසූකරගෙ කටයුතු දැකලවත් කම්පා වුණේ නෑ. භික්ෂුන් වහන්සේ ළඟ දරුව දමල ගිය

# වටිනා දහම් කොටස්...



පෙළ දහමේ සඳහන් වටිනා දහම් කොටස් වගේම වෙනත් පුද්ගලික දහම් පොත්පත්වල පවා සඳහන් වැදගත් කියල හැඟෙන දහම් කොටස් ඥාන ගෝචරව තේරුම් අරගෙන, ලෝකයාට කවදහරි වැදගත් වෙයි කියල හිතල, ලැබුණ ඉඩකඩක කෙටියෙන් සටහන් කර තැබීම වහරක අභයරතනාලංකාර හිමියන්ගේ එදා පටන් පැවති සිරිතක්. මීට අවුරුදු විසිපහකට පමණ පෙර ඒ ආකාරයට උන්වහන්සේ විසින් සටහන් තබන ලද වැදගත් දහම් කොටස් කිහිපයක් පහතින් සටහන් කෙරෙනවා.

**කාම වස්තුවක් පිළිබඳව පතන පැතුම් වුවද, සිල්වත්ව සිට ශ්‍රමණ බ්‍රාහ්මණාදීන්ට යහපත් යමක් දන් දී පැතුවොත් ලැබෙන බවත්, එසේ පැතීම පවක් නොව කාම භවයට හේතු වන** බවත් දීඝ නිකාය (3) 443 පිටුවේ එන <u>සංගීති සූත්‍රයේ</u> දැක්වේ.

**එසේම දුගී මගී යාචකාදීන්ට දුන් දානය, උතුමන්ට දුන් දානයට වඩා යහපත් යැයි සිතීමේ පාපය ගැන විස්තර** <u>කෙලෙස් එක්දහස් පන්සියය පොතේ</u> 188 පිටුවේ ඇත.

**ප්‍රාර්ථනාව නිසා පාපයක් වේ යැයි කීමට පිළිතුරු ඇත. කැමැත්තෙන් පතන ලෞකික හොඳ දේ ශ්‍රද්ධා, සීල, ත්‍යාග, ප්‍රඥා ඇතිව කළොත්, එම සම්පත් ලැබී කාම ස්වර්ගයේද ඉපදිය හැකි බව** අංගුත්තර නිකාය (2) 119 පිටුවේ එන <u>නකුල සමජීවී සූත්‍රයේ</u> දක්වා ඇත.

ප්‍රාර්ථනා පිළිබඳව පෙන්වූ තවත් තැනක්. අංගුත්තර නිකාය (2) 125 පිටුව <u>පත්තකම්ම සූත්‍රය.</u> **දහම් නොබිඳ භෝග සම්පත්, පරිවාර සම්පත්, දීර්ඝායු සම්පත්, මරණින් මතු සුගති සම්පත් යන මේවා පැතීම ඉෂ්ට - කාන්ත -**

වෙලාවෙත්, මවක් දරුවෙක් රකිනවා වගේ දිවි පරදුවට තියල සියලු සතුන්ට යහපත කරන්න, මෛත්‍රිය පතුරවන්න කියල දේශනා කළා නෙවෙයි, ජාතක කරපු පියා ළඟ දමල ගිය දරුවා උන්නද මළාද කියලවත් නොබැලීම ගැන බුදුන් වහන්සේ ඒ භික්ෂුන් වහන්සේට ප්‍රසංසා කරල තියෙන බව පැහැදිලි වෙනවා. නමුත් අද මෙත් වඩන්න යන අයට සිද්ධ වෙන මේ වගේ ප්‍රශ්ණ එදා බුදුන් වහන්සේටවත්, භික්ෂුන් වහන්සේලාටවත් තිබිල නෑ.

හැබැයි අද සමාජයේ ජීවත් වෙන **අය තමන්ගෙ යුතුකම් ඉටු නොකර පංච කාමය භුක්ති විඳින්න, තමන්ගෙ වාසියට කපටිකමට මේ කියපු කාරණා ලෞකික ජීවිතයට ඇඳගෙන අර්ථ පටලවාගෙන වරදවා තේරුම් නොගත යුතුයි.** මොකද පහත් කාමය මුල් කරගෙන තමන්ගෙ භාර්යාව, දරුවො අතරමං කරල ගිහින් වෙනත් කාන්තාවො පස්සෙ යන අයත් සමාජයේ ඉන්නවා. ඒ විදිහට කාමයට කෑදර වෙලා තමන්ගෙ යුතුකම් ඉටු නොකර පැනල යන එක වෙනම කාරණයක්. ඒකට කවද හරි විපාකයක් ලැබෙනවා. නමුත් අර අරිහතුන් වහන්සේගෙ අදහස ඒකට ගලපන්න බෑ. උන් වහන්සේ අරිහත් ඵලය පූර්ණ කරගෙන තමන් ගිහි කල වදපු දරුවටවත් ඡන්ද රාගයෙන් බැඳුනෙ නැති නිසයි ඒ විදිහට වැඩ හිටියෙ. මොකද උන්වහන්සේ දන්නවා, කම්මස්ස කෝම්හි, කම්ම දායාදෝ... ආදී වශයෙන් කර්මය මුල් කරගෙන, දායාද කරගෙන, උපත කරගෙන, නෑයා කරගෙන, පිළිසරණ කරගෙන, යම් කර්මයක් කළාද, යහපතක් නම් යහපත් දෙයක් හෝ අයහපතක් නම් අයහපත් දෙයක් හෝ ප්‍රතිඵල විදිහට දායාද කරගෙන මේ සසර ගමන යනවයි කියන කාරණය. ඒ නිසා උන්වහන්සේ දන්නවා, ඒ ළමය කවදාවත් අතරමං වෙන්නෙ නෑ කියල. මොකද යමෙක් උපන්න නම් මේ ලෝකෙ ජීවත් වෙන්න මොනව හරි ක්‍රමවේදයක් හැදෙනවා. ඒක කර්මයට යටත් වෙලා මොන විදිහට හරි සකස් වෙනවා. ඒ නිසා ලෝකය ගැන යථාවබෝධය ලබපු උන්වහන්සේගේ ක්‍රියාකලාපය පෘථජ්ජනයාගේ ක්‍රියාකලාපයට සමාන කරන්න බෑ.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

*පූජ්‍යපාද වහරක අභයරතනාලංකාර හිමිපාණන් වහන්සේ විසින් යළි මතු කළ සැඟවුනු දහම් කරුණු ඇසුරෙන් සකස් කළේ:*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

**මනාප - දුර්ලභ කාරණා හතරක් බවත්, ශ්‍රද්ධා - සීල - ත්‍යාග - ප්‍රඥාවන්ගෙන් යුක්තව දහම් නොබිඳ සිටියොත් ඒවා ලැබිය හැකි බවත් පෙන්වා ඇත.**

**ආයුස - නිරෝගී බව - වර්ණය - ස්වර්ගය - උසස් කුල - එකිනෙකාගේ සිත් ඇදගැනීම් පතන අය අප්‍රමාදව පින් කළ යුතු බව** සංයුක්ත නිකාය (1) 161 පිටුව <u>අප්පමාද සූත්‍රය</u>.

සිල්වත්ව මිනිස් ලොව හෝ දෙව් ලොව සම්පත් පතා දන් දුන්නොත් ඒ පැතුම ඉටුවන බව. එබැවින් **සුව කැමති දිව්‍ය සම්පත් පතන්නා වූ හෝ මනුස්ස සම්පත් කැමැත්තා වූ මිනිසා විසින් නිති කැඳ දන් දීම සුදුසු වන්නේය.** 565 පිටුව <u>මහා වග්ග පාලි</u> (2)

ධර්ම චරියා-සම චරියා ඇතිව ලොව යම් තැනක උපතක් පැතුවොත් හරියන බව. අනුන් සතු දේ තමාට වේවා යන දැඩි ලෝභය, වෛරය, දස වස්තුක මිථ්‍යා දෘෂ්ටිය දුරුව පැතීම නිසා මෙය සිදු වන බවත්, මෙහි පෙන්වූ සම්මා දිට්ඨිය ලෞකික බවත් පෙන්වා ඇත. මජ්ජිම නිකාය (1) 673 පිටුව - <u>වේරංජක සූත්‍රය</u>.

නුවණැත්තෝ ලෞකික කරුණු තුනක් පතා සිල් රකින බව. එනම් ප්‍රසංසාව, වස්තු බලාපොරොත්තුව, ස්වර්ග සැප පතා සිල් රකින බව ඛුද්දක නිකාය (1) - 408 පිටුව - <u>සුඛපත්ථනා සූත්‍රය</u>.

**ප්‍රත්‍යක්ෂ කර නොගෙන දහම් දෙසන්න යෑම අවැඩ බව.** දීඝ නිකාය (1) 550 පිටුව - <u>ලෝහිච්ච සූත්‍රය.</u>

**සතර මහා භූත සාසනය අතුරුදහන් නොකරන බවත්, ත්‍රිවිධ රත්නය කෙරෙහි යටහත් පැවතුම් නැති වීමෙන් සාසනය අතුරුදහන් වන බවත්** පෙන්වයි. සංයුක්ත නිකාය (2) 339 පිටුව - <u>සද්ධර්ම ප්‍රතිරූපක සූත්‍රය.</u>

කාමයෙන් වෙන් වන අයුරු - හටගැනීම (උදයංගම), පැවැත්ම (අත්ථංගම), මිහිර (ආස්වාද), දොස් (ආදීනව), අත්හැරීම (නිස්සරණය). පංච කාමයන් ගැනම මෙසේ තත්වූ සැටියෙන් දැනගත යුතු බව අංගුත්තර නිකාය (2) 22 පිටුව - <u>යෝග සූත්‍රය.</u>

**තථාගත ස්තූපයට මල් සුවඳ පිදීම, සැදැහැයෙන් වැඳීම යහපත් බව.** දීඝ නිකාය (2) 223 පිටුව (එබැවින්, බුදුන් වහන්සේ මේවා දේශනා කර නැතැයිද, මේවා කරන පිංවතුන්ට මිථ්‍යා දෘෂ්ඨික යැයිද කියමින් තර්ක කරන උදවිය මෙය කියවා බැලීම වටී)

**කළ පිනෙන් යහපත් පටිසන්ධියක් ලැබුවද පසුව පින ගැන උකටලී වීමෙන් අයහපත් ප්‍රවෘත්ති විපාක ලැබූ අයුරු** සංයුක්ත නිකාය (1) 169 - පිටුව <u>දුතිය අපුත්තක සූත්‍රය.</u>

**ඒ අනුව, එක් සිටුවරයෙක් නගරසිඛී නම් පසේ බුදුවරයන් වහන්සේ නමකට දානයක් දෙන්න අණ කර, පසුව දාසයන්ට ඒ දානය දුන්නා නම් හොඳ යැයි සිතීමෙන් සත් වරක් ස්වර්ගයේද සත් වරක් සිටුවරයෙක්ද වී, සිටු වුවත් කටුක දුප්පතෙකු මෙන් භෝග නොවිඳ ජීවිතය ගත කළ බවත්, එකල දරුවෙකු නැසූ පවින් දරු සැප නැතිව වස්තුව රාජ සන්තක වූ බවත් පෙන්වයි.**

## <u>අපදන පාලිය (2)</u>

77 පිටුව - <u>ඒක දීපිය ස්ථවිරාවදානය</u> සිද්ධාර්ථ බුදුන්ගේ චිතකය ළඟ පහනක් දැල්වූ පින් ආනිසංසයෙන් ආලෝක සම්පත් ලබා නිවනට උපනිශ්‍රය ලැබූ බව.

97 පිටුව - <u>සත්ත කදම්භ පුප්ඵිය ස්ථවිරාවදානය</u> - පසේ බුදුවරුන්ට මල් හතක් පුදා ලැබූ පිනෙන් උපනිශ්‍රය ලැබ 94 කල්පයකින් මතු මේ බුද්ධ සාසනයේ නිවන් දුටු බව.

109 පිටුව - <u>සෝවණ්ණකිංකණිය ස්ථවිරාවදානය</u> - වැල්ලේ වැලි ගොඩක් සෑයක් සේ කර කිණිහිර මල් පුදා එම ආනිසංසයෙන් 18 කල්පයක් සුව විඳ නිවනට උපනිශ්‍රය ලැබූ බව.

117 පිටුව - <u>ඒක සංඛිය ස්ථවිරාවදානය</u> - විපස්සී බුදු රජුන්ගේ බෝධියට සක් පිඹීමේ පූජාවක් කොට 91 කපක් සුගතිගාමීව මෙකල නිවනට උපනිශ්‍රය ලබා නිවන් දුටු බව.

119 පිටුව - <u>පාටිහීර සඤ්ඤක ස්ථවිරාවදානය</u> - පදුමුත්තර බුදුන් දවස බුදුන්ද ඇසින් නොදැක, බුද්ධ ඍද්ධි ප්‍රාතිහාර්ය ලෙස ඉබේ සද්ද වන වීණා බෙර හඬ අසා ඒ ප්‍රාතිහාර්යෙන් සිත් පහදවා ගත් පමණින් කල්ප සිය දහසක් දුගතියෙහි නොඉපදී මෙකල නිවන් දැකීමට උපනිශ්‍රය සම්පත් ලැබූ බව.

147 පිටුව - <u>සීහාසන වීජක ස්ථවිරාවදානය</u> - තිස්ස බුදුන්ගේ බෝධිය ළඟ සිහසුනට පවන් සැලීමෙන් 92 කල්පයක් දුගතියෙන් මිදී මෙකල නිවන් ලැබූ බව.

179 පිටුව - <u>සුමණ විජනිය ස්ථවිරාවදානය</u> - සමන් මල් වටාපතකින් විපස්සී බුදු රජුන්ගේ බෝධියට පවන් සලා ඒ පිනෙන් 91 කල්පයක් සුගතිගාමීව මෙකල නිවන් දුටු බව.

187 පිටුව - <u>පුලින චංකමීය ස්ථවිරාවදානය</u> - මුව වැද්දෙකුව සිට සක්මනක් දැක සක්මනට වැලි ඉසීමෙන් 31 කල්පයක් සුගතිගාමීව නිවනට උපනිශ්‍රය ලබා නිවන් දුටු බව.

187 පිටුව - <u>පංසුකූල සඤ්ඤක ස්ථවිරාවදානය</u> - කඩු දුනු ගෙන ආහාර සෙවීමට කැලෑ වැදුණු කෙනෙක්, එල්වා තිබූ බුද්ධ චීවරයක් දැක ගරු සිතින් වැන්ද පිනෙන් 92 කල්පයක් යන තුරු සුගතිගාමීව මේ සාසනය සමයේ නිවන් දුටු බව.

189 පිටුව - <u>බුද්ධ සඤ්ඤක ස්ථවිරාවදානය</u> - සිද්ධාර්ථ බුදු රජුන් නොදැකම බුද්ධ ශ්‍රේෂ්ඨ සංඥාව උපදවා කළුරිය කොට ඒ පිනෙන් 94 කපක් දුගතියෙන් මිදී සිට මෙකල නිවන් දුටු බව.

205 පිටුව - <u>පුලිනුප්පාදක ස්ථවිරාවදානය</u> - බුදු රජුන් ලොව පහළ වන්නත් පෙර, වේදයේ ඇති බුදුවරුන්ගේ පිටත පෙනෙන ගුණ සිතා වැලි සෑයක් සාදවා වැඳ පූජා කිරීමෙන් සිය දහස් කල්පයක් දුගති නැතිව සුගති ගතවී මෙකල නිවන් දැකීමට උපනිශ්‍රය ලැබූ බව.

209 පිටුව - <u>තරණීය ස්ථවිරාවදානය</u> - කැස්බෑවෙක්ව අත්ථදස්සී බුදු රජුන් ගඟින් එගොඩ කළ පිනෙන් අටළොස් සිය කල්පයක් සුගතිගාමීව මෙකල මේ සාසනයේ නිවන් දුටු බව.

මේ කාරණා අනුව, **බුද්ධ සාසනයක් වෙනුවෙන් යමෙක් විසින් සුළුවෙන් කරන පූජාවක් හෝ ඇප උපස්ථානයක් හෝ සිත පහදවා ගැනීමක් හෝ වෙනත් ලෞකික පින් කටයුතු මෙන් සුළු කොට නොසිතිය යුතු බවත්, කවදා හෝ බුද්ධ සාසනයක උත්තරීතර ඵල ලබා සසර ගමන කෙළවර කර ගැනීමට උපනිශ්‍රය වන බවත් වටහා ගත යුතුයි. මේ සියලු** අතීත සිද්ධි ඒ ඒ තෙරණුවන්/ තෙරණියන් විසින් නිවන් මග පූර්ණ

කර පෙර විසූ කඳ පිළිවෙල දිවැසින් දැක අතීතය සිහි කිරීමෙන් අනතුරුව චිත්ත ප්‍රසාදයෙන් යුතුව ප්‍රකාශ කළ වැකි මිසක් මනංකල්පිතයන් නොවේ.

මේ අනුව වර්තමානයේද සමාජයේ විවිධාකාර පුද්ගලයන් විසින් අංශුමාත්‍රයක හෝ බුද්ධ සංඥාවක් මුල් කරගෙන සිද්ධ කරන පිනක් පහත් කොට නොසැලකිය යුතුයි. සමහර විට කුඩා දරුවෙක් අඳින චිත්‍රයක් වෙන්න පුළුවන්, හදන වෙසක් කූඩුවක්, එල්ලන කොඩියක් වෙන්න පුළුවන්, සුළුවෙන් හෝ දෙන දන්සැලක් වෙන්න පුළුවන්... මේ කුමන කටයුත්ත වුණත් බුද්ධ සාසනයක් මුල් කරගෙන සිද්ධ කළේ නම් එයින් ලැබෙන ඵල සුළුවට නොසිතිය යුතුයි. **සමහරවිට සමාජයේ දුශ්චරිත යැයි, වැරදි යැයි සම්මත කෙනෙක් පවා ඉඳ හිට හෝ සිදු කරන පින්කමක් දැක ඊට නොගැරහිය යුතුයි.** මන්ද ඒ කෙනාට කවදා හෝ මේ භයංකර සසරින් එතෙර වෙන්න ඒ පින උපනිශ්‍රය වන නිසා. එසේම මනුස්සයින් ආශ්‍රිතව වෙසෙන සතර අපාගත සත්ත්වයින් පවා සමහරවිට භික්ෂූන් වහන්සේ නමක් කෙරෙහි, බෞද්ධයෙක් කෙරෙහි පැහැදී, අංග චලනයන්ගෙන් ප්‍රතිචාර දැක්වීම පවා ඒ සතාට සතර අපායෙන් කවදාහරි මිදෙන්න උපනිශ්‍රය වන බවත් තේරුම් ගත යුතුයි. අති දුර්ලභව පහළ වන සම්බුද්ධ සාසනයක ඇති අසීමිත වටිනාකම මේ කාරණාවලින් තේරුම් ගත යුතුයි.

සංයුක්ත නිකාය (5-1)- 191 පිටුව අනීවරණ සූත්‍රය

ධර්ම ශ්‍රවණයෙන් නීවරණ දුරු වී සප්ත බොජ්ජංග වැඩෙන බව. බණ ඇසීම කරන විට පංච නීවරණ නැති බවත්, සප්ත බොජ්ඣංග භාවනාව සිදු වන බවත් පෙන්වා දී ඇත. භාවනාව කුමක්දැයි අසන අය, බණ ඇසීම ආර්ය භාවනාවක් බවද දැන ගැනීමට මේ සූත්‍රය ඉතා යහපත් වේ.

අංගුත්තර නිකාය (2) - 483 පිටුව අරණ්‍ය සේනාසන සූත්‍රය

අරණ්‍ය, ශූන්‍යාගාර, මිනිස් රහිත වන සෙනසුන් නුසුදුසු කාරණා 4 ක් ඇති අය නම් කාම විතර්ක, ව්‍යාපාද විතර්ක, විහිංසා විතර්ක, ජඩ වූ දුෂ්ප්‍රාඥ යන හතර කරුණු ඇති අයයි. ඊට සුදුසුකම් ඇත්තේ, නෙක්ඛම්ම විතර්ක, අව්‍යාපාද විතර්ක, අවිහිංසා විතර්ක, ජඩ නොවූ ප්‍රඥාවන්ත යන කරුණු ඇති අයටයි.



අංගුත්තර නිකාය (5)- 389 පිටුව - බලසංගහ වත්ථු සූත්‍රය

සමානාත්මතාවය නම්, යම් මගඵල ලාභියෙක් ඒ අනුරූප මගඵල ලාභියෙකුට සමානාත්මතාවයෙන් යුතු බව පෙන්වා ඇත. එහිම බිය පහද පෙන්වා ඇත.

විශේෂ කරුණක් - මිලින්ද ප්‍රශ්නයෙහි 289 පිටුව

"උත්තිට්ඨේ නප්ප මජ්ජෙය්‍ය උදරේ සංයතෝසියා" උදර පෝෂණය සංයත කරගත්විට අප්‍රමාදව නැගී සිටින බව මින් කියැවේ. **ආහාර පමණ දැන වැළඳීම මුඛයෙන් ගන්නා ආහාර පිඬුවලට සීමා නොකර බඩ වඩා ගැනීම යන්නද ගෙන විග්‍රහ කළ යුතුය.**

**ආර්ය මෛත්‍රී භාවනාව යනුවෙන් වෙනම මෛත්‍රී භාවනාවක් නැතැයි කියමින් තර්ක කරන උදවියට නියම ආර්ය මෛත්‍රිය සහ ලෝක සම්මත (ලෞකික) මෛත්‍රිය දැන ගැනීමට** අවශ්‍යනම් සංයුක්ත නිකායේ (5-1) හලිද්දවසන (මෙත්තා) සූත්‍රය බලන්න.

රහත් උතුමන් විජ්ජාචරණ සම්පන්න බව - සංයුක්ත නිකාය (1) - 299 පිටුව - අග්ගික සූත්‍රය - යමෙක් පෙර විසූ කඳ පිළිවෙල දනීද, ස්වර්ගය හා අපාය දනීද, වැලි ජාතික්ෂය සංඛ්‍යාත අරිහත්වයට පැමිණියේද, දැන නිමවන ලද කිස ඇත්තේද (කළ යුතු කටයුතු සියල්ල ඉවර කළේද) විජ්ජාචරණ සම්පන්න වේ.

**එක ගාථාවක් පෙළ දැන අරුත් දැන ධර්මානුධර්ම පිළිවෙලින් කටයුතු කළත් ඒ පුද්ගලයා බහුශ්‍රැත හා ධර්මධර බවට බුදු රජාණන් වහන්සේ අනුමත කරන බව.** අංගුත්තර නිකාය (2) 345 පිටුව බහුස්සුත සූත්‍රය.

තවුස් භාවනාවෙන් නොව සිත කය වචන සුචරිතව යථා නුවණින් විමසා කටයුතු කර නිවන් ලැබෙන බව - ඉහත පොතේ 385 පිටුව - සාළහ සූත්‍රය.

සිල්වත් වීම, බහුශ්‍රැත වීම (ඇසීම - දැරීම - වනපොත් කිරීම හෙවත් කටපාඩම් කිරීම - දහම් ගැන සිතීම - නැවත මෙනෙහි කිරීම), අධි චිත්තය ඇසුරු කර සතර දැහැන් වැඩීම, ආස්‍රව ක්ෂය හේතුවෙන් චේතෝ විමුක්ති - ප්‍රඥා විමුක්ති මෙලොවදීම ලැබ ප්‍රත්‍යක්ෂකොට විසීම තෙර කරන ධර්ම බව. අංගුත්තර නිකාය (2) 45 පිටුව - ද්විතීය උරුවේල සූත්‍රය.

## ධ්‍යාන පිළිබඳව - අංගුත්තර නිකාය (6)- 609 පිටුවේ පටන් සන්ධ සූත්‍රය

අජානේය ධ්‍යායිතය සිතව, අස්ව ගුණ්ඩයාගේ ධ්‍යායිතය නොසිතව.

**අස්ව ගුණ්ඩයාගේ ස්වභාවය**

අසුන් බලන්නා අද මා ලවා කුමක් කරවන්නේද, මම අද කුමන ප්‍රතිචාරයක් දක්වන්නේද කියා නොසිතයි. කෑමට දැමූ යව ගැනම සිතයි.

**අජානේය අස්වයාගේ ස්වභාවය**

ළඟ බැඳ සිටියත් යව ගැන නොසිතයි. අසුන් බලන්නා අද මා ලවා කුමක් කරවයිද, මම කුමක් කළ යුතුද කියා සිතයි. ආහාර ගෙන නිදීමට වීම පිරිහීමක්, හානියක්, මහා අපරාධයක් ලෙස මනා සේ දකී.

**අස්වගුණ්ඩ ධ්‍යායිකයා**

ආරණ්‍යයට, රුක් මුලට, ශූන්‍යාගාරයට ගියත් කාම රාගයෙන් කාම සිතිවිල්ලෙන් වසයි. උපන් කාමයන්ගේ නිස්සරණය ඇති සැටියෙන් නොදකී. කාම රාගය අභ්‍යන්තරයේ තියාගෙන ධ්‍යාන

කරයි. ප්‍රධ්‍යාන කරයි. නිබඳව ධ්‍යාන කරයි. බැසගෙන සිතයි. ව්‍යාපාද සිතින් වසයි. ථීන මිද්ධව වසයි. උද්ධච්ච කුක්කුච්චව වසයි. සැකයෙන් යුතුව වසයි. උපන් සැකයේ නිස්සරණය නොදනී. සැක ඇතිවම සිතයි. නොයෙක් අයුරින් සිතයි. නිබඳව සිතයි. බැසගෙන සිතයි. පඨවිය නිසා, ජලය නිසා, ගින්න නිසා, වායුව නිසා ධ්‍යාන කරයි. ආකාසානඤ්චායතනය නිසා, විඤ්ඤාණඤ්චායතනය නිසා, ආකිඤ්චඤ්ඤායතනය නිසා, නේවසඤ්ඤානාසඤ්ඤායතනය නිසා ධ්‍යාන කරයි. මෙලොව නිසා, පරලොව නිසා ධ්‍යාන කරයි. දැකපු, අහපු, මතක් කරපු දැනීම් පතමින් පරීක්ෂා කරමින්, අනුව ගිය මනසින් ධ්‍යාන කරයි. මේ අස්වගුණ්ඩ ධ්‍යානයයි.

<u>අජානේය ධ්‍යායිකයා</u>

පුරුෂ අජානයා කැළයට ගියේ හෝ රුක් මුලට ගියේ හෝ ශූන්‍යාගාරයට ගියේ හෝ කාම රාගයෙන් මැඩුණු සිතින් නොවසයි. උපන් කාමයාගේ නිස්සරණය දකී. ව්‍යාපාද සිතින් නොවසයි. ථීන මිද්ධයෙන් නොවසයි. උද්ධච්ච කුක්කුච්චයෙන් නොවසයි. විචිකිච්චාවෙන් නොවසයි. උපන් විචිකිච්චාවේ නිස්සරණය තතු සේ දනී. හේ පෘථිවිය (පඨවිය) නිසා, ආපය (ජලය) නිසා, ගිනි නිසා, වායු නිසා ධ්‍යාන නොකරයි. ආකාසානඤ්චායතනය, විඤ්ඤාණඤ්චායතනය, ආකිඤ්චඤ්ඤායතනය, නේවසඤ්ඤානාසඤ්ඤායතනය නිසා ධ්‍යාන නොකරයි. මෙලොව නිසා, පරලොව නිසා ධ්‍යාන නොකරයි. එතෙකුදු වුවත් ධ්‍යාන කරයි.

මේ භද්‍ර පුරුෂ අජානෙයාට ඉන්ද්‍රයා, බ්‍රහ්මයා, ප්‍රජාපතී සහිත දෙවියන් විසින් දුරදීම නමදනාහ. යම් අරමුණක් නිසා ධ්‍යාන කරන්නේ නම්, ඒ අරමුණ නොපෙනේ නම් පුරුෂ අජානයාණනි, ඔබට නමස්කාර වේවායි කියයි.

මෙසේ වදාළ කල්හි සන්ධ තෙරණුවෝ, යම් අරමුණක් නිසා ධ්‍යාන නොකරන්නේ නම් කෙසේ ධ්‍යාන කරන්නේ දැයි ඇසීය.

සන්ධයෙනි, මේ සාසනයෙහි පුරුෂ අජානෙයා හට පෘථිවි ධ්‍යාන සංඥා ප්‍රකට වෙයි. ආපෝ - තේජෝ - වායෝහි සංඥා ප්‍රකට වෙයි. ආකාසානඤ්චායතන, විඤ්ඤාණඤ්චායතන, ආකිඤ්චඤ්ඤායතන, නේවසඤ්ඤානාසඤ්ඤායතන සංඥා ප්‍රකට වෙයි. ඉහ ලෝකයෙහි (මේ ජීවිතය) පර ලෝකයෙහි සංඥා ප්‍රකට වෙයි.

යම් ප්‍රාන්ත පර්යේෂණවලින් යුතුව දකින, අහන, මතක ඇති දැනීමක් වේද, එයද ප්‍රකට වෙයි. ධර්මානුකූල සිතුම් ඇති ඒ පුරිස අජානික පෘථිවි, ආපෝ, තේජෝ... ආදී ධ්‍යාන නොකරයි. එහෙත් ධ්‍යාන කරයි. (මෙම ධ්‍යානය ලැබෙන හැටි විස්තර කර දිය යුතුය).

<u>පටිච්ච සමුප්පාදය</u> - දීඝ නිකාය (2) 91 පිටුව - <u>මහා නිධාන සූත්‍රය</u> - ජාති ප්‍රත්‍යයෙන් ජරා මරණ වේ. කෙසේද? මිනිස්, දෙවි, බඹ, යක්, සිවුපා, සර්ප ඒ ඒ සතුන්ගේ ඉපදීම නිසාම ජරා මරණ වේ.

භව ප්‍රත්‍යයෙන් ජාති වේ. කෙසේද? කාම භව, රූප භව, අරූප භව නිසා ජාති වේ.

උපාදාන ප්‍රත්‍යයෙන් භව වේ. කෙසේද? කාමූපාදානය, දෘෂ්ට්‍යූපාදානය (දෘෂ්ඨි උපාදානය), සීලව්‍රත උපාදානය, ආත්මාවදෝපාදානය (අත්තවාද උපාදානය) නිසා භවය වේ.

තෘෂ්ණා ප්‍රත්‍යයෙන් උපාදාන වේ. කෙසේද? රූප තණ්හා, ශබ්ද තණ්හා, ගන්ධ තණ්හා, රස තණ්හා, ස්පර්ශ තණ්හා නිසා උපාදාන වේ.

වේදනා ප්‍රත්‍යයෙන් තෘෂ්ණාව වේ. කෙසේද? චක්ඛු සම්ඵස්සජා වේදනා, සෝත, ඝාන, ජිව්හා, කාය, මනෝ සම්ඵස්සජා වේදනා ප්‍රත්‍යයෙන් තණ්හාව වේ.

විස්තර - තණ්හාව නිසා පරීක්ෂණ - පරීක්ෂණ නිසා ලාභ හෙවත් ලැබීම - ලැබීම නිසා අරමුණ විනිශ්චය කිරීම - විනිශ්චය නිසා ඡන්දරාගය - ඡන්දරාගය නිසා අධ්‍යාවසානය. (මම, මගේ යනුවෙන් තමා කෙරෙහි සනිටුහන් කිරීම) - අධ්‍යාවසානය නිසා පරිග්‍රහය (අල්ලා ගැනීම) වේ. පරිග්‍රහය නිසා මසුරු බව වේ.

අධ්‍යාවසානය නිසා මසුරු බව - මසුරු බව නිසා රැකීම - රැකීම නිසා දඬුමුගුරු ගැනුම්, අවි ගැනුම්, කලහ විවාද, තා තෝ කීම්, කේලාම් බොරු කීම් ආදී අකුසල් දහම් වේ.

මසුරු බව නිසා එසේම රැක ගැනීම් වේ. එහි හේතු ප්‍රත්‍ය ආකාරය - වස්තු රැකීමෙන් දඬු මුගුරු අවි දැරුම්, කලහ විවාද, තා තෝ කීම්, කේලාම් බොරු කීම්... ආදිය වේ.

එසේම රැක්ම නිසා මසුරු බව වේ. අධ්‍යාවසානය නිසා පරිග්‍රහය වේ.

ඡන්දරාගය නිසා අධ්‍යාවසානය වේ. විනිශ්චය නිසා ඡන්දරාගය වේ. ලාභය නිසා විනිශ්චය වේ.

පර්යේෂණය නිසා ලාභය වේ. තෘෂ්ණාව නිසා පරීක්ෂණය වේ.

මෙසේ වේදනා ප්‍රත්‍යයෙන් වට්ට මූල තණ්හාව, සමුදාචාර තණ්හාව වේ.

මෙහි තව දුරටත් මෙසේ විස්තර වේ. ස්පර්ශයෙන් වේදනාව වේ.

චක්ඛු - සෝත - ඝාන - ජිව්හා - කාය - මනෝ යන ස්පර්ශයෙන් වේදනාව වේ.

නාමරූප ප්‍රත්‍යයෙන් ස්පර්ශය වේ. කෙසේ වේද? යම් ආකාරයක් - ලිංගයක් - නිමිත්තක් - උද්දේසයක් - ප්‍රඥප්තියක් සමග නාම කායයාගේ පැනවීම වේ.

එම ආකාර - ලිංග - නිමිති - උද්දේස - ප්‍රඥප්ති නැති කල්හි රූප කායයන්හි අධි වචන ස්පර්ශයක් නොවේ.

විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් නාම රූප වේ යනු, විඤ්ඤාණය මව් කුසකට නොබස්නේ නම් ගැබ තුළ නාම රූපයක් හට නොගනී. ළදරු කුමරකුගේ කුමරියකගේ විඤ්ඤාණය සිඳෙන්නේ නම් නාම රූපයෝ වැඩීමක් නොවේ. ඇති විට වේ. විඤ්ඤාණ පච්චයා නාමරූපං යනු මෙය වේ.

නාමරූප පච්චයා විඤ්ඤාණං - නාම රූපයේ ප්‍රත්‍ය නොලබා විඤ්ඤාණය නොපවතී. නාම රූපය විඤ්ඤාණය ඇසුරු කිරීමෙන්, විඤ්ඤාණය නාම රූපය ඇසුරු කිරීමෙන් ජාතියයි, ජරා මරණයයි යන මෙය පැනේ.


විඤ්ඤාණයෙන් නාම රූපයත් උනුනුන්ට ප්‍රත්‍යව පවතින නිසාම ජාති ජරා ව්‍යාධි මරණ, නැවත ජාතිය... ආදිය වේ. මේ නිසාම අධි වචන - නිරුක්ති - ප්‍රඥ්ඤප්ති පැනේ.

**සටහන**

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# සැඟව ගිය බොදු මග යළි පුබුදමින් වහරක හිමියන් හෙළි කරන ලොව්තුරු අත්දැකීම්....

## අභයරතනාලංකාරය - 01



වහරක අභයරතනාලංකාර හිමි

වහරක අභයරතනාලංකාර හිමියන්ගේ ජීවන ගමන් මගේ තොරතුරු හා අත්දැකීම් වර්තමාන සමාජයට බොහොම වැදගත් වෙන්නෙ හේතු කාරණා ගණනාවක් නිසා. එකක් තමයි, පෙර සසර අත්බැව් ගණනාවක පටන් සසර හුරුවක් වශයෙන් ඇවිත් මේ අත්බවයේ කුඩා කාලයේ පටන්ම තිබුණ සුවිශේෂීය අධ්‍යාත්මික අවබෝධය සහ හැකියාව. ඒ වගේම, සම්මතයේ සිවුරු නොදැරුවත්, ගිහි වතක ඉඳගෙන ගිහි කටයුතුත් දැහැමිව කරන ගමන් අධ්‍යාත්මික ශක්තියෙන් ලෝක සත්වයාට ඉටු කළ අසීමිත සේවය. ඒ සේවය ලෞකික වශයෙන් සමාජයේ යහ පැවැත්මට හේතුවන පැතිකඩවල් ගණනාවක් ඔස්සේ විහිදී ගිහින්, අවසානයේ ලෝක සත්වයාට සදා සැනසීම අත්කර දෙන පරම නිවනටම යොමු කිරීමේ සුවිශේෂීය හැකියාව ඒ සියල්ලටම වඩා අතිශයින්ම වැදගත්.

තමන්ගෙ පරම්පරාවෙන් ලැබුණ අක්කර තුනක පමණ භූමි භාගය ඇතුළු ගිහි කල දේපළ සියල්ලම සාසනයට පූජා කරල, නිවන් උදෙසා ලෝක සත්වයාට දහම් දෙසීමේ අර්ථ චරියාවේ නිරත වුණ උන්වහන්සේගේ මේ අත්දැකීම් කිසිවක් අපතේ දැමිය නොහැකි තරම් වර්තමාන සමාජයට බොහොම වටිනවා. ඒ නිසා ඒ අත්දැකීම් බිඳක් ලෝකයාගේ යහපත පිණිස හෙළිදරව් කරන්න උන්වහන්සේ එකඟ වුණා. මේ තමයි උන්වහන්සේගේ ඒ අත්දැකීම්.

මගේ ආච්චි ඒ කාලෙ කියනවා, පොළොව යට අපායත්, තාරකාවල දිව්‍ය ලෝකත් තියෙනව කියල. පින් කරපු අය දිව්‍ය ලෝකෙ යන බවත්, ඒ පින් ඉවර වුනාම නැවතත් දිව්‍ය ලෝකයෙන් පිට වෙනව කියලත් ආච්චි කිව්වා. එහෙනම් දිව්‍ය ලෝකෙ ගිහින් වැඩක් නෑ කියල මම කිව්වම, ඒ සඳහා සසරින් එතෙර වෙන්න ඕන කියලත්, සසරින් එතෙර වෙන්න නම් පැවිදි වෙන්න ඕන කියලත් ආච්චි කිව්වා. ඒකෙන් මගේ පැවිදි වීමේ ආසාව වැඩි වුනා. මහණ වෙන්න ආසාව මට උපතින්ම තිබුනත් ඒක මුවහත් වුනේ ආච්චි නිසා. මම මහණ වෙනවට ආච්චි කැමති වුණත් දෙමව්පියො කැමති වුණේ නෑ. ඒ නිසා ආගම දහම පැත්තට නැඹුරු වෙලා ගිහි ළමයෙක් විදිහට පාසල් යන්න මට සිද්ධ වුණා.

සත්‍යය අවබෝධ වෙන්න නම් සත්‍යවාදී විය යුතුයි. අසත්‍යවාදීව සත්‍යය අවබෝධ කරගන්න බැරි බව මට වැටහුණා. මම ඒක තේරුම් අරගෙන බුදු දහමේ පර්යේෂණාත්මක පැත්ත විශ්ලේෂණය කරන්න උනන්දු වුණා. ඒ සඳහා චිත්ත ඒකාග්‍රතාවය අවශ්‍යයි. ඒ නිසා තමයි භාවනාව ප්‍රගුණ කළේ. අනෙක කුඩා කාලයේ ඉඳලම මගේ ජීවිතයට භාවනාව හුරු පුරුදු වෙලා තිබුණා.

කොහොමහරි කුඩා කාලයේම මගේ බලවත් ඉල්ලීම පිට දෙමව්පියන් විසින්ම වරකාපොල පැත්තෙ පන්සලක මාව මහණ කරන්න කියල නතර කළා. නමුත් මම බලාපොරොත්තු වෙච්ච දේවල් ලැබුණෙ නැති නිසා දවස් කිහිපයක් විතරයි හිටියෙ. එතැනින් මගේ අරමුණු ඉටු වෙන්නෙ නෑ කියල පෙනී ගිය නිසා ආපහු ගෙදර ආවා. ඔය විදිහට තවත් පන්සල් කිහිපයකටම මහණ වෙන්න කියල ගියත් ඒ කිසිම තැනක මට සුදුසු වාතාවරණයක් තිබුණෙ නෑ. ඒ එක අවස්ථාවකදි මගේ හිත සසල කළ සිදුවීමක් මතකයි. දවසක් පන්සලට ආගන්තුක හාමුදුරුවො දෙනමක් වැඩියා. ඒ වෙලාවෙ ඒ ස්ථානයේ තිබුණෙ කුඩා මිටි බංකු පුටු දෙකක්. මහා සංඝරත්නය කෙරෙහි තිබුණ අසීමිත ගෞරවය නිසා මම පන්සලේ තිබ්බිච්ච උසම ලොකු පුටු දෙකක් උන්වහන්සේලාට ඉඳගන්න ගෙනත් තිව්වා. උන්වහන්සේලා නැවත වැඩියට පස්සෙ නායක හාමුදුරුවො මට හොඳටම බැන්නා, ඕකුන් අහවල් නිකායෙ අඩු කුලේ අය, ඔය වගේ හොඳ පුටු දෙන්නෙ නෑ, අර පොඩි පුටු තියල තියෙන්නෙ ඒ අයට කියල. ඉතින් මට උන් වහන්සේලා ගැන හුගක් දුක හිතුනා. ඒත් එක්කම කලකිරීමක් ඇතිවුණා. බුදුහාමුදුරුවො දේශනා කළ දහම මේක නෙවෙයි, මේ තැන්වල ඉඳගෙන හරි දහම ඉගෙන ගන්න බෑ කියල මට තේරුම් ගියා.

**ඉතින් මම පුංචි කාලෙ ඉඳලම මේ ධර්මයට ලැදි වෙලා ධර්මය විමර්ශනය කරන කෙනෙක්. මට අවුරුදු හතේ ඉඳලම පැවිදි වෙන්න ආසාව තිබුනා. ඒ කාලෙ කහපාට රෙද්දක් සිවුර වගේ පෙරවගෙන අඹ ගහක් යට භාවනා කළ බවත් මතකයි. මම ඒ කාලෙ ඉඳලම කාගෙවත් උදව් නැතිව තනියම භාවනා කරන්න පුරුදු වුනා. ඉතාම කුඩා කාලෙ පටන්මයි මට මේ උවමනාව ඇති වුණේ. ඒක මොකක්ද කියන්න දන්නෙ නෑ. සමහරවිට සසරේ හේතුවක්, පුරුද්දක් වෙන්න ඇති.** මොකද ඒ තරම් කුඩා කාලෙදි දරුවන්ගෙ හිතට එන අදහස් ඔය වගේ දේවල් නෙවෙයි. සෙල්ලමටමයි හිත යන්නෙ. ඒත් මට **උවමනාව තිබුණෙ, බුදුන් වහන්සේ දේශණා කළ ධර්මය මොන වගේ දෙයක්ද කියල සොයා බලන්න අවශ්‍යයි කියන කාරණය.**

ඒ නිසා මම ඔය වෙනත් අය වගේ නවකතා, කෙටිකතා කියවන්න යොමු වුණේ නෑ. බණ පොත්ම තමයි කියවන්න යොමු වුණේ. උදේ ඉඳං රෑවෙනකල් මම කළේ මගේ පාසල් වැඩත් අතපසු කරගෙන ධර්මය ගැන කියවපු එක. ඒක මට විසාල ආස්වාදයක්, සැනසිල්ලක් වුණා.

මම වහරක පාසලේ හත අට පන්තිවල ඉගෙන ගන්නකොට පුස්තකාලයෙන් අභිධර්මය පොත්

අරගෙන කියෙව්වා. ඒවා කියවද්දි මට පහසුවෙන් තේරුම් ගන්න පුළුවන් වුනා. තරුණ වයසට පත්වුනාට පස්සෙ බුදු දහම ගැන විස්තර කරන ගැඹුරු පොත්පත් පාසල්වලින්, පන්සල්වලින් අරගෙන කියෙව්වා. ඒවා එකක්වත් මට කටපාඩම් කරන්න අවශ්‍ය වුනේ නෑ. එක වතාවක් කියවනකොටම වැටහෙන්න ගත්තා, මතක හිටින්න ගත්තා. ඒ නිසා කාගෙන්වත් අහන්න අවශ්‍ය වුනෙත් නෑ. ඒවායින් මේ සංසාරය ගැන තව තවත් තේරුම් ගන්න පුළුවන් වුනා.

ඔහොම පටන් ගත්තු ගමන ක්‍රමයෙන් විකාශනය වෙලා ඉදිරියට ගියා. ඊට පස්සෙ මට වැටහුණා, බුදු රජාණන් වහන්සේ දේශනා කළ නිවැරදි ධර්මය සොයා ගත යුතුයි කියල. එදා පටන්ම මගේ උත්සාහය වුණේ අන්න ඒකයි. අවශේෂ භෞතික විෂයන් ගැන මගේ ඒ හැටි උනන්දුවක් තිබුණෙ නෑ. මම ඔය විදිහට භාවනාවටත් යොමු වුණා. ඒ යොමු වෙන්න යෙදුණ විදිහත් හරි අපූරුයි. මම ඉස්කෝලෙ පහේ පන්තියේ වගේ ඉන්න කාලෙ, මට වඩා ඉහළ පන්තියක හිටපු අපේ අයිය කෙනෙක් පොතක තිබුණ කවි පදයක් නිතරම කියනව ඇහුණා. ඒ තමයි,

**"පිනකින් උතුම් පින නම් භාවනාම ය."**

මේක ලෝවැඩ සඟරාවෙ තියෙන කවි පදයක්. ඔන්න මට හිතුණා, එහෙනම් මේ භාවනාව ගැන හොයන්න අවශ්‍යයි කියල. එතැන් පටන් මම ඒ ගැන උනන්දු වුණා.

ආනාපානා සති භාවනාව ගැන මම අහල තිබුණා. හුස්ම ඉහළට ගැනීම, පහළ හෙළීම ගැන මම උනන්දු වුණා. මම මේ කියන්න යන්නෙ මගේ අත්දැකීමක් ගැන. නැතුව අමුතු අමුතු දේවල් එහෙම කියනව නෙවෙයි. මොකද පුද්ගලයෙකුට තමන්ගෙ අත්දැකීමක් ගැන කියන්න බාධාවක් නැහැනේ.

අද මම වැඩ ඉන්න මේ පන්සල තියෙන භූමියේම තමයි අපේ පරම්පරා මහ ගෙදර පිහිටල තිබුණෙ. ඉතිං ඒ දවස්වල මම මහ රෑට ගෙදර හැමෝම නිදා ගත්තට පස්සෙ තමයි භාවනා කරන්නෙ. මොකද මම කැමති වුණේ නෑ අනික් කවුරුවත් මේක දැනගන්නවට. ඉතින් ඒ විදිහට හැම දවසකම රාත්‍රී කාලයේ භාවනා කරන්න පුරුදු වුනා. ආනාපානා සති භාවනාවත්, මෛත්‍රී භාවනාවත් කළා.

ඉතිං මම නිදාගෙන ඉන්න ඇඳ උඩ එරමිණිය ගොතාගෙන වාඩි වෙලා භාවනා කරන්න පටන් ගත්තා. මුල් දවස්වල ඒ තරම් අමුත්තක් නොතිබුණාට, දවස් කිහිපයක් ගත වෙන කොට මට පැහැදිලි වෙනසක් දැනුණා. හැබැයි මම ඒ වෙනකොටත් භාවනාව කියන්නෙ මොකක්ද කියලවත් කාගෙන්වත් අහල හෝ දැනගෙන තිබුණෙ නෑ. ඒත් මට එක දවසක් අමුත්තක් දැනෙන්න පටන් ගත්තා. ඒක මට හිතාගන්නත් බැරි විසාල ශාන්තියක්. විසාල පහසුවක්. ආලෝකවත් වායු ධාරාවක් මගේ ශරීරයට ඇතුල්වන විදිහටත් පිටවන විදිහටත් දැනුණා. මගේ මුළු ශරීරයම සැහැල්ලු වෙලා ශරීරය නෑ වගේ දැනුණා. ඒ මානසිකත්වය හරිම ශාන්තයි. ශරීරය සැහැල්ලුයි. හරියට හඳ එළිය වගේ. මීදුම අතරින් සුදු එළියක පාවෙනවා දැනුනා.

මෙන්න මේ විදිහට මම ඉතාම නිදහස් මානසිකත්වයකට ආවා. මගේ මුහුණත මටම තේරෙන්නෙ හඳ එළිය පායලා ඒ මැද පිපුණ මලක් වගේ. මුළු ශරීරයම හොඳටම සැහැල්ලු වෙලා. මුහුණෙ තිබිච්ච හඳ එළිය වගේ ආලෝකය ඊළඟට මුළු ශරීරය පුරාම ගමන් කරන්න පටන් ගත්තා. එතකොට අමුතු හැඟීමක් ආවා. ඒ හැඟීම එනකොට මුළු ශරීරයම රන්වන් පාට ආලෝකයකින් නැහැවිලා ගියා. මට දැන් මගේ භෞතික ශරීරය ගැන කිසිම දැනීමක් නෑ. මේ හැම දේම මම අත්වින්දෙ එකම භාවනා ඉරියව්වක විවිධ අවස්ථාවලදි. ඒ හැම අවස්ථාවකදිම මම ඒ තත්වයෙන් පුදුම සැනසීමක් අත්වින්දා.

එන්න එන්නම මේ තත්වය හොඳින්ම අත්විඳින්න පටන් ගත්තා. අන්තිමට මුළු ශරීරයම එළි කඳක් බවට පත් වුණා. මම ඒ වෙලාවෙ වාඩිවෙලා හිටපු තැන ගැන හෝ මගේ ශරීරය ගැන හෝ මට අදහසක් නෑ. අනන්ත ආකාසයක් විතරයි පේන්නෙ. ඒ ආකාසය මැද මේ එළි කඳ තියෙනවා. හරිම නිශ්චලයි. හරිම ශාන්තයි. නිවිසැනසිල්ලෙ හිතන්න පුළුවන්. ඒත් අර කලින් තිබුණ භෞතික ශරීරය ගැන ඒ විදිහෙ හැඟීමක් ඇත්තෙ නෑ. ඒ ගැන විපරම් කරන්න, වටපිට බලන්න අවශ්‍යතාවයක් නෑ. උඩ බලනවා, පහත බලනවා, දකුණ බලනවා, වම බලනවා කියල දෙයක් නෑ. මේ සියලු පැති එකවර පේනවා. අන්න ඒකයි විශේෂත්වය. උඩ යට වට හැම තැනම සියල්ල එකට එකවරම පේනවා. ඒක ඒ මනස පත්වුණ තත්වයේ සොබාවය. ඒ වගේම මගේ අත්දැකීමක් මම මේ කියන්නෙ. මම මේ දේවල් කියන්නෙ කිසිම විශේෂත්වයක් ආරෝපණය කර ගන්න නෙවෙයි. මම අත්විඳපු දේ මම ඔබට කියනවා, එච්චරයි.

දැන් මම හිතනවා, මේ මොකක්ද? මේකද සත්‍යය? මේක හැඟීමක්ද? මේක මොන වගේ තත්වයක්ද? ප්‍රශ්නාර්ථයක් දැන් තියෙනවා. ඒ මොහොතෙම ප්‍රශ්නයට පිළිතුරක් වැටහුණා, ඒ කියන්නෙ ප්‍රභාෂ්වරත්වයේ ආලෝකය කියල. මොකක්ද මේ ප්‍රභාෂ්වරත්වයේ ආලෝකය කියන්නෙ? මේකද සත්‍යය? මේකද ඇත්ත? ඔන්න ඔය ප්‍රශ්නය තමයි මට ඉතුරු වුණේ.

හැබැයි මට වැටහුණා, මේ සත්‍යය නෙවෙයි කියල. අනන්ත ආකාසයක තිබුණ ශක්ති විශේෂයක් එකට ඇදිල ගුලි වෙලා නිර්මාණය වෙච්ච අවස්ථාවක් තමයි මම අර අත්වින්දෙ. මේක හේතුවක ඵලයක්. උත්සාහ කිරීම්, වීර්ය කිරීම් නිසා ගොඩනැගුණ ඵලයක් තමයි මේ.

ඇත්ත වශයෙන්ම මට මේ දේවල් ගැන කලින් කවුරුවත්ම කියල දීල තිබුණෙ නෑ. ඒ නිසා ඒ ඒ අවස්ථාවලදි ඒ මොන විදිහෙ තත්වයක්ද කියල මම දැනගෙන හිටියෙ නෑ. ඒත් පහුකාලෙදි පොත්පත් කියවල තමයි ඒ දේවල් මොන මොනවද කියල නාමිකව දැනගත්තෙ.

මේ දැකපු ප්‍රභාෂ්වරත්වයේ ආලෝකය උත්සාහයෙන් වීර්යෙන් ගොඩනැගුන හේතු ඵලයක් බවත්, උඩ යට වට අප්‍රමාණ නිදහසක් විදිහට වැටහෙන ආකාසය බොහෝ නිදහස් සුවයක් බවත් වැටහී ගියා. සුළු මොහොතකින් ප්‍රභාෂ්වර ආලෝක පුංජය (ප්‍රමාණයෙන් අඩි 6 ක් පමණ උස සාමාන්‍ය මනුස්සයෙක්ගෙ මහත තරම් වන ටියුබ් ලයිට් වර්ණයෙන් යුතු එළි කඳක්.) අතුරුදන් වෙලා "මම" යන හැඟීමට අනන්ත ආකාසයක් වුණා. දැන් උඩ යට වට කියල මිම්මක් හෝ කෙළවරක් හෝ පේන්නෙ නැති ඉතා නිදහස් ස්වභාවයක මානසික පිහිටීමක් අති නිශ්චලව දැනෙන්න වුණා.

නැවතත්, මේ කෙබන්දක්ද, මේකද ඇත්ත කියල සංඥාවක් පහළ වුණා. ඒත් සමගම පිළිතුරු විදිහට, මේ සත්‍යය නෙවෙයි හේතුවක ඵලයක් කියල වැටහුණා. මානසික අනන්ත දැනීමක් මීදුමක් වගේ අනන්ත ආකාසයක් බදාගෙන සිටින ආකාරයක්



ගිහි වතක සිටියදී

වැටහුණා. ඒ ආකාසය අත්හැරල නිදහස් වෙන්න පුළුවන් බවකුත් වැටහුණා. ඒත් සමගම ආකාසයෙන් නිදහස් වෙලා මීදුම් වලාවක් වගේ තිබ්බ්ච ආකාසය නොදැනී යමින්, ඉතා ශාන්ත, වර්ණයක් කියන්න බැරි පැහැපත් අනන්ත දැනීමක් පෙර තිබ්බ්ච ආකාස ස්වභාවය තියෙන අනන්තයේම පිහිටල අති නිශ්චලව තියෙන බව වැටහුණා. ඒක ආකාසයට වඩා ඉතාම ශාන්තයි.

නැවතත්, මේකද ඇත්ත, මේකද සත්‍යය කියල අදහසක් ආවා. ඒත් සමගම මේ දැනීම, උත්සාහයේ වීර්යේ ප්‍රතිඵලයක් විදිහට ගොඩනැගෙන හේතු ඵලයක් බව වැටහුණා. මේ උත්සාහය වීර්ය අත්හැරල නිදහස් වීම කොච්චර ශාන්තද ප්‍රණීතද කියල වැටහුණා. ඒත් එක්කම උත්සාහය, වීර්ය අත්හැරිල මහා නිදහසක සුවය දැනෙමින්, මුං ඇටයක් තරම් දැනීම් බිඳක් බවට පත්වුණා. දැන් ලෝකයක් කියල මානසික ගෝචර කිසිවක් නැති, දැනීම් බිඳකින් පිටස්තර කිසිවක් දැනෙන්නෙ නැති තත්වයකට පත්වුණා.

නමුත් එතැනත් හිතන්න පුළුවන් තැනක්. මේ කෙබඳු තත්වයක්ද, මේ මොකක්ද කියන අදහසක් මතුවුණා. ඒත් එක්කම, මේ හේතු ඵලයක්, මානසික ප්‍රසාරණ මිම්මක් විදිහට වැටහුණා. එතැනත් නිරන්තරයෙන් කෙරෙන උත්සාහයක්, වීර්යක් තියෙන බව වැටහුණා. ඒකෙන් නිදහස් වෙන්න පුළුවන් බවත්, ඒක විසාල සහනයක් බවත් වැටහුණා.

ඒත් එක්කම දැනීම් බිඳ කුඩා වෙන්න පටන් ගත්තා. ඊළඟට අබ ඇටයක් තරම් වුණා. ඊට පස්සෙ ඉඳි කටු තුඩක් තරම් වුණා. තවත් සූක්ෂම වෙලා දැනීම කෙළවර වෙන්න ආවා. එතකොට ජීවිතය ඉවරයි කියන හැඟීමත්, මියයයි කියන අදහසත් නැගිල, නැවතත් දැනීම ප්‍රසාරණය කරන්න උත්සාහ මාත්‍රයක්, වීර්ය මාත්‍රයක් ගොඩනැගුවා. එතකොට දැනීම මුං ඇටයක් තරමට ප්‍රසාරණය වුණා. නමුත් ඒකත් පැවතුනේ නෑ. නැවතත් පෙර පරිදිම ගෙවිල ගියා. නැවත ජීවිතාසාව ගොඩනැගුවා. මේ ක්‍රියාවලිය මේ විදිහට සිද්ධ වෙනකොට හිත කියන්නෙ, උත්සාහයේ වීර්යේ ක්‍රියා ඵලයක් බවත්, දැනීම් මාත්‍රය ගෙවෙන්නෙ කිසිම හරයක් ඉතුරු නොකර බවත්, ජීවත් වීම කියන්නෙ හරයක් නැති වෙහෙසක් බවත් අවබෝධ වුණා. ඒත් සමගම, වෙන දෙයක් වුණාවෙ කියල උත්සාහය වීර්ය අත්හැරල නිහඬ වුණා. දැනීම් බිඳ නිවිල ගියා.

කොච්චර වෙලාවක් එහෙම තිබුණද කියල දැනෙන්නෙ නැතිව, නැවතත් ඉතා අංශුමාත්‍ර වූ දැනීම් මාත්‍රයක් තියෙන බව වැටහුණා. **සියළු උත්සාහයන් වීර්යන් අත්හැරල, ලෝකයෙන් මිදීම සියළු දුකේ කෙළවර බවට අත්දැකීමක් ලැබුවා. සමාධියෙන් සත්‍යය හොයාගෙන ගිහින් ලැබූ සත්‍ය නිදහස ලෝකයෙන් එතෙර බව වැටහුණා.** හොයපු දේ හම්බ වුණා. දැන් කළ යුතු දෙයක්, ඉන් එහාට යා යුතු නිවන් සුවයක් තවත් නැති බව සියුම්ව වැටහුණා. ඊට පස්සෙ ගිය විදිහටම ආපසු එන්න පටන් ගත්තා.

ගොඩනගන, ගෙවී යන විදිහට පෙර අත්දැකපු අවස්ථාව ආවර්ජනය කළා, එතැනට ආවා. මුං ඇටයක් තරම් දැනීම් බිඳ ඊළඟට ආවර්ජනය කළා, එතැනට ආවා. අනන්ත ආකාසය ආවර්ජනය කළා. මනස අනන්තයට ප්‍රසාරණය වුණා. මීදුමක් වගේ ආකාසය ආවර්ජනය කළා. මහා රළු ස්වභාවයක් මනසින් බදනවා වගේ ආකාසයට බැඳුණා. එළි කඳ ආවර්ජනය කළා. අහස මැද කලින් විදිහටම එළි කඳක් බවට පත්වුණා. අඟපසඟ සහිත ආලෝක සිරුර ආවර්ජනය කළා, ඒ තත්වයට පත්වුණා. වායුමය කයක්, හඳ එළිය වැටිල පිපුණ මලක් වගේ මුහුණ ආවර්ජනය කළා. ඒ තත්ත්වයට පත්වුණා. සැහැල්ලු වායුමය කය, ආලෝක මිශ්‍ර ආස්වාස ප්‍රාස්වාස වෙච්ච ආකාරය සිහි කළා. ඒ ස්වභාවය වැටහුණා. භාවනා ඉරියව්ව වැටහුණා. ඉන්න තැන ස්පර්ශය සිහි කළා. උඩ ඉඳන් බිමට පහත් වෙලා යමක පිහිටපු විදිහට වැටහුණා. නමුත් කාමරයේ ඉන්න බව වැටහෙන්නෙ නැති නිසා, බිත්ති ඔරලෝසුවේ “ටක් ටක්” කියන හඬ නාද වෙච්ච හැටි සිහි කළා. ඊළඟට කාමරයේ ඉන්න බව වැටහෙමින් ඔරලෝසුවේ “ටක් ටක්” කියන හඬ ඇහෙන්න වුණා.

උකුළෙ තියෙන අත නැවතත් සිහි කරන කොට අත හෙමින් උඩට ඉස්සුනා. එතකොටම බර ශරීරය සහිත කායික දැනීම ඇති වුණා. දැහැනින් ඉවත් වෙලා තියෙන බව වැටහුණා. වෙලාව බලන කොට පාන්දර 3.30 වෙලා තිබුණා. රෑ දහයෙ පටන් පාන්දර 3 පහු වෙලා විනාඩි 30 යි. පැය පහ හමාරක් වෙලාව ගියත්, මට දැනුණෙ පැය කාලක් පමණ භාවනාවේ අත්දැකීම් ලබමින් හිටිය වගේ. මේ විදිහට භාවනාවේ උපරිම තලයට මම ළඟා වුනා. මට විමුක්තිය දැනුනා. ඒ පැය 5ක පමණ කාලය තුළ මම චේතෝ විමුක්තියේ පළමු අත්දැකීම ලැබුවා. මම මේ ගැන කියන්නෙ, උත්තරීතර මනුස්ස ධර්ම හඟවල කිසිම ලාභයක් ප්‍රසංසාවක් ලබන්න නෙවෙයි, තවත් කෙනෙකුට විවිධ අදහස් දීල මුලාවට පත් කරන්න උත්සාහ දරපු පිරිසකගෙන් සිද්ධ වෙන්න ගිය විනාසය මගහරවා දෙන්න තමයි මේ කාරණා හෙළිදරව් කළේ.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

සටහන
**නීතිඥ චන්දන සිරිවර්ධන**

# ඝණ්ඨාර පූජාවේ ලෞකික හා ලෝකෝත්තර වටිනාකම



බෞද්ධත්වය තුළ කෙරෙන කිසිම පිංකමක් සුළුකොට තකන්න බෑ. මොකද අනන්ත සසර පුරාවට සම්බුද්ධ සාසනයක් මුණ ගැහෙන්නෙ අති දුර්ලභව. සාරාසංඛ්‍ය, අටාසංඛ්‍ය, සොළොසාසංඛ්‍ය කල්ප ලක්ෂ ගණනින් පෙරුම් පුරල ලබා ගන්නා ලොව්තුරා බුද්ධත්වය තුළින් මතුවන අනන්ත ගුණ කඳ මුල් කර ගෙනම ඒ හැම පිංකමක්ම සිද්ධ කෙරෙන නිසා, බෞද්ධත්වය තුළ කෙරෙන පිංකම් වෙනත් ලෞකික පිංකම්වලට සම කරන්න බෑ. නමුත් කාලයක් යනකොට අර්ථ විපරීත වෙලා ගිහින්, අර්ථය නොදැන කරන පිංකම් බවට පත්වීම නිසා ඒවායින් ලබන්න පුළුවන් ප්‍රතිඵල අඩු වෙනවා. මේ වෙනකොට සිද්ධ වෙලා තියෙන්නෙත් ඒ වගේ දෙයක්. නමුත් බෞද්ධ පිංකමක් නම් කවදහරි මෙලොව පරලොව අභිවෘද්ධියත් සලසල නිවනින් කෙළවර කරන්නක් විය යුතුයි. එතකොට තමයි ඒක බෞද්ධ පිංකමක් කියන්න පුළුවන් වෙන්නෙ. මේ වෙනකොට අර්ථ නොදැන මතුපිටින් කෙරෙන ඒ වගේ පිංකමක දහම් අරුත තමයි මේ හෙළිදරව් කරන්නෙ.

බුද්ධ සාසනයේ එන ශබ්ද පූජා පින්කම් අතරින් ඝණ්ඨාර පූජාව මූලික තැනක් ගන්නවා. ඝණ්ඨාරයෙන් නිකුත්වෙන හඬින් ලෝක සත්වයාගේ සිත් පහන් වෙනවා. ඒ වගේම පරිසරයට මිහිරියාවක් ගෙනදෙනවා. රැව්පිළිරැව් දෙන මිහිරි නාදයක් ඝණ්ඨාරයෙන් නිකුත් වෙන නිසා කනට අමිහිරියාවක් නෑ. පරිසරයේ තියෙන ගොරෝසු කටුක ශබ්ද අභිබවා යන, කාගෙත් සිත් සතන් පහන් වෙන ආකාරයේ මිහිරි හඬක් දෙන ඝණ්ඨාර පූජාවක් සාසනය උදෙසා සිද්ධ කළාම විසාල ආනිසංස ප්‍රමාණයක් ලැබෙනවා.

විශේෂයෙන්ම ගොරෝසු, අමිහිරි කටහඬ වෙනුවට කාගෙත් සිත් ගන්නා, අනෙක් අයගේ හඬ අභිබවා යන ගාම්භීර රැව්පිළිරැව් දෙන මිහිරි කටහඬක් මේ පූජාවේ ආනිසංස විදිහට ලැබෙනවා. ඝණ්ඨාර පූජාවෙන් ලැබෙන ලෞකික ආනිසංස අතරින් මූලිකම කාරණාව විදිහට ඒක හඳුන්වන්න පුළුවන්.

අපි හිතමු මේ වගේ උතුම් පින්කමකට අතහිතදී ගත්ත කෙනෙක් කවදහරි දවසක දහම් දේශනා කරන ගිහි හෝ පැවිදි පිංවතෙක් වුණා කියල. ඒ අයට මේ වටිනා පූජාවේ ආනිසංස විදිහට, තමන් ඉදිරියේ බණ අහන අය දහම් සමාධියේ පිහිටුවාගෙන, කාගෙත් සිත් ඇදගන්නා ආකාරයෙන් මහත් ගාම්භීර ස්වරූපයකින්, හැමෝගෙම සිත් පහන් වෙන ආකාරයෙන් ඒ කටයුත්ත සාර්ථකව මෙහෙයවන්න ශක්තියක් ලැබෙනවා. ඝණ්ඨාර පූජාවෙන් ලබන තවත් විශේෂ ආනිසංසයක් තමයි ඒ.

ඒ වගේම ඝණ්ඨාර නාදයෙන් යම් කිසි දැනුම් දීමක්, ආරාධනයක් සිද්ධ කරනවා. ගමේ වෙනත් කටයුතුවලට වඩා විශේෂ යමක් ගැන, ඒ කියන්නෙ ගමේ පන්සලේ නිවන් අරමුණු කරගත්ත විශේෂ පින්කමක් හෝ සදහම් දේශනාවක් හෝ පැවැත්වෙනවා කියන පණිවුඩය ගම්බිම් සිසාරා රැව් දෙනවා. ඒ වගේම හැමෝටම සසර දුකෙන් මිදෙන්න අවස්ථාවක් ඇවිත් කියන පණිවිඩය පෙනෙන නොපෙනෙන සියළු ලෝකවල ඉන්න හේතු වාසනා තියෙන සත්වයින්ට ඇහෙනවා. කලාතුරකින් ලෝකයේ පහළ වන අති දුර්ලභ සම්බුද්ධ සාසනයක් තුළ ඉතාමත්ම වටිනා අවස්ථාවක් ඇති බව හැමෝටම දැනුම් දීමක් තමයි මේ ආකාරයට සිද්ධ කරන්නෙ.

ඒ නිසාම මේ මහා පූජාවට අතහිතදී ගන්න හැමෝටම, ඒ හේතුවේ ඵලයක් විදිහට සසර ගමනෙදි කවදා කොහේ හිටියත් කවුරුහරි මාර්ගයෙන් දහම් පණිවුඩයක් ලැබෙනවා. “අන්න අර පන්සලේ අද වටිනා පින්කමක්, මිහිරි හඬින් දහම් දේශනාවක් පැවැත්වෙනවා, එන්න යන්න” කියල කවුරුහරි ඇවිත් ආරාධනයක් කරන්න පුළුවන්. අන්න ඒ මහඟු අවස්ථාවත් මේ තුළින් ලැබෙනවා. ඒ නිසා කවදාවත් සසර අනාථයෙක් වෙන්නෙ නෑ. ඒ වගේම අතහිතදී ගන්නා හැමෝටම ධර්මයේ පිහිටත් රැකවරණයත් ලැබෙනවා. මේවා ඝණ්ඨාර පූජාවෙන් ලැබෙන ආනිසංස විදිහට හඳුන්වන්න පුළුවන්.

ඉස්සර පන්සලේ වැඩ ඉන්න භික්ෂුන් වහන්සේ නමක් අපවත් වුනාම, එහෙම නැත්නම් යම්කිසි

කරදරයකට පත්වුනාම, එහෙමත් නැත්නම් විහාරස්ථානයේ මොනවහරි හදිසි තත්වයක් ඇති වුනාම, එකදිගට නොකඩවා ඝණ්ඨාරය නාද කරන සිරිතක් තිබුනා. ඒකෙන් ගම්වැසියො දැන ගන්නවා, විහාරස්ථානයේ මොනවහරි කරදරයක් කියල. එහෙම දැනගෙන විහාරස්ථානයට රැස් වෙනවා. ඒ වගේම විහාරස්ථානයේ විවිධ පිංකම්, තේවාවන් දැනුම් දෙන්නත් වෙනස් රටාවන්වලට ඝණ්ඨාරය නාද කරනවා. මේ විදිහට යම් කිසි පණිවිඩයක් දැනුම් දෙන්නත් ඝණ්ඨාරය ප්‍රයෝජනවත් වුණා.

"ඝණ්ඨ + ආරය" කියන අදහස මුල් කරගෙන තමයි "ඝණ්ඨාරය" කියන නම හැදිල තියෙන්නෙ. "ඝණ්ඨ" කියන්නෙ ගැටෙනවා කියන එක. ගැටීම මුල් කරගත්තු ආරයක්, ගැටෙන වෙලාවට ඒක ක්‍රියාත්මක වෙන එක්තරා ආරයක්, ක්‍රම රටාවක් තියෙනවා. **යමක් යමක ගැටෙන ආරය තමයි ඝණ්ඨාරයෙන් පෙන්වන්නෙ.** අන්න ඒ ගැටෙන ක්‍රම රටාව හැදෙන හැටි දැනගන්න ඕන. **සත්වයා සංසාරයේ ගැටෙමින් යන ආරයට "ඝණ්ඨාරය" කියල කියනවා. ඇස, කන, නාසය, දිව, කය කියන අභ්‍යන්තර ඉන්ද්‍රියන්ට බාහිර ලෝකයේ තියෙන රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ වෙන් වෙන් වශයෙන් ගැටෙනවා.** තවත් විදිහකින් කියනව නම්, ඇසට රූප, කනට ශබ්ද, නාසයට ගඳ සුවඳ, දිවට රස, කයට ස්පර්ශ (පොට්ඨබ්බ) ගැටෙනවා. මනායතනය මේ සියල්ලටම මූලික වෙනවා. මේ ආකාරයට **බාහිර ලෝකයේ තියෙන යම් යම් දේවල් ඇස, කන, නාසය, දිව, කය කියන අභ්‍යන්තර ලෝකයත් සමග ඝට්ටනය වුණාම, ලෝක සත්වයා ඒ ඒ දේවල්වලට විවිධ වටිනාකම් දීදී ඒ ක්‍රියාවලිය තමන් කැමති ආකාරයට පවත්ව ගන්න උත්සාහ කරනවා. බැරි වුණාම ඒවත් එක්ක ගැටෙනවා. ඒ විදිහට ගැටීම් වැඩි කරගත්ත කෙනා ද්වේශ බවට පත්වෙනවා.** මේ ආකාරයට පටන් ගන්න පැවැත්මේ ස්වභාවයට "ආරය" කියල කියනවා. මේ ක්‍රියාවලිය ඇස, කන, නාසය, දිව, කය සහ මන මූලික කරගෙන එක්තරා ආරයකට ගමන් කරනවා. ඒ ගමන් කරන ආකාරයට චිත්ත වීථි කියල කියනවා.

මේ විදිහට යන ස්වභාවයේ සියුම් අවස්ථා පෙන්වන්න උදාහරණයක් විදිහට, ඇස මූලික කරගෙන ආරම්භ වෙන චිත්ත වීථි, කන මූලික කරගෙන ආරම්භ වෙන චිත්ත වීථි, ඒ වගේම නාසය, දිව, කය, මන මූලික කරගෙන ආරම්භ වෙන චිත්ත වීථී... ආදී වශයෙන් මේ ආරයට යන ක්‍රියාවලිය හඳුන් වන්න පුළුවන්. ඒ ආකාරයට **චිත්ත වීථියක චිත්තක්ෂණ ගමන් කරන ගැඹුරු සංකීර්ණ ක්‍රියාවලිය පෙන්වන්නත් මේ ඝණ්ඨාරයේ උපමාව යොදා ගන්නවා.**

උදාහරණයකින් පැහැදිලි කරනව නම්, කඹයෙන් ඝණ්ඨාරයේ මැද කොටස අදින කොට ඝණ්ඨාරය වටේ තියෙන තහඩුවේ වැදිල "ඩාං" ගාල ශබ්දයක් ඇතිවෙනවා. එහෙම ගැටුණට පස්සෙ ඒ මුලින්ම එන හඬ ඇසුරු කරගෙන තවත් රැව් දෙන හඬ මාලාවක් යම් කිසි වෙලාවක් යනකල් නිකුත් වෙනවා. එක වරක් වැදුණම විනාඩි ගණනක් කම්පනය වෙනවා. මේ විදිහට එක වරක් වැදිල එන හඬට "රාවය" කියල කියනවා. දිගින් දිගටම එන කම්පන මාලාවට "ප්‍රතිරාවය" කියල කියනවා. එතකොට එක වාරයක් වැදුනම කොච්චර නම් කම්පන වාර ගණනක් එනවද? මේ "රාව ප්‍රතිරාව" නැංවෙන ආකාරයට ලෝක සත්ත්වයා ඇලෙමින් ගැටෙමින් තමයි සසර ගමනේ ගනුදෙනු හදාගන්නෙ. **මුලින් එක වරක් ගැටුනම ඒක සිහිපත් කර කර දින ගණන්, මාස ගණන්, අවුරුදු ගණන් ගැටෙනවා.** ඉතින් මේ ආකාරයට ලෝක සත්වයා දිගින් දිගටම යන වැඩ පිළිවෙල සාරවත් ගමනක් වෙන්නෙ කොහොමද? දුකෙන් දුකට පත්වෙවී අසාර ගමනක් තමයි යන්නෙ.

**කෙනෙක් කාත් එක්ක හරි ගැටුණම ඊට පස්සෙත් ඒ ගැන කොච්චර නම් හිතනවද? සමහර විට කෙනෙක් විහිළුවට බැනල යන්න පුළුවන්. නමුත් බැනුම් අහපු කෙනා ඒක ඇත්තටම පිළිගත්තොත් දින, මාස, අවුරුදු ගණන්, සමහර විට මැරෙන කල්ම මතක් කර කර ගැටෙනවා. ප්‍රතිරාවය ඒ විදිහට තමයි යන්නෙ. ඉතින් මොහොතක් ගානෙ හිත් දූෂ්‍ය වෙනවා. මේ විදිහට ශබ්දය අනුසාරයෙන් ගැටීමේ ස්වභාවය දකින්න ඕන.** එතකොට ශබ්දය කියන්නෙත් හේතු ඵලයක්. ගැටීමේ හේතුවේ ඵලය. ගැටීම නැත්නම් ශබ්දයක් නෑ. එක වරක් ගැටුණම ඒ හේතුවේ ප්‍රතිරාවය දිගින් දිගටම යනවා. ඒ වගේ අපිත් ගැටෙන්න හොඳ නෑ. ගැටුණොත් ඒ වගේ ස්වභාවයක් තමයි ඇති වෙන්නෙ.

එතකොට ඔය කියන අසාර **වැඩපිළිවෙලින් වෙන් වෙලා මනසට යහපත් දහමක් ඝට්ටනය කළොත් ඒකෙ ප්‍රතිරාවයත් එහෙමම යනවා. චිත්ත ප්‍රසාදය ඇති වෙවී යන ඒ ඝට්ටනය යන්නෙ යහපත් අතට. ඒ කියන්නෙ සත්වයා සසරෙන් නිදහස් වෙන්න හේතු වෙන පැත්තට.** අන්න ඒ වගේ හොඳ දේ හොයාගෙන හොඳ දේම ඝට්ටනය කරන්න ඕන. මිහිරි නාදයට හේතු වෙන දේ ඝට්ටනයෙන් මිහිරක් විහිදවනවා වගේ, රෞද්‍ර නාදයක් ඝට්ටනය කළොත් රෞද්‍ර හඬක් විහිදවනවා. හේතුවට අනුකූලයි ඵලය. මේ තමයි ශබ්දයෙන් පෙන්වන්නා වූ න්‍යාය ධර්මය. අන්න ඒ න්‍යාය ධර්මය දකින්න පුරුදු වෙන්න ඕන. එතකොට ශබ්දය තුළින් ධර්මානුකූල පැවැත්මක් ගොඩනැගෙනවා.

ඉතින් මේ පූජාවේ තවත් ආනිසංසයක් පෙන්වනව නම්, අපි හිතමු මේ පූජාවට සහසම්බන්ධ වෙන පිරිස අතරෙ ආර්ය බවට පත්වුණ, එහෙමත් නැත්නම් සෝවාන්... ආදී මගඵල ලබපු පුද්ගලයන් ඉන්නව කියල. ඒ වගේ පුද්ගලයෙකුට ආර්ය බවට පත්වීමෙන් පසුව ඉතිරි මගඵල පූර්ණ කරගන්න "සතිය" තමයි මූලික කාරණයක් වෙන්නෙ. ඒ වගේ කෙනෙකුට, ලෝකයේ වැඩ කටයුතුවල නිරත වෙලා ඉන්න බොහොමයක් වෙලාවට සතර සතිපට්ඨානයෙන්ම (නිවන මුල් කරගත් සිහියෙන් යුක්තව) හැම වෙලේම ඉන්න බෑ. මොකද තමන්ගෙ යුතුකම් ආදී වෙනත් වැඩ කටයුතු කරන්න සිද්ධ වෙන නිසා. ඒ වගේ අවස්ථාවල **පන්සලේ ඝණ්ඨාරය දවසට කිහිප වරක් නාද වෙනව ඇහෙනව නම්, ඒ හැම අවස්ථාවකම සංසාරයේ ගැටෙමින් ආපු ගමනේ හැටිත්, ඉදිරියට ගැටෙමින් යන්න සිද්ධවෙන සංසාර ගමනක හැටිත් හරියට මෙන්න මේ වගේනෙ කියල සිහිපත් වෙලා, නැවතත් යහපත් අතට (සතර සතිපට්ඨානයට) හිත තියන්න ඒ තුළින් අවස්ථාව ලැබෙනවා.** මේ ආකාරයට ඝණ්ඨාර නාදය ඇහෙන තෙක් මානයේ ඉන්න හැමෝටම සසර ගමනේ ගැටෙන ආකාරය සිහිපත් කරල දෙන මේ මහා පින්කම නිසා, ඒ හේතුවේ ඵලයක් විදිහට තමන්ගෙත් සති ඉන්ද්‍රිය බලවත් වෙලා, නිවන් පූර්ණ කරගන්න අවස්ථාවක් මේ තුළින් ලැබෙනවා.

මේ විදිහට ගැටෙන ආරය පෙන්වන්න, පෙර බෞද්ධයො ඝණ්ඨාර කුළුණක ඝණ්ඨාර හයක් සම්බන්ධ කරල තිබුනා. ප්‍රධාන ඝණ්ඨාරය නාද කළාම පිළිවෙලට අනෙක් පහම නාද වෙන ආකාරයට තමයි ඝණ්ඨාර කුළුණු නිර්මාණය කරල තිබුනෙ. මේ ප්‍රධාන ඝණ්ඨාරය විසාලයි. ඒක මනේන්ද්‍රියටත්, කුඩාවට හදපු අනෙක් ඝණ්ඨාර

# බුදු දහමේ සැඟවුණු අරුත් කියා දෙන වහරක ලොකු හාමුදුරුවෝ...



මුලින්ම මම වහරක ලොකු හාමුදුරුවො ගැන දැන ගත්තෙ මගේ මිත්‍රයෙක්ගෙ ගෙදරක තිබුණ ධර්ම සාකච්ඡාවකට සහභාගි වීමෙන්. එදා එතැන සාකච්ඡාවට මූලික වුණ රාජ් විජේවික්‍රම මහත්තය මට හම්බ වුණේ එදාමයි. එතුමා එදා සාකච්ඡා කළේ බුදු දහමේ එන ඉතාමත් වැදගත්ම කාරණාවක් වන ත්‍රිලක්ෂණය ගැන.

එදා මට තේරුණා, ඒ සාකච්ඡාවේ විග්‍රහ වුණ ත්‍රිලක්ෂණය පිළිබඳ කරුණු, මම මෙතෙක් කල් ඒ ගැන විවිධ ධර්ම දේශනාවලින් අහල දැන ගෙන තිබුණ කරුණුවලට වඩා ඉතාමත් ගැළපෙනව කියල. ඉතිං රාජ් මහත්තය ත්‍රිලක්ෂණය පිළිබඳව කරපු සාර්ථක විග්‍රහය වහරක ලොකු හාමුදුරුවන්ගෙ විග්‍රහයක්. උන්වහන්සේ බුදු දහමේ සැඟවුණු අරුත් මේ විදිහට අපට කියා දීම ගැන මම හුඟක්ම පැහැදුණා.

මමත් ධර්මය ගැන විවිධ අයුරින් කරුණු කාරණා සොයමින් හිටිය කෙනෙක්. එදා සාකච්ඡාවෙදි ත්‍රිලක්ෂණය ගැන විග්‍රහ කෙරෙන ආකාරය අනුව මට තේරුණා, ඒ ධර්ම කරුණු විග්‍රහය ඉතාමත් නිවැරදියි සහ ගෝචරයි කියල. ඒ විතරක් නෙවෙයි, ආර්ය අෂ්ඨාංගික මාර්ගය ගැන මම එතෙක් අහල තිබුණ අර්ථ ගැන්වීම්වලට වඩා මේ සාකච්ඡාවෙදි අහල දැනගත්ත කරුණුවලට මම ඉතාම සතුටින් එකඟ වුණා. ඒ වෙලාවෙ තමයි මම රාජ් මහත්තයගෙන් ඇහුවෙ ඔබතුමාගෙ ගුරුවරයා කවුද කියල. අන්න එහෙමයි මම වහරක ලොකු හාමුදුරුවො ගැන මුලින්ම දැන ගත්තෙ.

එයින් නොබෝ දවසකින්ම අපි ගියා වහරක ලොකු හාමුදුරුවො බැහැ දකින්න. එදා පටන් මම බුදු දහම ගැන වහරක ලොකු හාමුදුරුවො කරන නිවැරදි විග්‍රහාත්මක කරුණු මගේ දැනුමට ග්‍රහණය කර ගනිමින් ඉන්නවා. ඒක හරියටම කාන්තාරයක සා පිපාසාවෙන් ගමන් කරන කෙනෙකුට සීතල නිල් ජලාශයක්ම හම්බ වුණා වගෙයි. අන්න ඒ සතුට අද මම භුක්ති විඳිනවා.

වහරක ලොකු හාමුදුරුවන්ගෙ මේ විග්‍රහාත්මක ඉදිරිපත් කිරීම්වල තියෙන විශේෂත්වය තමයි, ඒවා නිකම්ම ප්‍රකාශ නොකිරීම. ඒ කරුණු ඉතාම බුද්ධි ගෝචර ආකාරයට පැහැදිලි කරල දෙනවා. ඉතිං ඉන් ඔබ්බට කෙනෙකුට ඉතිරි වෙලා තියෙන දේවල් වටහා ගැනීම ඉතාම පහසුයි.

ඇත්තටම අපිට දහම් කරුණු නිවැරදිව දැන කියා ගන්න අවශ්‍ය පතපොත පවා හිඟ තත්වයක් තමයි තිබුණෙ. ඒත් නැදිමාලේ පහ ඇස, කන, නාසය, දිව, කය යන ඉන්ද්‍රියන්ටත් උපමා කරල තමයි පෙන්වල තියෙන්නෙ. ප්‍රධාන සණ්ඨාරය නාද කළාම අනෙක් ඒවත් නාද වෙනවා. නමුත් කාලයාගේ ඇවෑමෙන් දහම් අර්ථ වැහිල යනකොට ඒ වගේ සණ්ඨාර කුළුණුත් දකින්න නැතිව ගියා.

**මේ විදිහට සණ්ඨාර නාදය ඇහෙන වාරයක් පාසා සංසාරයේ ගැටෙන බව සිහිපත් කරල, මේ අසාර පැවැත්මෙන් මිදිල නිවන් දකින්න ඕන කියල සිහිපත් කරල දීමක් තමයි මේකෙන් සිද්ධ වෙන්නෙ.** මේ තමයි පරමාර්ථ අර්ථය හෙවත් ලෝකෝත්තර අදහස.

ඉතින් කෙනෙකුට නිවන් දකින්න අවශ්‍ය නම්, මේ විදිහට ඇස, කන, නාසය, දිව, කය, මන කියන ඉඳුරන් තුළින් රූප, ශබ්ද, ගන්ධ, රස, පහස, ධම්ම කියන අරමුණු සමග ඡන්ද රාගයෙන් ගැටෙමින් සසර ගමනට හේතුවන ක්‍රමවේදය ටිකෙන් ටික අවබෝධයෙන් යුක්තව නවත්වන්න ඕන.

තවත් විදිහකින් කියනව නම්, ඡන්ද රාගයෙන් යුක්තව ලෝකයේ ගැටෙන ආරයට යන ක්‍රමවේදය නවත්වල, දහම් අරමුණක් මූලික කරගත්ත නිවන් සමයට ඇදෙන යම් ක්‍රමවේදයක් තියේනම්, ඒ නිවන නමැති මාර්ගයේම ගැටෙමින් (ස්පර්ශ කරමින්) ලෝකයෙන් වෙන් වෙන ආරයට යාම තමයි බෞද්ධයෙක් විදිහට කළ යුත්තේ. වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම බෞද්ධයන් විදිහට හඳුන්වන්න පුළුවන් වෙන්නෙ එතකොට.

ඒ වගේ යහපත් බෞද්ධ සමාජයක් ඉදිරි අනාගතයෙදි බිහිවීම පිණිසම මේ වෑයම හේතු වේවා. මේ කෙටියෙන් සඳහන් කළ කරුණු සියලු දෙනාගේම නිවන් මගට මහත් පිටිවහලක් වේවා. සණ්ඨාර නාදය ඇසීමෙන් අසල්වාසී ගම්වාසී රටවාසී ලෝකවාසී සෑම සියලු දෙනාගේම සිත් සතන් නිවී සැනසී සුවපත් භාවයට පත්වේවා.

*පූජ්‍යපාද වහරක අභයරතනාලංකාර හිමිපාණන් වහන්සේ විසින් යළි මතු කළ සැඟවුනු දහම් කරුණු ඇසුරෙන් සකස් කළේ:*

**විද්‍යාවේදී අමිත් සමරනායක**
**බෙල්ලන්තර**
0719 997 885

බෞද්ධ මධ්‍යස්ථානයේ නියමු ස්වාමීන් වහන්සේ වන කිරම විමලජෝති නායක හාමුදුරුවන්ටත්, ඒ කාර්ය මණ්ඩලයටත් පින් සිද්ධ වෙන්න තමයි අපිට දැන් තියෙන ධර්ම ග්‍රන්ථ ප්‍රමාණය පවා ලැබිල තියෙන්නෙ. ඒකට විශේෂ ස්තුතියක් කිරම විමලජෝති ලොකු හාමුදුරුවන්ට පිදිය යුතු වෙනවා.

ආයෙත් අපි මේ කතාබහට ආවොත්, මම ඔබට නිදර්ශනයක් හැටියට කියන්නම්, ත්‍රිලක්ෂණය ගැන වහරක ලොකු හාමුදුරුවන්ගෙ විග්‍රහය කොහොමද මේ තරම් බුද්ධි ගෝචර වෙන්නෙ කියල.

අනිච්ච, දුක්ඛ, අනත්ථ කියන මේ ත්‍රිලක්ෂණය ගැන පාලියෙන් නිවැරදිව සටහන් වෙලා තියෙනවා. සංයුක්ත නිකායේ 4 වැනි කොටසේ 2 වන පිටුවේ එන අජ්ඣත්තානිච්ච සූත්‍රයේ මේ ගැන පැහැදිලිව සටහන් වෙලා තියෙනවා. මේක ඇත්තටම කාගෙන්වත් ප්‍රමුඛත්වයක් ලැබුණෙ නැති සූත්‍රයක්. ඒත් බුදු දහමේ මූලික අරුත කැටිකර ගත්තු ත්‍රිලක්ෂණය ගැන මේ සූත්‍රයේ සටහන් වෙනවා.

“ චක්ඛුං භික්ඛවේ අනිච්චං, යද නිච්චං තං දුක්ඛං, යං දුක්ඛං තදනත්තා”

මේකෙ නිවැරදි අර්ථය තමයි, ඇස අනිච්චයි, යමක් අනිච්ච නම් ඒක දුකයි, යමක් අනිච්ච නම් දුක නම් ඒක අසාරයි, අනත්තයි. ඔය අනත්ත කියන පදයේ අර්ථය අභිධර්මයේ විග්‍රහ වෙනවා. ඒ “අසාරකට්ඨේන අනත්තා” කියල. එතකොට අසාර කියන අර්ථයෙන් තමයි අනත්තා යෙදෙන්නෙ. නමුත් මේ කරුණු සිංහලට පරිවර්තනය කරන කොට ලොකු ප්‍රශ්න ඇතිවෙලා තියෙනවා. මොකද මේ පරිවර්තන කරපු අපේ ගෞරවනීය භික්ෂූන් වහන්සේලා රහත් වුණ උදවිය නෙවෙයි. උන්වහන්සේලා මේ පරිවර්තන කරල තියෙන්නෙ භාෂා දැනුම මූලික කරගෙන. එතැනදි තමයි මේ ප්‍රශ්නය මතු වෙන්නෙ.

අනිච්ච නම් දුකයි, දුක නම් අනත්තයි කියන පද සිංහලට පරිවර්තනය වෙලා තියෙන්නෙ, අනිත්‍ය නම් දුකයි, දුක නම් අනාත්මයි කියල. මෙන්න මේ ගැටළුව තමයි අපට තිබුණෙ. ඒකෙන් කියවෙන්නෙ, යමක් අනිත්‍යද ඒක දුකයි කියල. අනිත්‍ය කියන්නෙ “වෙනස් වෙන සොබාවක් ඇති” කියන තේරුම. ඉතිං **වෙනස් වෙන සොබාවය දුක නම්, වෙනස් වෙන හැම දෙයකින්ම හැම අවස්ථාවෙම දුක ඇති වෙන්න එපැයි! එතකොට වෙනස් වෙන කිසිම දෙයකින් සැපක් ලැබෙන්න විදිහක් නෑ.**

ඒ ගැන නිදර්ශනයක් අරගෙන බොහොම සරලව කියනව නම්, මනුස්සයෙක්ගෙ ජීවිතයේ මුල් දශක තුන ඇතුලත ඒ පුද්ගලයා වෙනස් වෙන ආකාරය ගැන ඒ පුද්ගලයාට හෝ ඔහු වටා ඉන්න ඥාති හිතමිත්‍රාදීන්ට තියෙන්නෙ දුකක්ද? කුඩා දරුවෙක් වශයෙන් ඉපදිලා ඇති දැඩි වෙලා ළමා වයස පහු කරගෙන තරුණ වයසට පත්වෙලා පිරිපුන් පුද්ගලයෙක් විදිහට වසර තිහක් ඇතුලත සිදුවන වෙනස් වීම් ගැන තියෙන්නෙ දුකක්ද? ඇත්තටම එහෙම වෙනස් නොවුණ නම් නේද දුක? හැමදාම කුඩා දරුවෙක්ගෙ තත්ත්වයේ ප්‍රමාණයෙන්ම වැඩෙන්නෙ නැතිව හිටිය නම් ඒ ගැන ඇතිවෙන්නෙ දුකක් නේද? එහෙම බැලුවම අර වෙනස් වීම සැපක් නේද? සතුටක් නේද?

ඒත් ඊට පස්සෙ අවුරුදු තිහේ පුද්ගලයා අවුරුදු හතළිහ, පනහ, හැට, හැත්තෑව දිහාවට වෙනස් වේගෙන යනවා. ඒකත් වෙනස් වීමක් තමයි. හැබැයි මේ කාලයේ සිද්ධ වෙන වෙනස් වීම් ගැන මිනිස්සුන්ට තියෙන්නෙ සතුටක්ද? නෑ, දුකක්. ඇයි ඒ? මේ වෙනස් වීම මෙවර සිද්ධ වෙන්නෙ අපි කැමති විදිහට නෙවෙයි. **මුල් කාලයේ මනුස්සයගෙ වෙනස් වීම සිද්ධ වෙන ආකාරයට අපි කැමතියි. ඒත් ඊළඟ කාල පරිච්ඡේදයේදි සිදුවන වෙනස් වීමට අපි කැමති වෙන්නෙ නෑ. ඒ වෙනස් වීම් සිද්ධ වෙන්නෙ අපේ කැමැත්තට අනුව නොවන නිසයි අපි ඊට අකමැති වෙන්නෙ.** එහෙනම් දුක එන්නෙ වෙනස් වීම නිසාද? නෑ. **අපි කැමති විදිහට වෙනස් වීම සිද්ධ නොවෙන අවස්ථාවලදී විතරයි අපිට දුකක් ඇති වෙන්නෙ.** ඒ නිසා අනිච්ච කියන පදයට අනිත්‍ය කියල අර්ථ ගැන්වීම සාවද්‍යයි. ඒකෙ නියම අර්ථය තමයි කැමැත්තට අනුව සිදු නොවීම. මේ අරුත් ගැන්වීම අපිට පෙන්වා දුන්නෙ වහරක ලොකු හාමුදුරුවන් නිසා අපි උන්වහන්සේ කෙරෙහි ඉතාම ඉහළින් පැහැදිලා ඉන්නෙ.

උන්වහන්සේගේ විග්‍රහයට අනුව ඉච්ඡ කියන්නෙ කැමැත්ත. අනිච්ච කියන්නෙ කැමැත්තට අනුව නොවීම හෝ නොතිබීම. ඉතිං මේ මූලික විග්‍රහයට අනුව බැලුවම, අනිච්ච කියන පදයට අනිත්‍ය කියල යෙදුවොත් අර මූලික අර්ථයම අවුල් වෙලා සියල්ල වෙනත් දිසාවකට යොමු වෙනවා. මම දකින විදිහට බුදු දහමේ සාරාර්ථය වරදවා ගැනීම නිසා තමයි අපිට ඉන් ඉදිරියට කිසිවක් නිවැරදිව වටහා ගන්න බැරි වෙන්නෙ.

බුදුන් වහන්සේගේ ශ්‍රී මුඛයෙන් ධර්මය දේශනා වුණාට, මෑත කාලීනව ලියැවුණ කිසිම අර්ථ කතාවක මේ කාරණය මේ විදිහට නිවැරදිව විග්‍රහ වෙලා නෑ. අන්න ඒ නිසා තමයි අපිට වහරක ලොකු හාමුදුරුවන් වහන්සේගෙ වටිනාකම ඉතා ඉහළින් දැනෙන්නෙ.

**නහී සීල වතං හෝතු**
**උප්පජ්ජංති තථාගතා**
**අට්ඨක්කරා තිනි පදා**
**සම්බුද්ධේන පකාසිතා**

මේකෙන් කියන්නෙ, බුදුන් වහන්සේ නමක් ලෝකයට උපදින්නෙම මෙන්න මේ අකුරු අටයි, පද තුනයි ගැන ලෝක සත්වයාට තේරුම් කරල දෙන්න කියන කාරණය. ඒ පද තුන තමයි අනිච්ච, දුක්ඛ, අනත්ථ කියන ත්‍රිලක්ෂණය. මෙතැනදි අකුරු අට එන්නෙ බැඳි අකුරු විදිහට ගැනීමෙන්. ඉතිං මේ කාරණාව වටහා ගැනීම අවුල් වුණොත් එතැනින් එහාට මේ දහම ගැන අපිට කිසිම දෙයක් නිවැරදිව වටහා ගන්න ලැබෙන්නෙ නැති බව දැන් පැහැදිලි වෙනවා.

සංයුක්ත නිකාය (3) 295 පිටුවේ එන සීල සූත්‍රයේ කියල තියෙනවා, යමෙක් සෝවාන් ඵලයට පත් වෙන්න අවශ්‍ය මොනවද කියල. ඒ තමයි ත්‍රිලක්ෂණය වටහා ගැනීම. සකෘදාගාමි ඵලයට පත්වෙන්න අවශ්‍ය වෙන්නෙත් ඒකම තමයි. අනාගාමි වෙන්නත්, අරිහත් ඵලය ලබන්නත් අවශ්‍ය ඒ දෙයම තමයි. හැබැයි මේ ඵලවල තත්ත්වය අනුව ඒ වටහා ගැනීම පවතින්නෙ එක් එක් මට්ටම්වල. අපි අර මනුස්සයගෙ වෙනස් වීම ගැන කියපු නිදර්ශනයට වඩා ඉදිරියට ගිය සියුම් වටහා ගැනීම් මේ තුළ තියෙනවා. ඒ වටහා ගැනීම් ග්‍රහණය වෙන්නෙ එක් එක් කාලවලදි. ඉතිං ඔන්න ඔය විදිහට තමයි, වහරක ලොකු හාමුදුරුවො ධර්මය විග්‍රහ කරන ආකාරය ගැන අපි පැහැදුණේ. බුදු දහම ගැන, ඒ දහමේ එන සියුම් කාරණා ගැන උන්වහන්සේ කරන තවත් වටිනා විග්‍රහාත්මක දේ ගැන අපි ඉදිරියටත් කතා කරමු.

**නුගේගොඩ වින්ලංකා රෝහලේ සභාපති**
**වෛද්‍ය ආර්.පී. වීරසිංහ**
MBBS/DFM/MCGP/MPFAM



# දුන් අයටත් ගත් අයටත් සෙත සැලසෙන බෞද්ධයාගේ දන්සැල

ලොව්තුරා බුදුන් වහන්සේ වැඩ ඉන්න කාලයේ හිටපු දානපතියන්ගෙන් අනේපිඬු සිටුතුමා තමයි මුල් තැනම හිටියෙ. එතුමා තරම් දන් දුන්න කෙනෙක් ඒ කාලයේ හිටියෙ නැති තරම්. බුදුන් සරණ යන්නත් පෙර පටන්ම තමන් දැනගෙන හිටපු ලෞකික දහමට අනුව දුගී මගී යාචකාදීන්ට දන් දුන්න බව සඳහන් වෙනවා.

දැන් මේ කියන්න යන්නෙ එතුමා ගැන නෙවෙයි. එතුමා දුන්න දන්සැල්වලට කිසිම සම්බන්ධයක් නැතිව දේව අත්බැවකට ගිය කෙනෙක් ගැන. දකුණු අත රත්තරන්වලින් බබලන දෙවි කෙනෙක් දෙව්ලොව හිටියා. මේ දෙවියන්ගෙ කලින් අත්බැව ඇඳුම් මහන්නෙක්. ඉතින් ඒ මනුස්සයා තමන්ගෙ රැකියාව කරන ස්ථානය තිබුණෙ අනේපිඬු සිටුතුමා දන්සැල් දෙන පැත්තෙමයි. ඒ දන්සැල්වලට මේ මනුස්සයගෙ කිසිම සම්බන්ධයක්වත් කිසිම දායකත්වයක්වත් නෑ. නමුත් ඔහු රැකියාව කරන තැන, එහෙම නැත්නම් ඇඳුම් මහණ තැන පිහිටල තිබුණෙ අර දැන්සැල් තියෙන පැත්තෙ. ඉතින් දන්සැල හොයාගෙන එන දුගී මගී යාචක ආදී කොටස් ඔහුගෙන් පාර අහනවා. මේ මනුස්සයා කරන්නෙ රැකියාව කරන අතරතුර ඔළුව උස්සල බලල, දන්සැල තියෙන්නෙ අන්න අර පැත්තෙ කියල අත දික් කරල පෙන්වන එක. ඊට එහා දෙයක් කළේ නෑ. ඉතින් ඒ පිනෙන් තමයි දේව අත්බැවකට ගිහින්, අර නිතරම දික් කරල පෙන්වපු අත රත්තරන්වලින් බබලන්න ගත්තෙ. කිසිම සම්බන්ධයක් නැතුව ඒ විදිහට දන්සැල තියෙන දිසාව විතරක් පෙන්වල ඒ තරම් දෙයක් ලැබෙනවද කියල කෙනෙකුට පුදුම හිතෙන්න පුළුවන්.

දාන, සීල, භාවනා කියන කාරණා තුනෙන් මුල් එක තමයි දානය. ඒ වගේම තමයි ලොව්තුරා සම්මා සම්බුද්ධත්වයට පත්වෙන්න පූර්ණ කරන දස පාරමිතාවලින් මුලින්ම සඳහන් වෙන්නෙත් දාන පාරමිතාව. ඉතින් ලෞකික, ලෝකෝත්තර මාර්ග දෙකටම එක සේ උදව්වෙන පිනක් තමයි දානය කියන්නෙ. දානය කිව්වම ආහාරපාන විතරක් නෙවෙයි තවත් බොහෝ දේවල් අයිතියි. දන් දෙන ක්‍රම එක එක විදිහට ධර්මය පුරාවටම විග්‍රහ කරල තියෙනවා. දක්ෂිණ විභංග සූත්‍රයට අනුව දන් දෙන්න පුළුවන් ක්‍රම 13 ක් විග්‍රහ කරල තියෙනවා. ඒ ගැන මේ සඟරාවෙන් මීට පෙර අවස්ථා කිහිපයකදීම විස්තර කරල තියෙනවා. මේ මොන ක්‍රමයට දුන්නත් දානය කියන්නෙ ඉතාම වටිනා දෙයක්.

ඒ වගේම අපි නොදන්න නොදැක්ක තවත් පැතිකඩක් තියෙනවා. බොහෝවිට මේ දන්සැල් දෙන්නෙ, ලොව්තුරා බුදුන් වහන්සේ විසින් පිහිටවපු සම්බුද්ධ සාසනය මුල් කරගෙන. සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පෙරුම් පුරද්දි උන්වහන්සේ තරම් දන් දුන්න කෙනෙක් මේ තුන් ලෝකයේම නෑ. කෙනෙකුට අදටත් දන්සැලකින් බලෙන් හරි අඬගහල කන්න බොන්න දෙනවා. ඒ කියන්නෙ උන්වහන්සේ දුන්න දානයේ ප්‍රතිඵල අදටත් මිනිස්සු භුක්ති විඳිනවා. ඒක වෙසක්, පොසොන් කාලෙට ලංකාවට එන විදේශිකයන් පවා පුදුමයට පත් කරවන සිදුවීමක්. ඉතිං උන් වහන්සේගෙ දේශනාවක් තමයි, කෙනෙක් අත හෝදල අහක දාන ඉඳුල් වතුර ටිකෙන් පවා කුසගින්න නිවාගන්න පුළුවන් ජීවියෙක් ඉන්නව නම්, අන්න ඒ අයටත් මේ ඉඳුල් වතුර ටික දානයක් වේවා කියල දැම්මත් ලැබීම තියෙනව කියල.

ඒ වගේම තමයි මේ දන්සැල් පවත්වන වෙසක්, පොසොන් වගේ විශේෂ පසළොස්වක පොහොය දවස්වලට තවත් විශේෂ දෙයක් දකින්න පුළුවන්. ඒ තමයි ගමක, නගරයක ඉන්න සාමාන්‍යයෙන් නිතර නිතර පින් දහම් කරන සැදැහැවතුන්ට අමතරව, සමාජ සම්මතයේ නරක විදිහට පිළිගන්න අය, එහෙම නැත්නම් දඩබ්බර දාමරික අය පවා එකමුතු වෙලා දන්සැල් දෙනවා. ලෝක සම්මතයේ ගත්තම මස් මාළු වෙළඳසැල්, සුරා සුඳු කරන අය පවා එකට එකතු වෙලා මහා දන්සැල් පවත්වනවා. එතකොට ඒ අය වර්තමානයේ මොන දේ කළත්, සම්බුද්ධ සාසනය මුල් කරගෙන දෙන දන්සැලේ ආනිසංස ඒ අයටත් කවදාහරි ඇදිල එනවා. මේ ගැන කතා කරනකොට අපදාන පාලියේ එන

කතාවක් තියෙනවා. එක්තරා වැද්දෙක් සතුන් දඩයම් කරන්න ගිහින් එන ගමන් තෙත සිවුරක් වේලෙන්න දාල තියෙනව දකිනවා. මේ වැද්දා ජීවිකාවට කරන්නෙ සත්තු මරන එක. නමුත් මේ සිවුර දැකල පැහැදීමක් ඇතිවෙලා සිවුර වේලෙනකල්ම පවන් සැලුවා. දැන හෝ නොදැන බුද්ධ සාසනයට සම්බන්ධ භික්ෂූන් වහන්සේ නමකගේ සිවුරටයි එහෙම කළේ. ඉතින් ඒ පින් කුසල් බලයෙන් මේ ගෞතම බුද්ධ සාසනයේ අරිහතුන් වහන්සේ නමක් බවට පත්වුණා. මේ වගේ උදාහරණ අපදාන පාලියේ ඕන තරම් තියෙනවා.

ඒ නිසා ඕනෑම කෙනෙක් තවත් කෙනෙකුගේ ප්‍රයෝජනයට දෙන යහපත් දෙයක් වළක්වන්න හොඳ නෑ. එහෙම කළොත් ඒකෙන් එන ප්‍රතිඵලයත් ඒ වගේ. දැන් මේ එහෙම කතාවක් තමයි කියන්න යන්නෙ.

එක්තරා අවස්ථාවක ලොව්තුරා බුදුන් වහන්සේ වැඩ ඉන්න කාලයේ මසුරු සිටු කෙනෙක් හිටියා. ඔහු ළඟ ඔහුගේ දරුවන්වත් නොදන්න පංච මහා නිධානයක් තිබුණා. ඔහු තමන්ගෙ මරණයට පෙර ඒ නිධානය ගැන කියන්නෙ නැතුව, තමන් සතුව එවෙලෙ තිබිච්ච රන් කාසි දරුවන් අතර සමසේ බෙදල දීල මේ විදිහෙ අවවාදයක් දුන්නා. මේ කාසි කාටවත් නිකං දෙන්න එපා. එහෙම දුන්න කියල කවදාවත් වැඩි වෙන්නෙ නෑ. මේවා යොදවනව නම් ලාබ ලබන්න මිසක් අලාභයක් වෙන දේකට යොදවන්න එපා. මෙතැනින් කාසියක් අරගෙන තව කෙනෙකුට දුන්න කියන්නෙ කාසියක් අඩු වෙනවා කියන එක. ඒ නිසා කවදාවත් නිකං දෙන්න එපා.

මේ අවවාදය මහා විනාසයක් කරගන්න හේතු වුණ, මහා මසුරු (ලෝභ) හිතක් එක්ක දුන්න අවවාදයක්. මේ මසුරුකමත් එක්කම අර පංච මහා නිධානය තියෙන තැනත් හිතේ තියාගෙනම සිටුවරයා මළා. මැරිල ගිහින් රොඩී පවුල් දාහක් ඉන්න තැනක කාන්තාවකගේ කුසේ උප්පත්තියට ගියා. ඉතින් වෙනදා බැලමෙහෙවරකම් කරල ජීවත් වුණ මේ මිනිස්සුන්ට එක පාරටම කන්නවත් නැති වුණා. කවුරුවත් වැඩක් දෙන්නෙ නැති තැනට පත්වුණා. මේ පවුල්වල නායකයන් එකතු වෙලා කතා වුණා, කවුරු හරි කාලකණ්ණියෙක් අපි අතරට ඇවිත් තියෙනවා, ඒකයි අපිට කෑම වේලක්වත් හොයාගන්න බැරි වෙලා තියෙන්නෙ කියල. ඒ නිසා ඒ අය මොකද කළේ, මේ පවුල් දහස දෙකට බෙදිල තැන් දෙකකට ගියා. දැන් එක බාගයකට අඩුවක් නැතුව නැවතත් බැලමෙහෙවර ලැබෙනවා, හැබැයි අනෙක් බාගයට නෑ. ඔය විදිහට නොලැබෙන පිරිස තව දුරටත් වෙන් කරගෙන වෙන් කරගෙන ගිහින් අර ගැබ් ගත්ත කාන්තාවට යන කල්ම වෙන් කළා. දැන් මේ කුසේ ඉන්න එකා තමයි කාලකණ්ණියා කියල අඳුනගෙන, ඒ කාන්තාව විතරක් තනිකරල අනෙක් අය වෙන් වුණා.

ඔහොම ගිහින් මේ දරුවා ඉතාම විකෘති කෙනෙක් විදිහට ඉපදුනා. දැන් අර කාන්තාව දරුවා උස් මහත් වුණාට පස්සෙ දාල යන්න ගියා. මේ ළමයා තැන තැන ගියත් කොහෙන්වත් කන්න ටිකක්වත් ලැබෙන්නෙ නෑ. ඔහොම යන අතරෙ අර කලින් ඇත්බැවේ තමන්ගෙ සිටු මැඳුරටත් ගියා. ජාති ස්මරණ ඥානයත් පහළ වුණා. ඒ නිසා මතක් වුණා, මම මේ සිටුගෙදර සිටුතුමා කියල. ඇතුලට ගියාම තමන්ගෙ කලින් අත්බැවේ පුතා ඉන්නව දැකල ළඟට ගිහින් කතා කළා. ඒ අය මොකද කළේ, තාත්ත දුන්න අවවාදය මතක් වෙලා මේ හිඟන ළමයව එලියට ඇදල දැම්මා.

ඉතින් මේ අවස්ථාවේ ලොව්තුරා බුදුන් වහන්සේ මහා සංඝයා වහන්සේලාත් සමග පිණ්ඩපාතෙ වඩිනවා. උන්වහන්සේ මේ ළමයව දැකල අර සිටු පුත්‍රයට එන්න කියල පෙර විස්තරය කිව්වා. ඒත් පිළිගත්තෙ නැති නිසා, අර පංච මහා නිධානය තියෙන තැන මේ ළමයම කිව්වම පිළිගත්තා. ඊට පස්සෙ ලොව්තුරා බුදුන් වහන්සේ දානයේ තියෙන වටිනාකම පෙන්වල දුන්නම, මේ සිටු පුත්‍රයා ඇතුලු සියලු දෙනාම තෙරුවන් සරණ ගියා. මේ එක සිදුවීමක් විතරයි. ඒ වගේම දානය නිසා ලැබුණ ලැබීම් ගැනත් ඕන තරම් දහම් කතා තියෙනවා.

කාශ්‍යප බුදුන් වහන්සේ වැඩ ඉන්න කාලයේ දුගියෙක් හිටියා. ඔහු කොච්චර දුගියෙක්ද කියනව නම්, හැමෝම ඔහුට කිව්වෙ මහ දුගියා කියල. ඒ දුගියයි ඔහුගෙ බිරිඳයි ජීවත් වුණේ බැලමෙහෙවරකම් කරල ලැබුණ දේකින්. මේ අතර කාශ්‍යප බුදුන් වහන්සේ කෙරෙහි පැහැදුන එක්තරා මනුස්සයෙක්, පිරිසත් එක්කරගෙන දානයක් දෙන්න ඕන කියල හිතල ඒකෙ වටිනාකම දැකල, කාශ්‍යප බුදුන් වහන්සේ ප්‍රමුඛ 20,000 ක් සංඝයා වහන්සේලාට ආරාධනාවක් කළා. ඉතින් කාශ්‍යප බුදුන් වහන්සේත් මේ ආරාධනාව පිළිගත්තා. දානය බාරගත්ත මනුස්සයා දැන් ගෙවල් ගානෙ ගිහින් දන් දෙන්න පුළුවන් අය හොයාගෙන නම් ලැයිස්තුවක් හදනවා. එක එක ගෙවල්වලින්, මම එක භික්ෂූන් වහන්සේ නමකට දන් දෙන්නම්, මම දෙනමකට දන් දෙන්නම්, මම සිය නමකට දන් දෙන්නම්... ඔය ආදී වශයෙන් විවිධ තරාතිරම්වල අය තම තමන්ට පුළුවන් ප්‍රමාණයෙන් දන් බාරගත්තා. ඔහොම යන අතරෙ අර මහ දුගියත් මුණ ගැහුණා. දැන් මේ මනුස්සය අහනවා, ඇයි උඹ දානයක් බාරගන්නෙ නැත්තෙ කියල. ඉතින්, අනේ මටවත් කන්න නැතුව මම කොහොමද තව කෙනෙකුට දන් දෙන්නෙ කියල ඇහුවා. ඒ පාර අර මනුස්සය කියනවා, බැලමෙහෙවරකම් කරල ලැබෙන දෙයින් දෙන්න පුළුවන්නෙ කියල. එතකොට මේ මහ දුගියත්, එහෙනම් මම එක ස්වාමීන් වහන්සේ නමක් වළඳවන්නම් කියල බාරගත්තා. ඒත් දාන ලැයිස්තුව හදන මනුස්සා, ඔය කිව්වට මේ මිනිහා ඕක කරන එකක් නෑ කියල නම ලියාගන්නෙ නැතුව යන්න ගියා.

දැන් මහ දුගියා ගෙදර ගිහින් වෙච්ච සිද්ධිය කිව්වා. බිරිඳටත් හරි සතුටුයි. කොහොමහරි අපි බැලමෙහෙවරකම් කරල එක ස්වාමීන් වහන්සේ නමකට හරි දන් දෙමු, අපිට මේ නොලැබීම තියෙන්නෙ අපි දන් දුන්නෙ නැති නිසා, ඒ නිසා කොහොම හරි මහන්සි වෙලා මේ දානය දෙමු කියල, දෙන්නම කුලී වැඩක් හොයාගෙන ගියා. ඔහොම යද්දි එක සිටු ගෙදරකට මහ දුගියා ගියා. සිටුතුමා කතා කරල ඇහුවා වැඩක් හොයාගෙනද ආවෙ කියල. ඉතින් මේ මනුස්සයව හැමෝම දන්නවා. ඒ නිසා තමයි එහෙම ඇහුවෙ. එතකොට කිව්වා, ඔව් මම වැඩක් හොයාගෙන ආවෙ කියල. ආ ඒක හොඳයි, මම ස්වාමීන් වහන්සේලා සිය නමක් වළඳවන්න බාරගත්තා, දර පළන්න තියෙනවා, ඒක කරල දීපන් කියල කිව්වා. ඉතින් මේ මනුස්සයා හරිම සතුටින් වැඩේ බාරගෙන දර ටික පළනවා. කියන කියන අනෙක් වැඩත් කරනවා. සිටුතුමා ඇහුවා, අද උඹ කවදාවත් නැතුව හරිම උනන්දුවෙන් කඩිසරව වැඩ කරනවා මොකක්ද හේතුව කියල. ඉතින් මේ මහ දුගිය කිව්වා, සිටුතුමනි මම එක ස්වාමීන් වහන්සේ නමක් වළඳවන්න බාරගත්තා, ඒ නිසයි මේ මහන්සියෙන් වැඩ කරන්නෙ කියල. සිටුතුමත් හරියට සතුටු වෙලා හාල් නැලි



හතරක් බැල වශයෙනුත්, සතුටින් දෙන දේ කියල තවත් වැඩිපුර හාල් නැලි හතරකුත් දුන්නා. දැන් මේ මහ දුගියට හරි සතුටුයි. අවශ්‍ය කළමණා ටික එකතු වෙනවා. ඔහුගේ බිරිඳටත් මේ විදිහටම ලැබිල තිබුනා.

මේ ක්‍රියාව සක් දෙවිඳුත් දැක්කා. දැන් එතුමටත් අවශ්‍ය වුණා මේ දානයට සහභාගි වෙන්න. ඒ නිසා වෙස් වලාගෙන ඇවිත් අර මහ දුගියට දානෙ උයන්න උදව් කළා. මේ සිද්ධිය කාශ්‍යප බුදුන් වහන්සේ මහා කරුණා ඥානයෙන් දැක්කා. ලොව්තුරා බුදුන් වහන්සේලාගේ සිරිතක් තියෙනවා, උදේ පාන්දර මහා කරුණා ඥානයෙන් ලෝකය දිහා බලනවා, අද උදව් කරන්න පුළුවන් කෙනෙක් ඉන්නවද කියල. එහෙම බලන අතරෙ තමයි මේ මනුස්සයගෙ මේ කැපවීම දැක්කෙ. ඒ වගේම දැක්කා, මේ මනුස්සයට වෙන් කරපු ස්වාමින් වහන්සේ නමක්වත් නෑ කියල. මොකද අර ලැයිස්තුව හදපු මනුස්සය මේ කෙනාව විස්වාස නැති නිසා නම සටහන් කරගත්තෙත් නෑ. ඒ නිසා කාශ්‍යප බුදුන් වහන්සේ තීරණය කළා, අද මේ මනුස්සය බාරගත්ත දානය ලබන ස්වාමින් වහන්සේ මමම වෙනව කියල.

දැන් දානය සේරම ලෑස්ති කරල මහ දුගියා ගිහින් ඇහුවා, කෝ මට වෙන් කරපු ස්වාමින් වහන්සේ කියල. එතැනදි තමයි දැනගත්තෙ එහෙම වෙන් කරල නෑ කියල. ඉතින් මේ මනුස්සයා අඬා වැලපෙමින් එතැනින් යන්න ගියා. කියන්න කෙනෙක් නෑ. අන්තිමට එච්චර මහන්සි වෙලත් දානෙ පූජ කරගන්න ස්වාමින් වහන්සේ නමක් නෑ. ඔහොම අඬා වැලපෙමින් කාශ්‍යප බුදුන් වහන්සේ වැඩ ඉන්න විහාරයට ගියා. එතකොට මේ සියල්ල මහා කරුණා ඥානයෙන් බලාගෙන හිටපු බුදුන් වහන්සේ ඔහුගේ අතේ පාත්තරය තිව්වා. මේ සිද්ධිය ඉතාමත් ආශ්චර්‍ය සිද්ධියක්. **ලොව්තුරා බුදුන් වහන්සේ නමක් කෙනෙකුට පාත්තරයක් අතට දුන්නොත්, ඒක බුදුන් වහන්සේට හැර වෙන කිසිම කෙනෙකුට ආපහු ගන්නත් බෑ. ඒ වගේම ඒ පාත්තරය අතේ තියෙන කෙනාගෙ මරණය පවා ඒ මොහොතේ සිද්ධ වෙන්නෙ නෑ කියලයි ධර්මයේ සඳහන් වෙන්නෙ.** ඉතින් ලොව්තුරා බුදුන් වහන්සේ පාත්තරය තමන් අතට දෙයි කියල බලාපොරොත්තුවෙන් හිටපු රජවරු සිටුවරු, මම මේ ධනය දෙන්නම්, මේ සැප සම්පත්තිය දෙන්නම් කිය කියා මහ දුගියට ඇවිටිලි කළත්, මේ මහ දුගියා පාත්තරය කිසි කෙනෙකුට නොදී තමන්ගෙ නිවස කරා කාශ්‍යප බුදුන් වහන්සේව වඩම්මව ගෙන ගියා. දැන් මේ මහ දුගියා ගැන දන්න නිසා රජවරුත් මේ දෙන දානය බලන්න ගියා.

කිසි දවසක නොදැකපු ආකාරයේ ඉතාමත් සුවඳවත් මනහර දානයක් තමයි පිළියෙල කරල තිබුනෙ. ඉතින් රජවරු, මේක අපිටවත් කරන්න බෑනේ, මොහු තමයි අද දන් පිළිගන්වන්න සුදුස්සා කියල හිතල යන්න ගියා. ඒ දානෙන් පස්සෙ ඔහුට සියලු සැප සම්පත් ලැබුණා. මරණින් මතු බුද්ධාන්තරයක්ම දෙව්ලොව ඉපදිලා ඉඳල ගෞතම බුද්ධ සාසනය තියෙන කාලයේ මනුස්ස ලෝකයේ උපන්නා. වයස අවුරුදු හතේදි මහණ වුනා. ධර්මයේ සඳහන් වෙන ආකාරයට, මේ පුංචි සාමණේරයන් වහන්සේට අරිහත්වය පූර්ණ කරගන්න බාධාවක් වෙයි කියල, ලොව්තුරා බුදුන් වහන්සේ උන් වහන්සේගේ කුටිය අබියස මුරකාවලේ හිටියා. හතරවරම් දෙවිවරු හතර කොන ආරක්ෂා කරගෙන හිටියා. ඉර මුදුන් වෙන එක පවා නැවතුනා. මොකද මුන් වහන්සේ අරිහත්වයෙන් පස්සෙ දානෙ ගන්න ඕන නිසා. සැරියුත් මහරහතන් වහන්සේගෙ පිණ්ඩපාතයෙන් තමයි දාන වේල ලැබුණේ. මේ තරම් භාග්‍ය සම්පන්න විදිහට තමයි උන්වහන්සේ ත්‍රිවිද්‍යා සහිතව අරිහත්වය පූර්ණ කළේ.

ඉතින් දන් දීම කියන එක සුළුපටු නෑ. ප්‍රධානම කාරණයක් තමයි පුළුවන් උපරිමයෙන් දන් දීම. ඒ වගේම පිරිස සහභාගි කරව ගන්න පුළුවන්නම් ඒකත් වටිනවා. අර කලින් මසුරු සිටුතුමාගෙ කතාව වගේ ඒක වළක්වන එකත් මහා විනාසයක්.

දැන් මේ කියන්න යන්නෙ, තමන්ගෙ උපරිමයෙන් පිරිස සහභාගි කරවගෙන පොදුවේ දන් දෙන්න පුළුවන් ක්‍රමයක් ගැන. ඒ තමයි වර්තමානයෙත් බොහොම ජනප්‍රිය දන්සැල් දීම. හැබැයි මේ කියන්න යන්නෙ නියම බෞද්ධ ක්‍රමයට දෙන දන්සැලක තියෙන වටිනාකම ගැන.

දන්සැලක් දෙනකොට ගාණක් මිම්මක් හිතා ගන්න බෑ. පොදුවේ තමයි දෙන්නෙ. මූලිකම අරමුණ දුගී මගී යාචක කියන කොටස්. දුගී කියල අදහස් කළේ, තමන්ට දෙයක් තනිවම කරගන්න බැරි, වත්පොහොසත්කම් නැති අය. සමහර විට හරි හම්බ කරන දේ කන්න බොන්නවත් මදි. දුප්පත් අය කියන්නෙත් මේ අයට. අනෙක් කොටස යාචක. කෙනෙකුට අතපාල ජීවත් වෙන අය. ඉන්න හිටින්න පවා තැනක් නෑ. අනුන් දෙන දෙයක් කාල බීල ඇඳල තමයි ජීවත් වෙන්නෙ. ජීවත් වෙන්නෙ මහපාරේ වෙන්න පුළුවන්. එහෙම නැත්නම් කොහේ හරි අගුපිළක ලැගල ඉන්නව වෙන්නත් පුළුවන්. අනෙක් කොටස තමයි පොදුවේ යන එන අය. ඒකට වත්පොහොසත්කමක් බලන්න බෑ. ඕනෑම තරාතිරමක කෙනෙක් වෙන්න පුළුවන්. ගුණ මහත්වයක් තියෙන කෙනෙක් වෙන්නත් පුළුවන්, නොතිබෙන කෙනෙක් වෙන්නත් පුළුවන්. ඉතින් මේ කොටස් තුනටම පොදුවේ එකට දන් දෙන ක්‍රමයක් තමයි සාමාන්‍යයෙන් දන්සැලකින් කරන්නෙ.

දැන් අපි ගෙදරකට සංඝයා වහන්සේලා වඩම්මවල, එහෙම නැත්නම් වැඩිහිටි නිවාසයකට හෝ ළමා නිවාසයකට හෝ දානයක් දෙනව වගේ නෙවෙයි. දන්සැල බොහෝවිට තියෙන්නෙ නිතර යන එන පොදු

ස්ථානයක. කිසිම ආරාධනාවක් නැතුව ඕනෑම කෙනෙකුට ඒ දන්සැලෙන් දෙන ආහාර පාන හෝ වෙනත් ඕනෑම දෙයක් ලබා ගන්න බාධාවක් නෑ. එතකොට පෙර පටන්ම බෞද්ධ අබෞද්ධ දෙපිරිසම දන්සැල් දෙනවා. අදත් දෙනවා. හැබැයි **බෞද්ධයෙක් නම්, දෙන්නම් වාලෙ දෙන්නෙ නැතුව මේ දන්සැල ඥාන සම්ප්‍රයුක්තව හේතුඵල දැනගෙන දෙන්න පුරුදු වෙන්න ඕන.** පොදුවේ දෙන නිසා කරුණා සාසනයට අයිති වෙනවා. එදා පොදුවේ පරිහරණය කරපු දේවල් වැට මායිම් ගහගෙන වෙන් කරගෙන නැති කරපු නිසා ඒවා පරිහරණය කරන්න බැරුව ගියා. ඒ නිසා පොදුවේ ලෝකයට වෙච්ච ණය අප්‍රමාණයි. මේ ණය ගෙවන්න ක්‍රමයක් තමයි, පොදුවේ කිසිම බේදයක් නැතිව දන් දීම. ඒ නිසා හරි විදිහට දන්සැලක් කරනකොට තනියම කරන්න බෑ. ඒකට පිරිස සහභාගි කරවගන්න ඕන. ඒ දන්සැල හදන්න ඕන. ප්‍රමාණයක් නොදන්න නිසා ඒ දෙන දේ උපරිමයෙන් ශේන්න ඕන. සකසා දෙන දෙයක් නම් ඒකට පිරිස ඕන. **දන්සැලක් දෙන්න හිතන එකත් පිරිසගේ සමගියටත් හේතුවෙන මහා පුණ්‍ය කර්මයකට මුල වෙනවා.**

ඒ වගේම දන්සැලක මූලික අරමුණක් තියෙනවා. ඒ අරමුණ දන්සැල දෙන අය අනුව වෙනස් වෙනවා. විශේෂයෙන් ලංකාව වගේ රටක ජාති ආගම් භේදයකින් තොරව දන්සැල් දෙනවා. රටේ ස්වභාවික විපත්තියක් වුණ වෙලාවක මේක හොඳට බලාගන්න පුළුවන්. ජාති ආගම් බේදයක් නැතිවයි මිනිස්සු යම් යම් දේවල් දෙන්නෙ. එතකොට නියම බෞද්ධ ක්‍රමයට දෙන දන්සැලකයි අබෞද්ධ ක්‍රමයට දෙන දන්සැලකයි ලොකු වෙනසක් තියෙන්න ඕන. බෞද්ධයෙකුගෙ මූලික අරමුණ නිවන. කරන කියන ඕනෑම දෙයක් නිවන මූලිකවයි කරන්නෙ. අබෞද්ධයෙක්ගෙ අරමුණ වෙන එකක්. හොඳ නිසා දෙනවා, ස්වර්ගය ආදී සුගති සම්පත් ප්‍රාර්ථනා කරනවා. නිවන් අරමුණක් ඒ අයට නෑ. ඒත් ඒ කරන්නෙත් යහපත් චේතනාවකින්.

ඉතින් බෞද්ධයෙක් හැටියට කොහෙන්ද පටන් ගන්නෙ? මුලින්ම හිතන්න ඕන දානයේ වටිනාකම ගැන. මේ වටිනාකම ආදර්ශයෙන් පෙන්වපු මහා උත්තමයෙක් ඉන්නවා. ඒ තමයි ලොව්තුරා බුදුන් වහන්සේ. උන්වහන්සේ තරම් දන් දුන්න කෙනෙක් මේ තුන් ලෝකයේම නෑ. උන්වහන්සේව ආදර්ශයට අරගෙන ත්‍රිවිධ රත්නයේ ගුණ මුල් කරගෙන ඒ කෙරෙහි පැහැදිලා තමයි අපි මේ දන්සැල දෙන්නෙ. **තෙරුවන් කෙරෙහි අංශුමාත්‍රයක හෝ පැහැදීමෙන් කෙරෙන පින්කමක් මෙලොව පරලොව අභිවෘද්ධිය ලබා දීල නිවනින් තමයි කෙළවර වෙන්නෙ.** ඒ එක පැත්තක්. ඒ වගේම බෞද්ධයෙක් හැටියට තවත් වටිනා පැත්තක් හිතන්න තියෙනවා. මෙතැනදි කොටස් දෙකක් ඉන්නවා. එක කොටසක් තමයි දන්සැල දෙන පිරිස. අනෙක් කොටස තමයි ලබන පිරිස. බෞද්ධයන්ට පුළුවන්, දෙන කෙනාට වගේම ගන්න කෙනාටත් යහපතක් වෙන විදිහට දන්සැල දෙන්න.

මුලින්ම දන්සැල දෙන පිරිස ගැන බලමු. අපි ඔසු පැන් දන්සැලක් දෙනව කියල හිතන්න. ඉතින් මුලින්ම හිතට ගන්න ඕන, කෙනෙක් මේ දන්සැලට එන්නෙ පිපාසය නිසා පැන් ටිකක් බොන්න කියන කාරණය. ඒ ඔසු පැන් ඒ වෙලාවට අමෘතයක් වගේ අර පිපාසය නිකම්ම නිවෙනවා. ඒ වගේම තමයි, ලෝක සත්වයා කාමයන් පස්සෙ දුවල සසර පුරාම පිපාසයට පත්වෙලා ඉන්නෙ. ඒ පිපාසය නිවන්න පුළුවන් ලොව්තුරා බුදුන් වහන්සේ දේශනා කළ අමා දහම් පැන් පානය කළොත් විතරයි. මේ දෙන ඔසු පැන් පානය කරල පිපාසය නිවා ගන්නවා වගේ, කවදහරි මේ දන්සැලට එන අයටත් ඒ සසර පිපාසය නිවේවා කියල පිළිගන්වනවා. ඉතින් මේ දෙන පැන් පොද ඒ විදිහට හිතල දෙනවා. ඒ ඔසු පැන් පානය කරන කෙනා දුන්න කෙනා කෙරෙහි පැහැදෙනවා. පැහැදෙන්නෙ විශේෂ ගුණයකට. නිරාමිස සුවයට. ඒකෙන් දුන්න කෙනාට වගේම ගත්ත කෙනාටත් මහා සෙතක් ශාන්තියක් සැලසෙනවා. සමහරවිට ඒ ගත්ත කෙනා බුදුන් වහන්සේ ගැන හෝ එහෙම උත්තමයෙක් ගැන අහලවත් නැති වෙන්න පුළුවන්. ඒත් කවදහරි සහනයක් සැනසීමක් ලැබෙනවා.

ඒ වගේම තමයි, දන්සැලට පිරිස සහභාගි කරවා ගැනීම. ඒකත් ඒ අයට සෙතක් සිද්ධ වෙන විදිහට කරන්න පුළුවන්. උදාහරණයක් විදිහට අපි දන්සැලට මුදල් ආධාර එකතු කරන්න යනව කියල හිතමු. ගෙයක් ගානෙ ගිහින් ආධාර එකතු කරනවා. එතකොට නිකම්ම එකතු කරන්නත් වාලෙ එකතු කරන්නෙ නැතුව ඒකත් ඥාන සම්ප්‍රයුක්තව කරන්න පුළුවන්. ඒ අයට අමුතුවෙන් පහදල දෙන්න දෙයක් නෑ. දන්සැල කරන කෙනෙයි ඒ පැහැදීමෙන් යන්න ඕන. ලොව්තුරා බුදුන් වහන්සේ පෙන්වා දුන්න ක්‍රමවේදය අනුගමනය කරමින් මම දන්සැල දෙන්නෙ. ඒ දන්සැල මට තනියම කරන්න අමාරුයි. ඒත් මම දන්නවා, මේ දන්සැලේ වටිනාකමත්, පිරිස සහභාගි කරගැනීමේ වටිනාකමක්. ඒ වගේම තමයි, බුද්ධ සාසනය උදෙසා කරන පින්කම්වල අවසාන ප්‍රතිඵලය. මගේ බලාපොරොත්තුවත් ඒ අවසාන ප්‍රතිඵලය කරා යන්න. ඒ ප්‍රතිඵලයට යන්න තියෙන යම්කිසි බාධාවක් තියෙනවනම්, මේ කරන පිනෙන් ඒ බාධාවන් යම් ප්‍රමාණයකින් හරි අඩු වෙයි. ඉතින් ඒකට මට සහයෝගයක් දෙන කෙනෙක් ඉන්නව නම්, අඩුම තරමෙ මගේ මේ සත්කටයුත්තට විරුද්ධත්වයක් හරි නොදක්වා ඉන්නවනම් ඒකත් බොහොම වටිනවා. ඒ අයටත් කවදහරි මේ මහා කටුක සසරින් මිදෙන්න හේතු වාසනා වේවා කියල පැතුමක් තියාගෙන අර ආධාර එකතු කරනවා. ඉතින් **ආධාර කරන අය අංශුමාත්‍රයක් හරි පැහැදිලා තමන් වියදම් කරන මුදලින් කොටසක් දුන්නොත්, බොහොම සතුටින් ඒ අයටත් ආශිර්වාද කරල ඒක ලබාගන්නවා. ඒ ආශිර්වාදය ලබන අයටත් මහා සෙතක් වෙනවා.** මේ තමයි නියම බෞද්ධ ක්‍රමය. මුදල් දුන්න කෙනා බෞද්ධ නොවෙන්න පුළුවන්. නමුත් පැහැදුනේ බෞද්ධ ක්‍රමයකට. ඒ නිසා කවදහරි ඒ අයටත් මග පෑදෙනවාමයි. ඒකයි මේ බුද්ධ සාසනය ආශ්චර්යයි අත්භූතයි කියන්නෙ.

අනෙක් කාරණය තමයි දන් දෙන දාන වස්තුව. ඒකත් වැදගත්. කෑමක් බීමක් නම් ප්‍රණීතයෙන් පිරිසිදුව දෙන්න ඕන. එතකොට තමයි ගන්න කෙනාගෙ හිත පැහැදෙන්නෙ. ටික ටික දුන්නත් පිළිවෙලට පිරිසිදුව දෙන්න ඕන. මේ යාචකයෙක්නෙ කියල හිතල වෙනම දෙන්නෙ නෑ. පිරිසිදුකම, බෞද්ධකම ආදර්ශයෙන් පෙන්වන්න ඕන. පැහැදෙන්නෙ අන්න ඒකට. දෙන ආහාරයටම නෙවෙයි. **සමහර විට අපි දන්නෙ නැතිව ඔය අතරේ මාර්ගඵල ලාභීන්, බෝසත්වරු, ගුණ මහත්වයෙන් ඉහල අය ඉන්න පුළුවන්. පොදුවේ දෙන දෙයක් නිසා ඕනෑම කෙනෙක් එන්න පුළුවන්. ඉතින් හිතා ගන්නත් බැරි මහා පින් කන්දරාවක් කරගත්ත වෙනවා.**

තවත් විශේෂ කාරණයක් තියෙනවා. සාමාන්‍යයෙන් ලංකාව ඇතුලෙ දන්සැලක් දෙන දවස ගැන බැලුවොත් හැම තිස්සෙම වගේ පසලොස්වක පොහොය දවසක්.

වෙසක්, පොසොන්, ඇසළ... ආදී විශේෂ පොහොයවල් වගේම අනෙක් පොහොය දවස්වලටත් දන්සැල් දෙනවා. **මේ හැම දන්සැලකම මූලිකම අරමුණ තමයි, ඒ පොහොය දවසේ බණ භාවනා කරන්න, පෙහෙවත් සමාදන් වෙන්න, එහෙම නැත්නම් මලක් පහනක් පූජා කරන්න, පෙරහැර බලන්න පන්සලට යන පිංවත් පිරිස. එහෙම නැත්නම් ඒ වගේ සාසනික කටයුතු සඳහා පන්සලට ගිහින් නැවත එන පිංවත් පිරිස. වෙසක් පොහොය වගේ දවසක් නම්, පහන් කූඩු, තොරණ, භක්ති ගීත... ආදී වෙසක් සිරි නරඹල ශ්‍රද්ධාවක් භක්තියක් ඇති කරගන්න පිංවත් පිරිස.** ලංකාව තුළ විවිධ ජාතීන් ඉන්නවා. ඒ අයත් එකට එකමුතු වෙලා මේ දන්සැල් ඕනෑ තරම් දෙනවා. ඒ දෙන්නෙත් මේ වගේ පොහොය දවසක. පසළොස්වක පොහොයක් කියන්නෙ බෞද්ධ පිරිස, අරිහතුන් වහන්සේ අනුගමනය කරමින් සික්ෂා රකින දවසක්. ඉතින් එහෙම අනුගමනය කරල එන පිරිසකට තමයි දන්සැල දෙන්නෙ.

එතකොට **මේ තෙරුවන් කෙරෙහි අංශු මාත්‍රයක හෝ ප්‍රසාදයක් ඇති කරගෙන නිවන් මගට මුල පුරන පින්වත් පිරිසට ඒ කටයුතුවලදී ඇති වෙන සා පිපාසා වෙහෙස මහන්සිය දුරු කරගන්න මේ දන්සැල උපකාරයක් වේවා කියන මෙත්තා සහගත අදහසින් තමයි දන්සැල දෙන්න ඕන. එතකොට හේතුවට අනුකූල ඵලය වශයෙන්, ඒ දන්සැල පවත්වන පින්වතුන්ටත් සසර ගමනේදි ප්‍රත්‍ය පහසුකම් ලැබිල, මෙලොව පරලොවත් අභිවෘද්ධිය ලබාගෙන නිවන් සාක්ෂාත් කරගන්න ඒ සත් කටයුත්ත උපනිශ්‍රය සම්පත්තියක් වෙනවා.** මේ විදිහට ඒකෙන් සිද්ධවෙන යහපත කියල නිම කරන්න බෑ. ඒ කාරණය දැන හෝ නොදැන හිටියත්, කරන්නෙ බුද්ධ සාසනය වෙනුවෙන් කරන ප්‍රතිපත්තිමය පූජාවක්. ඊට හේතුව තමයි, මේ ක්‍රියාවන් සියල්ලෙම අවසාන ප්‍රතිඵලය, පැතුවා හෝ නැතා නිවන වීම.

මේකට ධම්ම පදයේ එන සුමන නම් මල්කරුවාගේ මල් පූජාව හොඳ උදාහරණයක්. ඔහු ලොව්තුරා බුදුන් වහන්සේට පූජා කළේ රජතුමාට ගෙනියන මල්. තමන්ගෙ ජීවිතය දෙවනි කළා. නමුත් ප්‍රාර්ථනාව වුණේ ලෞකික සැප සම්පත්. ලොව්තුරා බුදුන් වහන්සේට යමක් පූජා කළාද, දන් දුන්නද, ලැබීමේ අඩුවක් නෑ කියන කාරණය ඔහු අහල තිබුණා දැකල තිබුණා. මෙලොවදී හෝ පරලොවදී හෝ අනිවාර්යයෙන්ම ලැබෙනවා කියල දැනගෙන හිටියා. ඉතින් ඒ නිසයි පූජාව කළේ. නමුත් ලොව්තුරා බුදුන් වහන්සේ ආනන්ද හිමියන්ට, මේ සුමන කියන මල්කරුවාගේ පූජාව ගැන වර්ණනා කළා. දිවි පරදුවට තියල කරපු මේ මහා පූජාවේ ආනිසංස කිව්වා. ලැබෙන සම්පත්තිය පෙන්නුවා. අවසානයේ කල්ප ලක්ෂයකින් පසු පසේ බුදුවරයන් වහන්සේ නමක් වෙන බවත් දේශනා කළා. ඉතින් බුද්ධ සාසනය වෙනුවෙන් යමක් කරන එකේ ප්‍රතිඵලය තමයි ඒ.


අනෙක් පැත්ත හිතුවොත්, බෞද්ධයෙක් වශයෙන් කවුරු හරි දෙන දන්සැලකට ගියා කියල හිතමු. ඔබ උදේ පන්සලට ගිහින් දවසම පෙහෙවස් සමාදාන වෙලා හවස පාවාරණය කරල ගෙදර යන ගමන් ගමේ අය එකතු වෙලා කෝපි දන්සැලක් දෙනවා. ඉතින් ඒ දන්සැලට ඔබටත් එන්න කියල කෝපි කෝප්පයකින් සංග්‍රහ කරනවා. දැන් ඔබටත් පුළුවන් බෞද්ධයෙක් වශයෙන් මෙහෙම හිතන්න. අද මම දවසෙම පෙහෙවස් සමාදන් වෙලා, බණ භාවනා කරල කායික වශයෙන් විඩා වෙලා ගෙදර යන ගමන් මේ දන්සැලෙන් කෝපි කෝප්පයක් බීල විඩාව දුරුකරගෙන ලොකු ප්‍රබෝධයක් ඇති කරගත්තා. ඒ නිසා මට අද තවත් බණ භාවනා ටිකක් කරගන්න පුළුවන්. ඒක කරගන්න පුළුවන් වුණේ මේ දන්සැල නිසා. එහෙම හිතල **මේ දන්සැල දුන්න අයටත්, සහභාගි වුණ අයටත්, අංශුමාත්‍රයකින් හරි උදව් උපකාර කළ අයටත්, සුවපත් වෙත්වා, මා ලැබූ සැනසීම ඒ අයටත් ලැබේවා, ආයුස-සැපය-වර්ණය-බලය-පටිභාන නුවණ ලැබේවා කියල හිතින් හරි ආශිර්වාද කරල යන්න පුළුවන්. ඒක ඒ දන්සැල දුන්න අයට මහා සෙතක් වෙනවා.**

**ඒ නිසා දන්සැල්වලින් දෙන ඒ සංග්‍රහ භුක්ති විඳින්න යන පින්වත් පිරිසත්, රස තෘෂ්ණාවෙන් දන්සැලට ගොඩවෙන්නෙ නැතිව, තමන්ට තියෙන සා පිපාසා වෙහෙස මහන්සිය ආදිය දුරු කරගෙන, යහපත් සිතින් තෙරුවන් කෙරෙහි චිත්ත ප්‍රසාදයක් ඇති කරගෙන, නිවන් මගට උපකාරයක් වේවා කියන අදහසින් ප්‍රත්‍යවේක්ෂාවෙන් යුක්තව ඒ සංග්‍රහ භුක්ති විඳින්න පුරුදු වෙන්න ඕන. ඒ වගේම ඊට ප්‍රති උපකාර වශයෙන්, ඒ දන්සැල දුන්න පින්වත් පිරිසටත්, ඒ කරගත්ත පින හේතුවෙන් අවසානයේ නිවන් මග පූර්ණ කරගන්නම හේතු වේවා කියල වචනයෙන් බැරිනම් හිතින් හරි පතන්න පුරුදු වෙන්න ඕන.**

ඊළඟ කාරණය තමයි, දන්සැල අවසානයේ බෞද්ධයන් වශයෙන් කළ යුතු වැදගත් කාරණයක් තියෙනවා. ඒ තමයි දන්සැලට සහභාගි වෙච්ච සියල්ලන්ටම මහා පුණ්‍යානුමෝදනාවක් කිරීම. එහෙම කරන්න පුළුවන්නම් තවත් හොඳයි. ඇයි ඒක වැදගත් වෙන්නෙ කියල හිතෙන්න පුළුවන්. මේ මනුස්ස අත්බැව තමයි කෙනෙකුට විශේෂයෙන් පිනක් හෝ පවක් කරන්න පුළුවන් තැන. සංඛාර ලෝකය කියන්නෙ ඒකයි. හොඳ නරක දෙකටම තැන. අග්‍ර ඵලය වන සම්මා සම්බුද්ධත්වය වගේම අවීචි මහා නරකාදියට වුණත් වැටෙන්න පුළුවන් තැන. අපට සහයෝගය දුන්න, පෙනෙන වගේම නොපෙනෙන පිරිස් ඉන්න පුළුවන්. ඒ වගේම මේ දන්සැල දැකල සතුටු වෙච්ච දිව්‍ය බ්‍රහ්ම කොටස් ඉන්න පුළුවන්. මේ මහා පුණ්‍යානුමෝදනාව ඒ අය සේරටම දුන්න තවත් දන්සැලක් වෙනවා. ඉතින් පිනෙන් පින උනන මහ උල්පතක් වගේ තමයි මේ වගේ දන්සැලක් බෞද්ධයෙක් වශයෙන් හරියට දුන්න කියන්නෙ.

අනෙක් වැදගත් කාරණය තමයි, සියල්ල අවසානයේ ඒ දන්සැල දුන්න ස්ථානය කලින් තිබුණ ආකාරයට සුද්ධ පවිත්‍ර කරල යන එක. කාටවත් බාධාවක් නොවෙන විදිහට පොදු ස්ථානයක දුන්න නිසා ඒක හරිම වැදගත්. මොකද ඒකෙන් වුණත් කෙනෙක් බෞද්ධත්වය ගැන පැහැදිලා සෙතක් කරගන්න පුළුවන්. බලන්න නියම බෞද්ධයො, දන්සැල දුන්න තැනත්, කාටවත් යන්න එන්න බාධාවක් නැති විදිහට තිබුණ වගේම පිරිසිදු කරල ගිහින්. ඒ පැහැදෙන්නෙත් අර දන්සැල දුන්න පිංවතුන්ගෙ ගුණයට. ඒ පැහැදීමත් කවදහරි ගුණ වඩාගෙන සසර ගමන කෙළවර කරගන්න හේතු වෙනවා.

ඉතින් දැන් වැටහෙන්න ඕන, දහම් අවබෝධය තියෙන නියම බෞද්ධයෙක් දන්සැලක් දුන්නත් ලෝකයට සෙතක් කරන්න පුළුවන් වගේම, දන්සැලකට ගියත් සෙතක් කරගන්න පුළුවන් කියන කාරණය. කොටින්ම ඔහු හෝ ඇය ඇවිදින දන්සැලක් වගේ. නිතරම යමක් ලෝකයට දෙමින් තමයි ඉන්නෙ. සතෙකුට කෑම ටිකක් දුන්නත්, අනේ මේ සතාගෙ කුසගින්න නිවුණ වගේ කවදහරි සසර ගින්නත් නිවේවා කියල ආශිර්වාද කරන්න පුළුවන්. ඒකත් මෛත්‍රිය පැතිරෙව්වා හා සමානයි. එහෙම නැත්නම්, කෙනෙකුට තමන් අවබෝධ කරගත්ත ධර්මය තමන් දන්න විදිහට සුළුවෙන් හරි කියල දෙන්න



# භික්ෂුණී වහන්සේ නමකට ලියූ වැදගත් දහම් ලිපියක්...

ගිහි පැවිදි භේදයකින් තොරව හුග දෙනෙක් තමන්ගෙ දහම් දැනුම ලොකු කරගෙන ධර්ම මාන්නයක් හදාගෙන තමන්ගෙ මතයම ජයගන්න උත්සාහ කරන අවස්ථා එදා විතරක් නෙවෙයි අදත් සමාජයේ බහුලවම දකින්න ලැබෙනවා. සමහරු කොච්චර අහංකාරද කියනව නම්, තමන්ගෙ දෙයක් හැර වෙන කෙනෙක්ගෙ දේශනාවක් අහල බලල හෝ පොත පතක් කියවල බලල හෝ ඊට ඇහුම්කන් දෙන ස්වභාවයක් නැති තරම්. වෙන කෙනෙක් කියන කාරණා ඇත්ත වුණත් තමන්ගෙ තියෙන මාන්නය නිසා පිළිගන්නෙ නැති පිරිසක් ඉන්නවා.

ඒ අතින් බලනකොට වහරක හාමුදුරුවො කියන්නෙ, තමන්ට කොච්චර දැනීමක් අවබෝධයක් හැකියාවක් තිබුණත්, අන් අයටත් සාවධානව ඇහුම්කන් දෙන, වෙනත් කෙනෙක්ගෙ පොතක් පතක් වුනත් කියවල බලල ගන්න හරයක් තියෙනව නම් නිසි ගරුත්වයෙන් ඒ ගැන සඳහන් කරල ඒ කාරණා පවා තමන්ගෙත් ලෝකයාගෙත් යහපතට යොදා ගත්ත උත්තමයෙක්. ඒ ගති ගුණ උන්වහන්සේ ළඟ ගිහි වතක පටන්ම තිබුණා. අහුවෙන හැම දහම් පොතපතක්ම කියවල බලල, ගන්න හරයක් තියේනම් ඒ ගැන සඳහන් කරන්න තරම් උන්වහන්සේ නිහතමානී වුණා.

ඒ වගේම තමයි, ඒ හැම කාරණයක්ම නිවනට මාවත සකස් කරගන්න මිසක්, දැනුමෙන් මත් වෙලා වාද කරන්න හෝ තමන් මුදුනා වෙන අදහසක් කිසි විටෙකත් උන්වහන්සේ ළඟ තිබුණෙ නෑ. බොහොම නිරහංකාර ගති ලක්ෂණ තමයි හැමවිටම පෙන්නුම් කළේ. කාගෙ හරි අඩුපාඩුවක් වුනත් පෙන්වා දුන්නෙ, ඒ පුද්ගලයා එක්ක ගැටීමක් තරහවක් නැතිව යහපතක් වෙන විදිහට බොහොම සුහදශීලීව. ඒ බව ඔප්පු වෙන, උන්වහන්සේ විසින් ලියන ලද ලිපියක් අනික් පින්වතුන්ටත් ආදර්ශයක් වෙයි කියල හිතෙන නිසා මේ විදිහට පළ කරනවා. මේ තියෙන්නෙ උන්වහන්සේ ගිහි වතක සිටියදී තවත් භික්ෂූන් වහන්සේ නමකට ලියන ලද ලිපියක්.

ගරු.......... ස්වාමීන් වහන්සේ වෙත,

ස්වාමීන් වහන්ස,

ඔබ වහන්සේ සමග දිනක් මම “මන” පිළිබඳවත් “ශුද්ධාෂ්ටක” පිළිබඳවත් වචන ස්වල්පයක් සාකච්ඡා කළ බව මතක ඇතැයි සිතමි.

ඒ අවස්ථාවේ, අරමුණු මනින අර්ථයෙන් මන කියන බවත්, ශුද්ධාෂ්ඨක වෙන් වෙන්ව ඉවත් පුළුවන්. එහෙමත් නැත්නම්, ඒ ජාතියෙ බණක් කියන පිංවතෙකුට පහසුකමක් සලස්වල දෙන්න පුළුවන්. අඩුම තරමෙ තේ කහට එකක් හරි ගිහින් දෙනවා. ඉඳගන්න පුටුවක් හරි ගිහින් තියනවා. මේ විදිහට ඥානය මුසු කරගෙන සතුටු සිතින්, මෙත්තා කරුණා සහගත සිතින් දෙන ඕනෑම දෙයක් දෙපැත්තටම යහපතක් සැලසෙන මහා පිනක් වෙනවා.

ඒ නිසා බෞද්ධයින් සහ අබෞද්ධයින් දෙන දන්සැලක පැහැදිලි වෙනසක් තියෙනවා. නියම බෞද්ධ ක්‍රමයට දෙන දන්සැලක් නම්, දිව පිනවන්න හෝ සා පිපාසා වෙහෙස මහන්සිය තාවකාලිකව දුරු කරගෙන හුදෙක් පංචකාම ආස්වාදයක් ලබන අරමුණින් නැතිව, එයින් ඔබ්බට ගිය සදාකාලිකව දුකෙන් නිදහස් වෙන නිවීම සැනසීම තමන්ටත් අනුන්ටත් ලබාදෙන ඥාන සම්ප්‍රයුක්ත පින්කමක් වෙන්න ඕන. අති දුර්ලභව පහළ වෙච්ච බුද්ධෝත්පාද කාලයක හේතු ඵල දැකල ඒ ආකාරයට දන්සැලක් පවත්වනව නම්, ඊට සහසම්බන්ධ වෙන සියළු පිරිස්වලට මෙලොව පරලොව අභිවෘද්ධියටත්, අවසානයේ නිවනටත් මූලික අඩිතාලම සැකසෙන්නත් උදව්වක් උපකාරයක් වෙනවා.

*පූජ්‍යපාද වහරක අභයරතනාලංකාර හිමිපාණන් වහන්සේ විසින් යළි මතු කළ සැඟවුනු දහම් කරුණු ඇසුරෙන් සකස් කළේ:*

**ෆික්රි ඉස්මයිල්**
**පරිගණක ඉන්ජිනේරු - ගොතටුව**
076 344 6839

**කරගත නොහැකි බවත්** මා කී බව කරුණාවෙන් මතක් කරන අතර, ඔබ වහන්සේ ඒ අදහස ප්‍රතික්ෂේප කර ඒ අදහස් වැරදි බවද, පෙළ දහම් පොත්වලින් හෝ පිළිගත හැකි පැරණි පොතපතින් අදහස් පෙන්වන ලෙසද මා හට කියන ලදී.

**මේ දහම් කොටස් ඉදිරිපත් කරන්නේ වාද කිරීමකට නොව, හරි අරුත තේරුම් ගැනීම මට මෙන්ම මාගෙන් වචනයක් අසා දරා ගන්නා අයට යහපතක්ම වන බව සිතන බැවිනි.**

යාගොඩ ධම්මප්‍රභ ස්වාමීන් වහන්සේ විසින් ලියන ලද "සිත සිරුර හා නිවන" යන පොතේ 90 වැනි පිටේ සිත හඳුන්වන ධම්ම සංගණියේ "යං තස්මිං සමයේ 1. මනෝ 2. මානසං 3. හදයං 4. පණ්ඩරං 5. මනෝ මනායතනං 6. මනින්ද්‍රියන් 7. විඤ්ඤාණං 8. විඤ්ඤාණක්ඛන්ධෝ 9. තජ්ජා මනෝ විඤ්ඤාණ ධාතු, ඉදං තස්මිං සමයේ චිත්තං හෝති" යනුවෙන් නම් 9 ක් දක්වා ඇති බවද කියා ඇත.

එහිම 91 වැනි පිටේ "මනම මානස නම් වේ" යනුවෙන්ද "අප්පමත්ත මානසෝ සෙඛෝ කාලං කයිරා ජනේසුතා" යයි දේශනාවක් ඇති බවද කියා ඇත. **"මන කියන්නේ අරමුණු මනිමින් දැන ගන්නා හෙයිනි"** කියාද උන්වහන්සේ පෙන්වා ඇත.

එසේම එම පොතේ 33 වන පිටේ "ආරම්මනං මිනමානං විය ජානාතිති **මනෝ අරමුණු මනිමින් මෙන් දැන ගත්තේනුයි මන නම් වේ"** යන අර්ථයද පෙන්වා ඇත. මේ ගැනද විමසා බලන මෙන් කරුණාවෙන් ඉල්ලා සිටිමි.

ශුද්ධාෂ්ඨක පිළිබඳවද රේරුකානේ චන්දවිමල ස්වාමින් වහන්සේ විසින් ලියන ලද අභිධර්ම මාර්ගය නම් පොතේ 248 පිටුවේ **"වර්ණ-ගන්ධ-රස- ඕජා යන සතරය, භූත රූප සතරය යන මේ රූප අට ඔවුනොවුන්ගෙන් වෙන් නොවන බැවින් අවිනිබ්භෝග රූප නම් වේ, ඉතිරි රූප විස්ස විනිබ්භෝග රූප නම් වේ"** කියා පෙන්වා ඇත.

මේ පිළිබඳව තවදුරටත් පැහැදිලි කිරීමට උන් වහන්සේ 255 පිටේ "හාල් පිටි, තිරිඟු පිටි, කුරක්කන් පිටි, බාර්ලි පිටි යන වර්ග හතර ටික ටික ගෙන වතුරෙන් අනා ගුළි කළ විට එක් එක් පිටි වර්ගය ඉන් කොහිදැයි ඇසූ විට අනෙක් පිටි සමග යැයි කියන්නාක් මෙන්" යයි යන්තමටවත් කාරණය තේරුම් යන උපමාවක් පෙන්වා ඇත.

දහම් දැනුමෙන් හසල උගතුන් ලෙස ප්‍රසිද්ධ උන්වහන්සේලා කියන මේ කියමන්ද, පෙන්වා ඇති සූත්‍ර පාඨද විමසා, ඔබ වහන්සේ පෙන්වන අදහසම සත්‍ය නම් අනුකම්පා කර ඊට නිදර්ශන ලෙස පෙළ දහම් හෝ අටුවා පොතකින්වත් පෙන්විය හැකි තැනක් මා හට දැන ගැනීමට හඟවන මෙන් යටහත්ව ඉල්ලා සිටිමි.

මීට හිතවත්,

අභයරත්න

---

ඒ වගේම වහරක හාමුදුරුවො ගිහි වතක ඉන්නකොට, යාගොඩ ධම්මප්‍රභ හිමියන් විසින් ලියන ලද ඉහත කී පොතේ අඩංගු ඒ දහම් කරුණු ගැන තවත් විස්තරයක් මේ විදිහට දින පොතක සටහන් කරල තිබුණා.

එසේම එම පොතේ 91 වැනි පිටේ "මේ නම් නවය ත්‍රිපිටකයෙහි නොයෙක් තැන යෙදී ඇති බව සැලකිය යුතුය. මනෝ, මානසං, මනෝ මනායතනං යනුවෙන් මන ශබ්දය නැවත නැවත දක්වන ලදී. මන කියන්නේ අරමුණු මනිමින් දැන ගන්නා හෙයිනි. මනම මානස නම් වේ. මානස ශබ්දය එක්ව යෙදෙන ධර්මයන්ටද අප්පමත්ත මානසෝ-සෙඛෝ කාලං කයිරා ජනේසුතා යන දේශනාවේ, **අප්පමත්ත මානසෝ යනු, නොපැමිණි මනසක් ඇත්තේ යනුවෙන් නොපැමිණි රහත් මාර්ගය ඇත්තේ යනුයි. සසුනට ඇතුල්වීමේ මහණවීමේ අදහස හෙවත් බලාපොරොත්තුව රහත් වීමය. එයට නොපැමිණි යන තේරුම මෙයින් ගත යුතුය.** කෙසේවත් නිවනට මන-මනස... ආදී ශබ්දයක් ව්‍යවහාර නොවේ."

මේ වැකියද කියවා බලා මන යන්න අරමුණ මනින හෙවත් මැන දැනගන්නා අර්ථයෙන් සැදුනු බව තේරුම් ගත යුතුය.

මනෝ පුබ්බංගමා ධම්මා යන්නට පොත්වල අර්ථ දක්වා ඇත්තේ, සිත චෛතසික ධර්මයන්ට පූර්වංගමයි යනුවෙනි. පූර්වංගම නම් සිත චෛතසිකවලට මුලින් පහළවී තිබිය යුතුයි යනු මගේ හැඟීමයි. එසේ වුවහොත් එහිදී සිත චෛතසිකයන්ට පුරේ ජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය විය යුතුය. නමුත් පට්ඨානයේ කුසලෝ, අකුසලෝ, අභ්‍යාකතෝ ඒකෝ ඛන්ධෝ තින්නංඛන්ධනං සහජාත පච්චයේන පච්චයෝ යනුවෙන් පෙන්වා ඇත.

කුසල්, අකුසල්, අව්‍යාකෘත සියලුම නාම ධර්ම වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ කොටස් හතරෙන් එකක් අනෙක් තුනට සහජාතාදී ප්‍රත්‍ය ශක්තීන් ලබාම පහළ වන හෙයින්, මොහොතක් හෝ පෙර පහළ වූ සිතක් නැති බවද, එකට උපදින, එකට පවතින, එකට නැසෙන ස්වභාවය චිත්ත චෛතසිකවල ස්වභාවය බවද දත යුතුය.

<u>එම පොතේ 98 පිටුවේ දේශනා කොටසක්.</u>

"කුසල ප්‍රීතිය පිරෙන්නේ කාය පස්සද්ධීන් - චිත්ත පස්සද්ධීන් පිරේ. පස්සද්ධිය පිරෙන්නේ කායික මානසික සැපය පිරේ.

සුඛං ගබ්භං ගන්හන්තං
තිවිදං සමාධිං පරිපූරෙති
ඛණික සමාධිං
උපචාර සමාධිං
අප්පණා සමාධිං

සැපය පිරෙන්නේ ත්‍රිවිධ සමාධිය පිරේ. එනම් ක්ෂණික, උපචාර, අර්පණා යන සමාධියි. එහි අර්පණා සමාධිය හැර ඉතිරි දෙක මේ කාමාවචර කුසල් සිත්හි වැඩෙති."

මෙම පොතේම 134 පිටුවේ සම්පජඤ්ඤය හතර කොටසකින් පෙන්වයි.

1. **සාත්ථක සම්පජඤ්ඤය**

   ගමන බිමන ආදී ක්‍රියා සාර්ථකද වැඩ සහිතද කියා වටහා දෙන නුවණයි.

2. **සප්පාය සම්පජඤ්ඤය**

   මේ වෙලාවේ මේ මේ කටයුතු කිරීම සුදුසුද කියා වටහා දෙන නුවණයි.

3. **ගෝචර සම්පජඤ්ඤය**

   ගෝචර යනු කර්මස්ථානයයි. භාවනාවයි. කර්මස්ථාන ගෝචරයෙහි භාවනාවට ඇතුලත් ක්‍රියා දැයි වටහා දෙන නුවණයි.

4. **අසම්මෝහ සම්පජඤ්ඤය**

   නාම රූප ධර්ම පිළිබඳ නුමුළා බව ඇති කරන විපස්සනා භාවනාවයි.

මෙම පොතෙහි 139 පිටුවේ මනසිකාරය පිළිබඳව විස්තර ඇත. මනසෙහි කිරීම මනසිකාරයි. විස්තර ඇත.

**සටහන**
**නීතිඥ චන්දන සිරිවර්ධන**






# සමාධිමය අත් බෙහෙත්...

වහරක අභයරතනාලංකාර හිමියන් ගිහි වතක සිටියදීත්, සමහර අවස්ථාවල ඉන් පසුවත්, ලෝක සත්ත්වයා කෙරෙහි දයානුකම්පාවෙන් ගිලානප්‍රත්‍ය කටයුත්තක් වශයෙන් සලකා බෙහෙත් සමාධියෙන් මතුකර දුන්, කිසිදු අතුරු ආබාධයකින් තොර ප්‍රත්‍යක්ෂ වටිනා බෙහෙත් කිහිපයක් පහතින් සටහන් කරනවා. මේ සියලු බෙහෙත් ඒ ඒ පුද්ගලයන්ගේ කර්ම ශක්තීන්ට යටත්ව ප්‍රත්‍ය වෙන බවත් සලකන්න.

## 1. පපුවේ සෙම ඉතිරිවී පිට නොවීම, පෙනහළුවල ඇදෙන සුළු බව අඩුවීම, බඩේ අජීර්ණ ආදිය සඳහා

පළමුව හොර ගහේ හොර කුරුල්ලෙකුගේ ඇට වේලගෙන පිටි කරගන්න. ඉන්පසු පිරිසිදු එළඟිතෙල්වලින් චූර්ණ පදමට අඹර ගන්න. අමු බෙලි කොළ හතක් නැටි ඉවත් කරල අරගෙන ඒවායේ උඩ පැත්තේ හෙවත් කොළය ගහට සවිවෙලා තියෙන ආකාරයට ගත්තම, කොළයේ මතුපිට දිලිසෙන පැත්තේ ආලේප කරන්න. දැන් මේ කොළ හතේ නැටි තිබුණ පැත්ත පහළට හිටින විදිහට තුනටිය දිගේ / කොඳු නාරටිය දිගේ පහළ සිට ඉහළට අලවන්න. එහා මෙහා යන්න පුළුවන් නිසා ආසාත්මික නොවන වර්ගයේ ප්ලාස්ටරයක් මතුපිටින් අලවන්න. මේ විදිහට හවස හයට අතුරල උදේ හයට ඉවත් කරල අයිස් වතුරෙන් හෝදන්න. ඒ විදිහට දින තුනක් හෝ සුව වෙනකල් කරන්න. එක වතාවකට බෙලි කොළ හත බැගින් වෙන වෙනම ගත යුතුයි. මේ මගින් පෙනහැල්ලේ, පපුවේ බැඳිල තියෙන සෙම හා බඩේ අජීර්ණ පවා සුව වෙලා පෙනහළු ප්‍රකෘතිමත් වෙනවා.

මේ බෙහෙත හදාගන්න ඉතාමත් පහසුයි. ලොකු වියදමක් වෙහෙස මහන්සියක් යන්නෙත් නෑ. ඉතාමත් කෙටි කාලයක් තුල හදාගන්න පුළුවන්. සාමාන්‍යයෙන් එක බෙලි කොළයකට තේ හැඳි භාගයක විතර පිටි අවශ්‍ය නිසා, කොළ හතටම එක වතාවකට තේ හැඳි තුනහමාරක් විතර තමයි අවශ්‍ය වෙන්නෙ. හොර කුරුල්ලන්ගෙ ඇටත් විවිධ ප්‍රමාණවලින් තියෙනවා. සාමාන්‍යයෙන් ලෙලි ගහපු කරුංක ගෙඩියක් තරම් හොර ඇට හත අටකින් පිටි තේ හැඳි හත අටක් විතර හදාගන්න පුළුවන්. ඇට ටික අරගෙන වේලගෙන මිශ්‍රණ යන්ත්‍රයකින් හෝ ඇඹරුම් ගලකින් හෝ කුඩුකර ගත්තම බොහොම පහසුවෙන් පිටි බවට පත්කර ගන්න පුළුවන්. හරියට කුරහන් පිටි වගේ. නමුත් ඊට වඩා තද පාටින් යුක්තයි. හොඳට වේලුනාට පස්සෙ තමයි පිටි වෙන්නෙ. වැඩිපුර ප්‍රමාණයක් පිටි බවට පත්කරගෙන හුළං නොවදින්න ඇසුරුම් කරල කාලයක් තියාගන්නත් පුළුවන්.

හැබැයි හොර කුරුල්ලා ගහෙන් වැටුණ විගසම ගන්න ඕන. මොකද නැත්නම් බොහොම කෙටි කාලයක් තුළ නරක් වෙනවා. ගෙඩිය උඩට හිටින්න වැටුනම වැස්සට පින්නට වතුර ඇතුලට ගිහින් ඉතා ඉක්මනට පුස් කන්න බලනවා, නරක් වෙනවා. ඒ වගේ **නරක් වෙච්ච ඒවා මේ බෙහෙතට යොදා නොගන්න විශේෂයෙන් සැලකිලිමත් වෙන්න ඕන.** ඒ නිසා හොඳම දේ තමයි, බිමට වැටිච්ච විගසම අහුලගෙන ඇට ටික ගලවගෙන වේලා ගැනීම. එහෙම නැත්නම්, වේලිච්ච ස්වභාවය එනකොට ගහේ තියෙද්දිම කඩාගන්න පුළුවන් නම් වඩා හොඳයි. එහෙමත් නැත්නම් සමහර අවස්ථාවල මේ හොර කුරුල්ලො පොත් සාප්පුවලත් ඇසුරුම් කරල පාසල් ළමයින් වෙනුවෙන් විකුණන්න තියෙනවා. හැබැයි ඒ විකුණන්නෙ බාහිර ස්වරූපය දැකබලා ගන්න නිසා, ඒවායේ ඇට නරක් වෙලා තිබීම ඒ අයට ගැටළුවක් නොවන නිසා, ඒවායෙත් බොහොමයක් ඇට නරක් වෙලා තියෙන්න පුළුවන්. ඒ නිසා පොත් සාප්පුවලින් මිලදී ගන්නව නම්, ඉස්සෙල්ලම හතරක් පහක් අරගෙන කඩල බලල හොඳ නම් විතරක් තෝරගන්න. ඒ වගේම සමහර සිංහල බෙහෙත් බඩු වෙළඳසැල්වලත් වියලි හොර ඇට මිලදී ගන්න තියෙනවා. ඒත් අර වගේ පරීක්ෂා කරල බලල හොඳ තත්වයේ පවතිනව නම් විතරක් මිලදී ගන්න. ඒ නැතත් වලපනේ, නාවලපිටිය, අකුරැස්ස, දෙනියාය, ගාල්ල, ඉංගිරිය, පාදුක්ක, පූගොඩ... ආදී බොහොමයක් තෙත් කලාපීය ප්‍රදේශවලින් පහසුවෙන් මේ හොර කුරුල්ලන් හොයාගන්න පුළුවන්.

මේ බෙහෙත පාවිච්චි කිරීමෙන් ප්‍රත්‍යක්ෂ ප්‍රතිඵල අත්කරගත්ත මහත්මයෙක් තමන්ගෙ අත්දැකීම මේ විදිහට විස්තර කළා.

මගේ පෙනහැල්ලෙ තුවාලයක් තිබුණා. ඒක සෙම නිසා හටගත්තු එකක්. විටින් විට තුවාල වෙලා ලේ එනවා. විශේෂඥ වෛද්‍යවරුන්ට පෙන්නුවම ස්කෑන් කරල බලල සැත්කමක් කරන්න කියල තමයි නිර්දේශ කළේ. මම ඒකට කැමති වුණේ නෑ. වහරක හාමුදුරුවො මතු කරල දුන්න මේ බෙහෙත හදාගෙන පළමු කොටස බුද්ධ පූජාවට තියල දෙවන කොටස වහරක හාමුදුරුවන්ගෙ නමින් පූජා කළා. ඊටත් පස්සෙ තමයි මම මේ බෙහෙත පාවිච්චි කරන්න පටන් ගත්තෙ. ඒ පාවිච්චි කරනකොටත්

වහරක හාමුදුරුවන්ගෙ ගුණ සිහි කරලයි පටන් ගත්තෙ. ඔය විදිහට එක දිගට මාස තුනක් කරල නැවතත් පරීක්ෂණවලට සහභාගි වෙලා ඒ වාර්තා අරගෙන වෛද්‍යවරුන්ට පෙන්නුවා. වෛද්‍යවරුන්ටත් පුදුමයි. ඒ අයටත් තෝරගන්න බෑ කොහොමද සුව වුනේ කියල. අන්තිමට සැත්කම නොකෙරෙන තැනට ආවා. කවුරුවත් විස්වාස කළේ නෑ මේ වගේ බෙහෙතකින් සුව වෙයි කියල. නමුත් මම ඒ බෙහෙතෙන් ප්‍රත්‍යක්ෂ ප්‍රතිඵල ගත්ත කෙනෙක්.

## 2. ඇදුම, හතිය, පෙනහැල්ලේ බැඳී ඇති සෙම, කල්ගිය අජීර්ණ සඳහා

මේ සඳහා පිරිසිදු අමු එළු බෙටි අවශ්‍යයි. ඒ කියන්නෙ පරණ නොවුන අලුත් ඒවා විය යුතුයි. ඒ විදිහට ලබාගත්ත එළු බෙටි, වැලි දූවිලි ආදිය තැවරිලා තියේනම් ඉවත් කරල, දෙහි ඇඹුලෙන් අඹරගෙන කෝපි ගෙඩි පමණට ගුලි කරල මඳ අව්වෙ තෙත ගතිය හිඳෙන මට්ටමට වේල ගන්න. උදේ, රාත්‍රී 1 බැගින් කෑමට පසු මාස තුන හතරක් විතර නොකඩවා ගන්න. සම්පූර්ණයෙන් සුව වෙනවා.

එළු බෙටිවල තනිකරම වගේ තියෙන්නෙ ශාක වර්ගවලින් එන පෝෂණය. හරි පහසුවෙන් හදාගන්න පුළුවන් බෙහෙතක්. සමහරු ඇදුමට, සෙමට හොඳයි කියල ගෙවල්වල එළුවෙක් දෙන්නෙක් ඇතිකරන අවස්ථාත් තියෙනවා. හැබැයි මේ බෙහෙත හදාගන්නකොට ගම්වල නිදැල්ලෙ ස්වභාවිකව හැදෙන කොළ වර්ග කකා ඇවිදින එළුවන්ගෙ බෙටි ගන්න පුළුවන්නම් තමයි වඩාත් හොඳ. මොකද නාගරිකව වාණිජමය වශයෙන් හදන ගොවි පොළවල්වල එළුවන්ට දෙන කෘත්‍රිම ආහාර වර්ග නිසා ඒ එළු බෙටිවල තියෙන ඖෂධීය ශක්තිය යම් කිසි විදිහකින් අඩුවෙන්න පුළුවන්. ඒ නිසා පුළුවන් තරම් ස්වභාවිකව හැදෙන එළුවන්ගෙ බෙටි ලබාගන්න උත්සාහ කරන්න.

මේ බෙහෙත සම්බන්ධයෙනුත් කලින් සඳහන් කළ මහත්මයාට හොඳ අත්දැකීමක් තියෙන නිසා ඒ ගැන මේ විදිහෙ විස්තරයක් කළා.

පපුවෙ සෙමට මේ බෙහෙත විශේෂයි. මගේ පපුවෙ බොහොම තදට තිබ්ච්ච සෙම මේ බෙහෙත ගන්නකොට හුඟක් අඩු වුණා. ඒ වගේම හතියත් අඩු වුණා. බොහොම ප්‍රතිඵලදායකයි. දවසක් වහරක හාමුදුරුවො එක්ක කතා කරනකොට උන්වහන්සේ තමයි කිව්වෙ මට මෙන්න මෙහෙම පෙනහළු ආබාධයක් තියෙනවා, ඒකට බෙහෙත් කරගන්න කියල. ඉතින් මට ඒ විපාකයට හේතුව පුද්ගලිකව අහගන්න බැරි වුනත්, දවසක් සාකච්ඡාවකදි කියවුනා, ඒ සඳහා පොදුවේ හේතු වන කර්ම වේගයක් ගැන. ඒ තමයි ඉත්තෑ ගෙවල්වලට දුම් ගැසීම. ඉත්තෑවො අල්ල ගන්න උන්ගෙ ගෙවල්වලට දුම් ගහනකොට එක ගුලක් ඇරල අනික් සියල්ලටම දුම් ගහනවා. එතකොට අර ඇරල තියෙන ගුලෙන් ඉත්තෑවො එළියට පනිනකොටම මිනිස්සු ගෝනියක් දාල ඒ සතාව අල්ල ගන්නවා. දුම් ගැහුවම තනිකරම ඒ සතාගෙ පෙනහළු තමයි හුස්ම ගන්න බැරිව ආසාදනය වෙන්නෙ. එතැනදි ඉත්තෑවන්ට අමතරව ඒ ගුල්වල ඉන්න තවත් පොඩි පොඩි සත්තුත් ඒ හේතුවෙන් මැරෙනවා. පෙනහළු ආශ්‍රිත අසනීප හැදෙන්න ඔය කාරණයත් හේතු වෙනව කියල වහරක හාමුදුරුවො ඒ සාකච්ඡාවෙදි කිව්වා. ඊට අමතරව සසරෙදි කරපු තවත් නොයෙක් කර්ම වේග හේතු වෙන්න පුළුවන්.

ඔය විදිහට මම ඒ රෝගයේ පොදු හේතුවක් දැනගත්තම, මේ බෙහෙත් ගන්න අතර හැමදාම පුන්‍යානුමෝදනාවකුත් කරනවා. ඒ කියන්නෙ මේ සසර ගමන එනකොට මේ වගේ විපාකයන්ට මම අකමැති වුනත් මට මෙහෙම රෝගයක් ඇවිත් තියෙනවා. සසර ගමනෙදි මගෙන් අන්‍ය සතුන්ට අවැඩ අසාධාරණ සිද්ධ වෙලා තියෙනවා. ඒක මම නිවැරදි කරගන්න ඕන. එතකොට **තමන්ගෙ අසනීපය සුව කරගන්න කියල නෙවෙයි, ඒ අසාධාරණයට වන්දි ගෙවල නිදහස් වෙන්න, ඒ වැරැද්ද නිවැරදි කරන්න, සසර පුරාවටම කරපු පුන්‍යකර්ම ඒ වැරදි අසාධාරණයන්ට ලක්වෙච්ච සතුන්ට පොදුවේ අනුමෝදන් කරනවා.** වහරක හාමුදුරුවො කිව්වට පස්සෙ, පුළුවන් හැම අවස්ථාවකම ඒ කාරණය සිහිපත් කරල කෙටියෙන් අනුමෝදන් කරල තමයි මම ඒ බෙහෙත් පාවිච්චි කළේ. ඒ නිසා මගේ අත්දැකීම තමයි, මේ රෝග සනීප වෙන්න බෙහෙත්වලට අමතරව සාසනික වත්පිළිවෙත් අවශ්‍යමයි කියන කාරණය. එහෙම නැත්නම් ලේසියෙන් හොඳ වෙන්නෙ නෑ. මොකද මේ වගේ රෝග කර්මය මුල් වෙලාමයි හටගන්නෙ.

ඒ නිසා බෝධි පූජාවක් කළත්, ලෙඩ සුව වීමේ අරමුණින් නෙවෙයි කළේ. යම් කිසි කරපු කර්මයක විපාකයක් ඇවිත් තියෙන නිසා ඒ වැරැද්ද නිවැරදි කරල වන්දි ගෙවල නිදහස් වෙන්න කියන අදහසින්මයි කළේ. මොකද අසනීපය සුව කරගැනීමේ අරමුණින්ම කළොත්, එතැනදි තමන්ගෙ වැඩේ කරගන්න අදහස මිසක්, අර වෙච්ච අසාධාරණයට වන්දි ගෙවන අදහසක් එන්නෙ නෑ. ඒ වගේම, එහෙම ලෙඩේ සුව වෙන්න කියන අදහසම ගත්තම ඒකෙන් සුව නොවුනොත්, කෙනෙක් වැරදි වැටහීමක් ඇතිකර ගන්න පුළුවන්, සාසනික වත්පිළිවෙත්වලින් වැඩක් වුනේ නෑ කියල. ඉතින් මගේ අත්දැකීම තමයි, ඒ අදහස අරගෙන කැපවීමෙන් සාසනික ප්‍රතිකර්මත් කරන ගමන් මේ බෙහෙත් පාවිච්චි කළොත්, කර්ම විපාකත් ගෙවිල ඒ වගේ කර්මජ රෝග පවා පහසුවෙන් සුව කරගන්න පුළුවන් කියන කාරණය.

මේ කාරණය වහරක හාමුදුරුවො ගිහි වතේ ඉඳගෙන බෙහෙත් හේත්, ප්‍රතිකර්ම ආදිය කරනකොටත් අනුගමනය කරල තියෙනවා. ඒ සම්බන්ධයෙන් ඒ කාලයට ගැලපෙන විදිහට, එදා ඒ පිහිට බලාපොරොත්තුවෙන් පැමිණි පින්වතුන්ගේ දැනගැනීම පිණිස උන්වහන්සේ විසින් තබන ලද සටහනක් පහතින් සඳහන් කෙරෙනවා. ඒ අනුසාරයෙන් අදත් ඒ විදිහෙ සාසනික ප්‍රතිකර්ම සිද්ධ කරල කර්මවේග ගෙවා ගන්න පින්වතුන්ට පුළුවන්.

"මෙම ස්ථානයෙන් පිහිට බලාපොරොත්තුවෙන් පැමිණෙන පින්වතුන්ට විශේෂයෙන් දැනගැනීම සඳහායි. **මෙහි සෑම ප්‍රතිකර්මයකටම පින සහ කුසලය ප්‍රධාන වේ. එම පුන්‍ය ශක්තිය සහ කුසල ශක්තිය ලබාගැනීමට පූජා තැබීමත්, සීල සංවරයත් අත්‍යවශ්‍ය වෙයි.**

## පූජා තබන පිළිවෙල

පළමුව දොළොස් මහේ පහනට පොල්තෙල් බෝතල් භාගයක් පූජා කළ යුතුයි. බුද්ධ පූජාව සඳහා ප්‍රමාණවත් නොඉඳුල්ව උයාගත් බත් මුලක්ද, අතිරේක වශයෙන් බත් මුල් තමන්ට හැකි ප්‍රමාණයක්ද, පළතුරු, කැවිලි, දැහැත්, බෙහෙත් ඖෂධ, තැඹිලි යන මේවායින් තමන්ට හැකි විදිහකට පූජාව සඳහා රැගෙනවිත් සෙත ශාන්තිය වර්ධනය කරගෙන සැනසෙන්න."

ඒ දවස්වල සෙනසුරාදා විශේෂ සෙත් ආශිර්වාද බුද්ධ පූජා තුනකට සහභාගි වුණාට පස්සෙ තමයි කෙනෙකුට බෙහෙත්හේත් ප්‍රතිකර්ම ආදිය ලබා දීල තියෙන්නෙ. මොකද කර්ම දෝස ගෙවාගෙන සාසන

ගුණයට ඇතුල් වෙලා බෞද්ධත්වය තුල කටයුතු කරනකොට අපල උපද්‍රව දුරුවෙලා ලෙඩ රෝග සුව වෙන්න හේතු වෙනවා.

ඒ වගේම එදා සියළු දෙනාම රැගෙන එන නොඉඳුල් බත් මුල් සහ පළතුරු කැවිලි තැඹිලි ආදියේ අග්‍ර කොටස වෙන් කරල බුද්ධ පූජාවට තියනවා. ඒ වගේම සාමාන්‍යයෙන් ඖෂධ වර්ග බුද්ධ පූජාවට විතරක් තියල, පළතුරු කැවිලි දැහැත් තැඹිලි ආදියේ ඉතිරියත්, අතිරේක බත් මුල් සියල්ලමත් සමග එකට තියල සෙත් කරල සියළු දෙනාටම ආශිර්වාද කරල ඒවායේ මුල් කොටස සහභාගි වෙච්ච භික්ෂූන් වහන්සේලාට පිරිනමනවා. ඊළඟට ගුණවතුන්ට සහ අනෙක් පිරිස වෙනුවෙන් නිදහස් කරනවා. ඉතින් පිරිස තමන්ට පුළුවන් විදිහට බත් මුල් වශයෙන් හෝ වෙනත් භාජනවල අසුරල හෝ පහසු විදිහට ගෙනත් පූජාවට සම්බන්ධ කරන සරළ ක්‍රමවේදයක් තමයි එදා තිබිල තියෙන්නෙ.

## 3 ආහාර රුචිය සඳහා

එළු බෙටිවලින් හදන තවත් ප්‍රත්‍යක්ෂ බෙහෙතක් තමයි මේ. හැබැයි මේ බෙහෙතට යොදා ගන්නෙ වියලි එළු බෙටි. වියලි එළු බෙටි ග්‍රෑම් 500 ක් පැය භාගයක් විතර වණ්ඩුවේ තම්බගෙන, බ්‍රැන්ඩි මිලි ලීටර 150 යි, පිරිසිදු පොල් විනාකිරි මිලි ලීටර 150 යි එකතු කරල අඹර ගන්න. (වතුර මදි නම් උණු වතුර නිවාගෙන අවශ්‍ය පමණට එකතු කරගන්න.) කෝපි ගෙඩි පමණට ගුලි කරගෙන හෝ ඒ ප්‍රමාණයම පෙති විදිහට හෝ හදාගෙන වේල ගෙන උදේ, දවල්, රාත්‍රී ආහාරයට පැය කාලකට පෙර 1 බැගින් සති තුනක් ගන්න. ආහාර රුචිය වැඩෙනවා.

## 4 ගෙල වේදනා සමන චූර්ණය

වියලි වෙනිවැල්ගැට කිලෝ 3 යි. පෙරුම්කායම් කුඩු ග්‍රෑම් 250 යි. කුඩලු දෙහි ඉස්ම බෝතල් භාගයක් (½) හෝ තිප්පිලි කුඩු ග්‍රෑම් 125 ක් දැමූ දෙහි ඇඹුල් බෝතල් භාගයක් (½), අමු මුරුංගා මුල් කිලෝ 1 යි, පැලපී ඉස්ම බෝතල් 2 යි, කළු වෙන්න පුච්චා ගත් / බැද ගත් පොල් කිලෝ 2 ක් හෝ කළු වෙන්න බැද ගත් පුන්නක්කු කිලෝ 2 යි, තල් සූකිරි කිලෝ 5 යි, අමු බෙලි ගෙඩි කිලෝ 6 ක් වණ්ඩුවේ තම්බගෙන බෙලි මදය මඳ උණු වතුර අවම ප්‍රමාණයකින් මිරික ගෙන රොඩ්ඩ ඉවත් කිරීමෙන් පසු එන දියරය. (ඉදිච්ච බෙලි ගෙඩි නම් තම්බා නොගෙන මදය අරගෙන නිවාගත් උණු වතුර අවම ප්‍රමාණයකින් මිරික ගන්න). වතුර වැඩි වුනොත් බස්සව ගන්න හුඟක් වෙලාව යන නිසා පුළුවන් තරම් වතුර අඩුවෙන් එකතු කරන්න.

වෙනිවැල් ගැට කුඩු කරල පෙනේරයකින් හලාගෙන, මුරුංගා මුල් ටිකත් සිනිඳුවට අඹරගෙන සියල්ල හොඳින් මිශ්‍ර කරල තැඹිලි වතුර බෝතල් හතරකුත් එකතු කරල මිශ්‍ර කරල ලිපේ තියල රත් කරල චූර්ණ පදමට ආවම බාගන්න.

චූර්ණයෙන් මේස හැඳි භාගයක් (½) උදේට, හවසට, රාත්‍රී නින්දට පෙර අරගෙන වතුර ටිකක් බොන්න. ඒ විදිහට මාස එකහමාරක් පමණ ගැනීම ප්‍රමාණවත්.

මේ මගින් පිටියුටරි, තයිරොයිඩ් ග්‍රන්ථි නිරෝගී වෙනවා. බෙල්ලේ, පපුවේ සෙම් හිර ආබාධ දුරු වෙනවා. ලේ නහර ප්‍රකෘතිමත් වෙලා ගෙල වේදනා සමනය වෙනවා. අතපය, කොන්දෙ කැක්කුම, තුනටියේ ආබාධ දුරු වෙනවා.

## 5. ඇහැල අරිෂ්ටය

ඇහැල ගහේ කොළ, දළු, මල්, මුල්, පොතු අමු බරින් ග්‍රෑම් 375 බැගින්, නෙල්ලි, පෙති පුවක්, හීන් උඳුපියලි වියලි බරින් ග්‍රෑම් 125 බැගින්. මේවා කොටාගෙන වතුර බෝතල් 15 ක් එකතු කරල 12 ට හිඳගෙන පෙරා ගෙන, සම්පූර්ණයෙන්ම නිවුනට පසු පිරිසිදු මී පැණි මි. ලී. 312 ක් සහ පිරිසිදු කිතුල් පැණි මි. ලී. 1187 ක් දමා දින 21 ක් තියල අරිෂ්ට කර ගන්න.

උදේ, දවල්, රාත්‍රී ආහාරයට පෙර මේස හැඳි එකහමාර බැගින් මාසයක් පමණ ගන්න. මේ මගින් නින්ද නොයාම, නිදිමත ගතිය, ඇස්වල කන්වල ආබාධ, උගුර කට වේලීම සුව වෙනවා. උණ ආබාධ සුව වෙනවා.

## 6 ස්නායු වැඩීමට හිසට දැමීම සඳහා තෙලක්

ඉඟිනි ඇට, පත්පාඩගම්, පිච්ච මුල්, කොහොඹ පොතු, කොහොඹ දළු එකකින් කලං 8 බැගින්, පිරිසිදු තලතෙල් බෝතල් භාගයයි (½), පිරිසිදු පොල්තෙල් බෝතල් 1 යි දමා හිඳෙන කොට සූදුරු, කරපිංච, පෝට ගෙඩි, බැවිල මුල් කලං 1 බැගින් අඹරගෙන තෙලටම දමා සම පාකයට හිඳගන්න. උදේට හිසට දමන්න.

## 7. තුනටිය වේදනාවට

රත්හඳුන්, කොල්ලු, සතකුප්ප, වැල්මී, රට අඹ ගහේ පොතු, කැලෑ දෙල් මුල්, වෙනිවැල් ගැට, දෙහි ගහේ පොතු, තිප්පිලි, නික කොළ, සුදුළූණු කොටාගෙන පොට්ටනි බැඳල රත් කරගෙන තවන්න.

(මෙහි සඳහන් ආහාර රුචිය සඳහා වන බෙහෙත සහ ගෙල වේදනා සමන චූර්ණය දැනට වහරක අරිය චින්තාශ්‍රම බෞද්ධ විහාරස්ථානය මුල් කරගෙන පැවැත්වෙන වෛද්‍ය සායනවලින් ලබාගන්න පුළුවන්.... විමසීම - 0773108516, 0717122001, 0771620072)

**සටහන**

**නීතිඥ චන්දන සිරිවර්ධන**

## හෙළ බොදු පියුම දහම් සඟරාවේ මංගල කලාපයේ දෙවන සංස්කරණය සඳහා ශ්‍රමය හා මූල්‍යමය දායකත්වය සැපයූ පිංවතුන්


ශ්‍රම දායකත්වය

■ ධම්මික සේනාධීර මහතා - හසරු ප්‍රින්ටර්ස් - මාලබේ ■ චන්දන සිරිවර්ධන මහතා - අලපලාදෙනිය ■ චතුර හිඳුරංගලගේ මහතා - නුගේගොඩ ■ අමිත් සමරනායක මහතා - බෙල්ලන්තර ■ සඳරුවන් පෙරේරා මහතා සහ මාරියස් පෙරේරා මහතා - මොරටුව ■ ෆික්රි ඉස්මයිල් මහතා - ගොතටුව ■ සුජීවනී ජයවර්ධන මෙනවිය - පාදුක්ක ■ කැලුම් ලංකේෂ්වර මහතා - ගාල්ල ■ ඉමාෂි මුද්‍රණාලයේ අධිපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලය ■ නන් අයුරින් දායක වූ පින්වතුන්

මූල්‍යමය දායකත්වය

■ සනත් දයාප්‍රේම මහතා, රේණුකා ජයවර්ධන මහත්මිය, අනුක් දයාප්‍රේම පුතා, සෙලෝමී දයාප්‍රේම දුව, මහේන්ද්‍ර ජයවර්ධන මහතා, සමන්තා සේනානායක මහත්මිය සහ යතික ජයවර්ධන පුතා - ඇමරිකාව - රු. 35,000/- ■ ප්‍රියනාත් ආරියරත්න මහතා ඇතුළු පවුලේ සැම - කුරුණෑගල - රු.30,000/- ■ දේශානි චතුන්දි රණවක මෙනෙවිය - ඕස්ට්‍රේලියාව, ශාන්තා හොරඳුගොඩ රණවක මහත්මිය - රත්මලාන - රු.25,000/- ■ ශානක ද සිල්වා මහතා, චරනි ද සිල්වා මහත්මිය, රහල් ද සිල්වා පුතා,

ගනිඳු ද සිල්වා පුතා, දෙව්රු ද සිල්වා දුව - දෝහා කටාර් - රු. 24,650/- ■ සමන්ත දියෝගබදු මහතා, ගයනී ජයවර්ධන මහත්මිය, නිම්හාන් දියෝගබදු පුතා, ඩිලාරා දියෝගබදු දුව - ඩුබායි, ඒ. ඩී. කේ. පියසීලි ජයවර්ධන මහත්මිය, ඉනෝකා ජයවර්ධන මහත්මිය, අකීෂා සමරවීර දුව, අශෝක ජයවර්ධන මහතා සහ චමිලා වික්‍රමආරච්චි මහත්මිය, ඒ. ඩී රූපා පෙරේරා මෙනවිය - නුගේගොඩ, ජී. එච්. ටී. චන්ද්‍රාවතී මහත්මිය - කළුතර - එච්.පී. සෙන්දිරියා මහතා, එච්.පී. කුසුමාවතී මහත්මිය, එච්.පී. කරුණාවතී මෙනෙවිය, එච්. පී. සෝමාවතී මෙනෙවිය - යටියන්තොට රු. 23,000/- ■ තුසිත නාකන්දල මහතා, සරූපා නාකන්දල මහත්මිය, දෙවින්යා දුව - ගල්කිස්ස - රු. 20,000/- ■ චතුර හිඳුරංගලගේ මහතා, නදීරා අරම්පොල මහත්මිය, තනුරි හිඳුරංගලගේ සහ සනුරි හිඳුරංගලගේ යන දියණියන් - නුගේගොඩ - රු. 20,000/- ■ නිලක්ෂි වීරකෝන් මහත්මිය - මාලබේ - රු. 15,000/- ■ සිතිර නරසිංහ මහතා, අචනා ගුණරත්න මහත්මිය, තරුෂ නරසිංහ පුතා, මිහෙලි නරසිංහ සහ සෙනුලි නරසිංහ යන දියණියන් - පන්නිපිටිය - රු. 10,000/- ■ සමන් සිල්වා මහතා - කළුතර - රු. 10,000/- ■ ජී. ධර්මසේන මහතා සහ කරුණා ධර්මසේන මහත්මිය ඇතුලු පවුලේ සැම - හෝමාගම -රු. 10,000/- ■ විරංගයා සෙනෙවිරත්න මහත්මිය සහ ශ්‍රීමතී විජේරත්න මහත්මිය - මහනුවර - රු. 10,000/- ■ චාරුත බණ්ඩාර මහතා සහ තිමිර බණ්ඩාර මහතා - ඇමරිකාව - රු. 8,880/- ■ නැසීගිය ලලිතා විමලසිරි සල්පගේ මහත්මියට පිං පිණිස - රු. 8,880/- ■ තිළිණ විජේරත්න මහතා සහ පවිත්‍රා දැදිගම මහත්මිය - ඇමරිකාව - රු. 5,330/- ■ බුද්ධික බණ්ඩාරනායක මහතා සහ දිස්නා බණ්ඩාරනායක මහත්මිය ඇතුළු පවුලේ සැම - ඇමරිකාව - රු. 5,330/- ■ කෝසල ජයතිලක මහතා, වින්දයා රත්නායක මහත්මිය - ඇමරිකාව - රු.5,330/- ■ එරන්ද මලිගස්පේ මහතා, වෛද්‍ය නිලූපා ගස්පේ මහත්මිය, කිවේන් මලිගස්පේ පුතා - ඇමරිකාව - රු. 5,000/- ■ ගයාන් පුෂ්පික ඉන්ද්‍රජිත් ලොකුමාන්න මහතා, හිරෝෂානි ලොකුමාන්න මහත්මිය, සෙනුත් ලොකුමාන්න පුතා, කෙනුලි ලොකුමාන්න දුව - ගල්කිස්ස - රු. 5,000/- ■සොනාලි සමරදිවාකර මෙනවිය - මහරගම - රු. 5,000/- ■ නිමල් මහතා ඇතුළු පවුලේ සැම - වැකඩ, පානදුර - රු. 5,000/-■පුලස්ති විරංග නාඹටුන්න මහතා -ඕස්ට්‍රේලියාව- රු.5000/- ■ සුජීවනී ජයවර්ධන මෙනවිය - පාදුක්ක - රු. 5,000/- ■ නිමාලි ජයසිරි මහත්මිය - රු.5,000/- ■ සුරංග කස්තුරිආරච්චි මහතා, මයුරි මධුෂිකා නානායක්කාර මහත්මිය, සනුජනා කස්තුරිආරච්චි සහ මිහෙලි මෙත්රදී කස්තුරිආරච්චි යන දියණියන් - කිරිබත්ගොඩ - රු. 5,000/- ■ රවී අමුණුගම මහතා සහ හේමාලි අමුණුගම මහත්මිය - - ඇමරිකාව - රු.4,440/- ■ සී. වීරසිංහ මහතා - රු. 4,000/- ■ හර්ෂ අමරසේකර මහතා සහ උදුම්බරා රත්නායක මහත්මිය ඇතුළු පවුලේ සැම - ඇමරිකාව - රු. 3,550/- ■ විමුක්ති සෙනෙවිරත්න මහතා සහ ජයමිණි ජයවර්ධන මහත්මිය - ඇමරිකාව - රු. 3,550/- ■ අයේෂ් ගුණවර්ධන මහතා සහ නිරාෂා පෙරේරා මහත්මිය - ඇමරිකාව - රු. 3,550/- ■ නිශාන්ත ජයවර්ධන මහතා සහ කවින්දයා සේනානායක මහත්මිය - ඇමරිකාව - රු. 3,550/- ■ කරගම්පිටිය ශාස්ත්‍රානන්ද පිරිවෙන් විහාරස්ථානයේ සදහම් වැඩසටහනට සහභාගිවන පින්වතුන් - රු. 3,000/- ■ ජනක හපුආරච්චි මහතා ඇතුළු පවුලේ සැම - ගිනිගත්හේන - රු. 3,000/- ■ කේ. එම්. සමන්ත ප්‍රදීප් මහතා - කඹුරුගමුව, මාතර - රු. 3,000/- ■ නිශාන්ති ද සිල්වා මහත්මිය - මොරටුව - රු. 3,000/- ■ ගුණපාල ඉද්දගොඩ මහතා - විජේරාම - රු. 3,000/- ■ මනෝජ් ජයසූරිය මහතා ඇතුළු පවුලේ සැම - මහරගම - රු. 3,000/- ■ ජේ. එම්. ඒ. බණ්ඩාර මහතා, වී. එස්. ජයතිලක මහත්මිය, ජේ. එම්. ඕ. නවින්දයා බණ්ඩාර දුව - නුවර - රු. 3,000/- ■ යෙනිකා කුමාරි මහත්මිය - එක්සත් රාජධානිය - රු. 3,000/- ■ ටී. ටී. පී. සිල්වා මහත්මිය - නාගොඩ, කළුතර - රු. 2,500/- ■ සංජීව පද්මනාත් මහතා ඇතුළු පවුලේ සැම - කහතුඩුව, සුමුදු විද්‍යාලංකාර මහතා ඇතුළු පවුලේ සැම - රද්දොළුගම, චමිල වික්‍රමාරච්චි මහතා ඇතුළු පවුලේ සැම - හෝකන්දර - රු. 2,500/- ■ ඩී.ඩී. විතාරණගේ මහතා ඇතුළු පවුලේ සැම - නුගේගොඩ - රු. 2,500/- ■ ඉසුරු ගාල්ලගේ මහතා සහ මේනකා ශාන්තිනී මහත්මිය - කඩවත - රු. 2,500/- ■ එච්. එස්. අරම්පොල මහතා ඇතුළු පවුලේ සැම - ඇමරිකාව - රු. 2,500/- ■ රංජිත් වික්‍රමසිංහ මහතා, උවිඳි වික්‍රමසිංහ මෙනෙවිය - කඩිගමුව, කුමාරි ගොඩවිට මහත්මිය - කුරුණෑගල - රු. 2,500/- ■ විපුල සංජීව මහතා ඇතුළු පවුලේ සැම - හෝමාගම - රු.2,500/- ■ දීපාල් කරුණාතිලක මහතා සහ මිහිරි කරුණාතිලක මහත්මිය - ඕස්ට්‍රේලියාව - රු. 2,500/- ■ නැදිමාල ශ්‍රී සෝමානන්ද විහාරයේ සදහම් වැඩසටහනට සහභාගී වන පින්වතුන් - රු. 2,000/- ■ ගයාන් දසනායක මහතා - ඕස්ට්‍රේලියාව - රු. 2,000/- ■ සුදන්ත සූරියබණ්ඩාර මහතා සහ ඉරේෂා සූරියබණ්ඩාර මහත්මිය - ඕස්ට්‍රේලියාව - රු. 2,000/- ■ එන්. ජී. ජයතිලක මහතා සහ එන්. ජයතිලක මහත්මිය - මහනුවර - රු. 2,000/- ■ ජයනාත් සුබසිංහ මහතා, දුලීකා වත්සලා ගුණවර්ධන මහත්මිය -හෝමාගම - රු.2000/- ■ Miss Lei Shwe Yee - Myanmar - Rs.2,000/- ■ නම සඳහන් නොකළ පිංවතෙක් - නාරාහේන්පිට - රු. 2,000/-■ බණ්ඩාර මහතා, චතුරංග බණ්ඩාර මහතා - කළුතර - රු.1600 ■අයිරාංගනී තිලකරත්න මහත්මිය - නාවල - රු. 1,500/- ■ ඩබ්. එම්. විජේසූරිය බණ්ඩාර මහතා සහ දිලීනා දීපිකා කුමාරි බණ්ඩාර මහත්මිය ඇතුළු පවුලේ සැම - හසලක - රු. 1,200/- ■ එස්. ප්‍රසන්න ප්‍රියදර්ශන සිල්වා මහතා සහ මධුෂිකා ලක්මුතු පියදිගම මහත්මිය - ගල්කිස්ස - රු. 1,200/- ■ නම සඳහන් නොකළ පිංවතෙක් - මාරවිල- රු. 1,001/- ■ ජගත් විජේසිංහ මහතා ඇතුළු පවුලේ සැම - බත්තරමුල්ල - රු. 1,000/- ■ සුනීතා බුලත්සිංහල මහත්මිය - ඕමානය - රු. 1,000/- ■ අමිල සල්ගාදු මහතා සහ කාන්ති ඒකනායක මහත්මිය - බෝමිරිය - රු. 1,000/- ■ උපුල් ජයරත්න මහතා සහ ගිහානී ජයරත්න මහත්මිය - ඕස්ට්‍රේලියාව - රු. 1,000/- ■ ශ්‍යාමල් බණ්ඩාර මහතා - කුරුණෑගල - රු. 1,000/- ■ සී. එම්. පී. සී. ලක්රුවන් මහතා - කළුතර - රු. 1,000/- ■ මෝක්ෂර තිලකසිරි පුතා - බැලුම්මහර - රු. 1,000/- ■ සමෘද්ධි තිලකසිරි පුතා - බැලුම්මහර- රු. 1,000/- ■ පද්මිණී සේනානායක මහත්මිය - කළගෙඩිහේන - රු. 1,000/- ■ දර්ශිකා විජේරත්න මහත්මිය - තලවතුගොඩ - රු. 1,000/- ■ ඩබ්. චන්ද්‍රරත්න මහතා ඇතුළු පවුලේ සැම - පාදුක්ක - රු. 1,000/- ■ නිලන්ති දාබරේ මහත්මිය - පිටකෝට්ටේ - රු. 1,000/- ■ ලලනී ජයරත්න මහත්මිය - නුගේගොඩ - රු. 1,000/- ■ පැතුම් ශානුක ලොකුගේ මහතා - පාදුක්ක - රු. 1,000/- ■ ඒ. දිලාන් නුවන් පුතා- ස්කොට්ලන්තය - රු. 1000/- ■ එස්.ඩී. සමීර සුමිත් කුමාර මහතා සහ කේ.ඒ. දිලීනා සඳරුවනි මහත්මිය ඇතුළු පවුලේ සැම - කඹුරුපිටිය - රු. 1,000/- ■ එම්.එල්.එම්. සුමනසූරිය මහතා, සෙනෙහෙලතා මහත්මිය, දර්ශන මධුසංක පුතා, සසිඳු දුල්සික පුතා - වේවැල්දෙනිය - රු. 1,000/- ■ එච්.කේ.ඒ. රසිකා මාධවී මහත්මිය - පිළියන්දල - රු.1,000/- ■ මිහිඳි ලාවන්‍යා මෙනෙවිය - දොඩම්වල - රු. 1,000/- ■ කෞෂල්‍යා ප්‍රේමචන්ද්‍ර මහත්මිය - මහනුවර - රු. 1,000/- ■ උපුල් විජේනායක මහතා ඇතුළු පවුලේ සැම - මාවනැල්ල, චාන්දනී සමරකෝන් මෙනවිය - කන්තලේ, ඉසුරු සේනාරත්න මහතා - පිටකෝට්ටේ, - එකතුව - රු. 1,720/- ■ එකතු වූ සියලු මුදල් පරිත්‍යාග - රු. 415,261/- ■ පළමු පිටපත් 10,000 සඳහා මුද්‍රණ වියදම රු. 285,100/- ■ අනෙකුත් වියදම් - 8,284/- ■ සම්පූර්ණ වියදම - රු.293,384/- ■ එක් පිටපතක නිෂ්පාදන වියදම - රු. 29.33/- ■ඉතිරි සියලු මුදල් පරිත්‍යාග නැවත මුද්‍රණ කටයුතු සඳහාම යොදවනු ලැබේ.

**ඉහත නම් සඳහන් පිංවත් පිරිස ඇතුළු ආධාර උපකාර කළ සියලු දෙනා සිදු කරගත් මේ පුණ්‍ය කුසල ආශිර්වාද හේතු කොටගෙන, අනන්ත සසරේ පටන් මේ දක්වා තම තමන් අතින් අවැඩ, අසාධාරණ, වැරදි, ප්‍රමාද දෝසවලට ලක් වූ සියලු දෙනාට මෙන්ම උදව් උපකාර කළ සැමටත්, මියගිය සතර වරිගයක ඥාති මිත්‍රාදීන්ටත් මේ පුණ්‍ය කුසල ආශිර්වාද විහිදී පැතිරී පිහිටා සුගතිගාමීව සම්දිටු ගුණ පහළ කරගෙන තම තමන්ගේ පැතුම් පරිදි නිර්වාණාවබෝධයටද හේතු වාසනා වේවා! එම ආධාර උපකාර කළ පිංවත් පිරිස් ඇතුළු සිය පවුල්වල සැමටත්, නිදුක් නිරෝගී සුවය ලැබී, කරන කියන යහපත් රැකී රක්ෂා ව්‍යාපාර ආදියෙන් සියලු ජයග්‍රහණයන් අත් වේවා. දූ දරුවන්ගේ අධ්‍යාපන ආදී කටයුතුවලින් විශිෂ්ඨ ජයග්‍රහණ අත් වී සුචරිත පිරිසක් වී සියලු අභිවෘද්ධිය උදා වේවා!**

---

# පින්වත් ඔබ වෙනුවෙන් එළි දැක්වූ දහම් ගබඩාවන්...


**www.waharaka.com  webmaster@helabodhupiyuma.net**

**071 3046895 / 0775003411/ 036 2267111 / 076 8092008 / 076 3639891**


**සැඟවුණු බොදු මග යළි විවර කරමින් වහරක අරිය චින්තාශ්‍රම බෞද්ධ විහාරස්ථානයේ සදහම් වැඩසටහන් පැවැත්වෙන කාල හෝරාවන්:**

සෑම පුන් පොහෝ දිනකම සහ සෑම අමාවක පොහොය දිනකම පෙ. ව. 8.00 සිට සවස 5.00 දක්වා - පෙහෙවත් සමාදනය, දහම් සාකච්ඡා සහ විශේෂ පුණ්‍යානුමෝදනාව. සෑම මසකම 1 වන සහ 3 වන සෙනසුරාද ආශිර්වාද පූජාව සහ ධර්ම සාකච්ඡාව පෙ. ව. 8.00 සිට ප. ව. 4.00 දක්වා, 2 වන, 4 වන සහ 5 වන සෙනසුරාද භාවනා වැඩසටහන පෙ. ව. 9.00 සිට ප. ව. 4.00 දක්වා

**ගමන් මාර්ගය: නිට්ටඹුව - රුවන්වැල්ල ප්‍රධාන මාර්ගයේ ගෝණගල්දෙනිය හන්දියේ සිට වහරක අතුරු මාර්ගයේ මීටර 350 ක් පමණ දුරින් දකුණුපස.**

---

# සියවස් ගණනාවකට පෙර සැඟව ගිය නිමල බොදු මග යළි පුබුදුවමින්,

හෙළ බොදු පියුම දහම් කරුණු ඔබ වෙත රැගෙන එන්නේ, බුදු පියාණන් වහන්සේ අනුදැන වදාළ, අග්ගඤ්ඤ සූත්‍රය, නිරුක්තිපථ සූත්‍රය සහ අරණවිභංග සූත්‍රය යන සූත්‍රාන්තයන්ට අනුව, දහම් පදවල සැඟවුණු දහම් අරුත් මතු කරන පද නිරුක්ති සහ අතීතය, වර්තමානය, අනාගතය හඟවන තුන්කල් නිරුක්ති සහිත ව්‍යවහාර ශබ්ද නිරුක්ති ක්‍රමවේදය අනුව මිස, උන්වහන්සේ අනුමත නොකළ ලිඛිත භාෂා රීති සහිත බමුණන්ගේ ත්‍රිවේද නිරුක්ති මත නොවන බව සලකන්න.

---

# හෙළ බොදු පියුම දහම් සඟරාව දැනට ලබාගත හැකි ස්ථාන:

■ චන්දුල වෙළඳ විමන, අංක 104, හයිලෙවල් පාර, මහරගම 077 7258851 ■ හසරු ප්‍රින්ටර්ස් - මාලබේ. (071 4220558 / 011 2744308) ■ දේශීය ස්ටෝර්ස්, ලංකාදීප අලෙවි නියෝජිත, හපුතලේ පාර, වැල්ලවාය - 0775532694, 0718375871 ■ පිනැකල් නෙට් - හයිලෙවල් පාර, ගොඩගම - 011 2895132 ■ තුෂාරා ෆැෂන් - හයිලෙවල් පාර, හෝමාගම - 011 2857572 ■ තුෂාරි සාරි සෙන්ටර් - කොළඹ පාර, පාදුක්ක - 076 6114237 ■ සෙනාරෝ සෙන්ටර් - අංක 35, රාජගිරිය පාර, රාජගිරිය - 077 6485577 ■ සීදේවි හෝටලය, වේයන්ගොඩ පාර, කිරිඳිවැල - 071 0118101 ■ කුමාරිහ් අයන් වර්ක්ස් - 209 ඒ, ගලහිටියාව, ගනේමුල්ල - 076 9604682, 0786949860 ■ පෝලර් රීජන්ස්හ් 402 සී, ගාලු පාර, පානදුර- 038 2235369 ■ සුධීර කොමිනිකේෂන්, පිටිගල පාර, පැලවත්ත - 071 2103177, 075 2679202 ■ සහන ෆාමසි - මූණගම, හොරණ - 071 2608776 ■ ස්ටුඩියෝ සෙවන් සීරෝ, තවලම හන්දිය, තවලම (ඉන්ධන පිරවුම් හල අසළ) 071 5827923 ■ ගේට්වේ අධ්‍යාපන ආයතනය - කලේගාන, ගාල්ල - 091 2242610 ■ නිව් මෙට්‍රෝ කම්පියුටර්ස් - කාලිදස මාවත, මාතර - 041 2225118 ■ හෙළ බොදු සිසිල සෙනසුන - මුරුතමුරේ, හක්මන - 041 3021878 ■ මෝලෙ කඩේ - මුදුන, වලස්මුල්ල - 071 1662643 ■ රාජපක්ෂ වෙළඳසැල - බැද්දෙගෙදර, මිද්දෙණිය පාර, වීරකැටිය - 071 2136329 ■ සංජීව සුපර් ග්‍රොසරි - ප්‍රධාන වීදිය, බඩල්කුඹුර 075 5863883, 055 2250051 ■ ශ්‍රීපති පික්චර් පැලස්, අවිස්සාවේල්ල පාර, නවගමුව - 0717360875, 0718375871 ■ සොබා දහම් ගොවිපොළ, සණස, උකුවෙල, මාතලේ - 066 2244061 ■ චන්දුල වෙළඳ විමන, අංක 124, කෙලින් වීදිය, මාතලේ - 077 3632966 ■ ඒකනායක මන්තින්දාරාමය - ඉහළගම, මහඋඩගම, ගම්පොළ, නුවර - 077 541 64 61 / 081 020 57572 ■ අමිල ට්‍රේඩර්ස්, අංක ඩී1, ඒ. ඒ. ධර්මසේන මාවත, මහනුවර - 075 7246797 ■ අරිය චින්තාශ්‍රම හෙළ බොදු සෙනසුන, බාලදක්ෂ මාවත, ගල්කඩවල, අනුරාධපුර - 076 6442125 ■ අරි සිතුම් අරණ දහම් මැදුර, දේවගිරිපුර, ගල්ගමුව - 071 1211876 ■ හොරණ වාසනා බේකර්ස්, මැදවච්චිය (ඔරලෝසු කණුව ඉදිරිපිට) - 071 8375871 ■ ප්‍රජාපතී ගෝතමී ආරාමය, පහලගම, සියඹලන්ගමුව, මාස්පොත - 037 4902817 ■ පිවිතුරු අරණ සෙනසුන - කට්ටකඩුව, ආඬියාගල, දඹුල්ල - 025 5789988 ■ සීගිරි පොත්හළ, පොළ හන්දිය, මහව - 077 6243804 ■ රුහුණු ෆුඩ් ලයින්, අංක 05, හලාවත පාර, කොච්චිකඩේ - 031 2277726 ■ චන්දන පූජා භාණ්ඩ - 100, බදුල්ල පාර, හාලිඇල - 055 2294999 ■ ඇම්. ටී. බණ්ඩාර පොත්හල, කොළඹ පාර, පොල්ගහවෙල, 077-3807489 / 076-8036126 ■ ළහිරු පූජා භාණ්ඩ, කොළඹ පාර, මදුරන්කුලිය, 076-7768053 / 071-8375871 ■ චමින්ද කොමිනිකේෂන්, සුපිරි වෙළඳ සංකීර්ණය, ප්‍රධාන වීදිය, මැදගම, 071-6253031 / 071-8375871 ■ සඳමිණි පූජා භාණ්ඩ, කුලියාපිටිය පාර, දුම්මලසූරිය - 077 4430223

**තැපෑලෙන් ගෙන්වා ගැනීම සඳහා විමසන්න - ඩී. සී. ආර්. ඇක්සස් මුද්‍රණාලය - අංක 33, තලවතුගොඩ පාර, පිටකෝට්ටේ - 0777794676**

***ඉහත ආයතන හිමි පින්වතුන් මෙම සද් කාර්ය ඉටු කරනු ලබන්නේ කිසිදු වෙළඳ ලාභයකින් තොරව සාසනික කටයුත්තක් වශයෙන් පමණි.***



# යළි මතුවන දහම් අසිරිය....

බුදු හිමි දිවමන්ව ලොව වැඩ හිඳින ලෙසේ
සැදු පිළිරුවකි සඟ ගණ හැම අතම වෙසේ
බොදු මහ දම් කඳද යළි සවනතට ඇසේ
සිදු වන යහපතද එන්නේ රැගෙන මෙසේ

ගස් වැල් මලින් බරවී සුළඟද පාවේ
රැස් වූ සඟ ගණද දෙති දහමක රාවේ
උස් වූ තැනින් බුදු හිමි වැඩි ලෙස සීවේ
හිස් වූ සසුන දෝ යළි මේ නැග ආවේ

දැලි කුණු වැකුණු දම් මග පිරිසිදු වන්නේ
එළි කරනට පැතුම් පිට සඟ වැඩ මන්නේ
කෙළි සෙල්ලම් නෙවෙයි සිහි ගෙන අහ ගන්නේ
යළි මතුවන දහම් අසිරිය කිය වෙන්නේ

සිතුවමකින් ගලින් නෙළුවද දහම ගැන
නෙතු ගැටුමකින් පැහැදෙයි නම් සතගෙ මන
අතු රිකිලි දා මෝරන විට නැගෙන ගුණ
මතුවට නිවන් ඇත නැත කිසි අපතෙ යන


මතකය යළිත් ඔපවත් වී නැගෙන තුට
සත වෙත ගෙනෙයි සිතිවිලි මතු නිවනකට
සිත පහදනා දම් කඳ යළි නැගෙන විට
නැත සුළු මෙවැනි නිමවුම් සුව පිණිස හෙට

හුරුවක් වෙතොත් සසරෙහි කළ යළිදු ඇදේ
දැරුවොත් මෙ භවෙහිද හොඳනම් අසුභ නොදේ
දිරුවත් මෙ කය මතු උපතක් සමග යෙදේ
දුරුවෙත් කෙළෙස් මළ මග නිවනටම සැදේ

සිතකට දෙන දහම් හැඟුමකි නිවන කරා
සුළුවට පෙනෙනමුත් හරයකි දසුන පුරා
නිකමට බලා පැහැදුනහොත් දහම දරා
හනිකට එතෙර විය හැක භව කතර හැරා

පෙර කල දහම් සිරි ගෙන එන මෙවැනි තැනුම්
හර බර වෙමැයි ගෙන දෙයි නිවනටම දැනුම්
පර පුර අදත් කෙරුවොත් නිසි ලෙසට වැනුම්
දුර නැත නිවන් පුර මතුවට ලැබෙති දිනුම්

පබැඳුම - නීතිඥ චන්දන සිරිවර්ධන



# මතුවී එන කලකී
# බුදු මග පෙර ලෙසට...

කලකදී මතුව කලකදී දම් යට යෑම
රළ මෙනි සයුරු උපමාවකි සැසඳීම
සැළවුන විගස දම් මග අනුගත වීම
එල ගෙන දෙවයි නිවනට නොවරදවාම

දම් මග ලොවට යළි මතුවී ගෙන එනවා
සම් බුදු සමිඳු වැඩියා ලෙස සිහි වෙනවා
නම් ගොත් ජාති කුල මල අහකට යනවා
නිම් නැති සසර බිය හැර නිවනම දෙනවා

සැඟ වුණ දහම මතු වෙයි කලකට පස්සේ
හිඟ වුණ කළණ මිතුරන් කල එළි බැස්සේ
මග තොට සොයයි ලෝ සත දම් හඬ ඔස්සේ
දිග නැත නිවන තෙමුනොත් මහ අම වැස්සේ

මතු වී එන කලකි බුදු මග පෙර ලෙසට
තතු ඒ ගැන කියයි දම් හඬ හැම දෙසට
නෙතු පා අසා ගෙන සිත දී මුනි බසට
සතු වී නිවන් දුක් දුරු වේවා යසට

මඳ දොස දනන් ඉපදී අප අතර සිට
ඇද කුද ඇතත් පව් මිතුරන් ඇසුරු කොට
ලද මොහොතකින් වෙන් වෙයි දම් ඇසෙන විට
නොදකින පැතිකඩකි මේ සුව ගෙනෙන හෙට

හව බැම් උදුරනා බොදුනුවො පෙර උන්නා
නිවනට අවැසි දම් මග මතු කර දුන්නා
තව දුර සසර ගොස් සහයට උපදින්නා
දිවමන් කළණ මිතුරන් එ අතර ඉන්නා

පින් බර දනන් පෙර හව යහ හුරුව ඇති
දැන් යළි ඉපිද මනු ලොව යම් තැනක වෙති
දුන් දෙය අනුව එම ගති ගුණ නැවත එති
සුන් කෙරුමට කෙළෙස් බුදු සව් වෙතට යති

කළණ වැටකි බුදු සමිඳුන් තැනුව පෙර
නිවන දෙවයි ඉන් එතැනම නොමැත දුර
කැඩුන දිනක ඒ වැට යළි නොඑන තුර
කුමන පිහිට දෝ සත හට ලොවට බර

පබැඳුම - නීතිඥ චන්දන සිරිවර්ධන

1001 RS.25.00
HELA BODHU PIYUMA 01

නීතිඥ චන්දන සිරිවර්ධන විසින් සංස්කරණය කර නුගේගොඩ ගංගොඩවිල වනාත පාරේ අංක 96/A දරණ ස්ථානයේ පිහිටි ඉමාෂි මුද්‍රණාලයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.